මධ්‍යම සංස්කෘතික අරමුදල

மத்திய கலாசார நிதியம்

CENTRAL CULTURAL FUND



වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT

2016

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය රැකගැනීමට අත දෙන්න
இலங்கையின் மேன்மையைப் பாதுகாப்பதற்கு உதவுங்கள்
Help save the Glory that is Sri Lanka

මධ්‍යම සංස්කෘතික අරමුදල
மத்திய கலாசார நிதியம்
CENTRAL CULTURAL FUND



ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය රැකගැනීමට අත දෙන්න
இலங்கையின் மேன்மையைப் பாதுகாப்பதற்கு உதவுங்கள்
Give A Hand To Protect Sri Lanka Glory

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT

2016

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

පටුන

		පිටුව
01	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01-06
02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	07-41
03	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	42-81
04	කාර්ය සාධන දර්ශකය	82
05	තිරසර සංවර්ධනය (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	83-84
06	මානව සම්පත් පැතිකඩ	85
07	අනුකූලතා වාර්තාව	86-92

பொருளடக்கம்

		பக்கம்
01.	நிறுவன விபரம்/நிறைவேற்றுச் சுருக்கம	93-97
02.	முன்னேற்றம் மற்றும் முன்னோக்கு	98-134
03.	வருடத்தின் மொத்த நிதிச் செயலாற்றுகை	135-179
04.	செயற்றிறன் குறிகாட்டிகள	180
05.	நிலைபேறான அபிவிருத்தி இலக்குகளைப் (SDG) பூர்த்தி செய்வதற்கான செயற்றிறன	181-182
06.	மனித வள விவரம	183-184
07.	இணக்கப்பாட்டு அறிக்கை	185-191

Contents

		Page
01.	Corporate Profile/ Execution Summary	192-196
02.	Progress and the Future Outlook	197-235
03.	Total Financial Performance in the year	236-273
04.	Performance Indicators	274
05.	Performance in Achieving the Sustainable Development Goals (SDG)	275-276
06.	Human Resource Profile	277-278
07.	Compliance Report	279-286

01. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික ස්මාරක ප්‍රවර්ධනය කිරීම සඳහා ද ශ්‍රී ලංකාවෙහි හා විදේශයන්හි සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී, ප්‍රතිසංස්කරණය කිරීමේ දී, ආරක්ෂා කිරීමේ දී සහ ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේ දී දරන ලද වියදම් පියවීම පිණිස ද කලාකරුවන්ට, ශිල්පීන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයින්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැපයීම පිණිස ද සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කළ තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ද අරමුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මඟින් මධ්‍යම සංස්කෘතික අරමුදල ස්ථාපිත කර ඇත.

එවකට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතේ තිබූ මධ්‍යම සංස්කෘතික අරමුදල 2015.09.21 දිනැති අංක 1933/13 දරන ගැසට් පත්‍රයට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පැවරුණි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී වශයෙන් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කරනු ලබන අතර, 2016 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මෙහි පරිපාලන කටයුතු සිදුවිය.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පරිපාලන ව්‍යුහය අනුව සංවර්ධන, පාලන හා මුදල් යන ප්‍රධාන අංශ 03 කින් සමන්විත වන අතර, එම අංශවල ප්‍රධානීන් ලෙස අධ්‍යක්ෂවරු තිදෙනෙකු කටයුතු කරනු ලබයි. මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරන අතර, අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල් විසින් පාලනය කරනු ලැබේ. මෙයට අමතරව නීති අංශයක් ද ක්‍රියාත්මක වන අතර, එය පාලන අංශය යටතේ ක්‍රියාත්මක වේ.

ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක නොවන මධ්‍යම සංස්කෘතික අරමුදල, ඓතිහාසික උරුම ස්ථානවල දේශීය විදේශීය සංචාරක ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම තුළින් ආදායම් උපයන අතර, ඒ මඟින් සේවක පඩිනඩි ගෙවීම හා අනෙකුත් වියදම් පියවීම සිදුකරනු ලබයි. ඒ අනුව 2016 වර්ෂයේ ආදායම් වශයෙන් (ප්‍රවේශපත්‍ර හා අනෙකුත් ආදායම්) රුපියල් 3,758,060,292.00 ක මුදලක් අරමුදල වෙත ලැබී ඇති අතර, වියදම් ලෙස රුපියල් 2,215,396,896.70 ක මුදලක් වැය කර ඇත.

2016 වර්ෂයේ දී මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ව්‍යාපෘති 21 ක්‍රියාත්මක වූ අතර, 2016 වර්ෂය තුළ දී රත්නපුර, යාපනය, ත්‍රිකුණාමලය හා බදුල්ල යන ව්‍යාපෘති නව ව්‍යාපෘති ලෙස ආරම්භ කරන ලදි.

ඒ අනුව 2016 වර්ෂය සඳහා, කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ කාර්යයන් 99 ක් ද, සංරක්ෂණ වැඩබිම් 211 ක් ද වශයෙන් වැඩබිම් 310 ක් යෝජනා වී තිබුණි. මේ අතරින් වැඩබිම් 272 ක වැඩ ආරම්භ කිරීමට හැකි වූ අතර, වර්ෂ අවසානයේ දී කැණීම් වැඩබිම් 11 ක් හා සංරක්ෂණ වැඩබිම් 22 ක් වශයෙන් වැඩබිම් 33 ක වැඩ අවසන් කිරීමට හැකි විය.

මෙම වර්ෂය තුළ දී අපේක්ෂා කළ වැඩ ඒකක 165,168.60 ප්‍රමාණයෙන් වැඩ ඒකක 140,816.48 ක් අවසන් කර ඇති අතර, ඒ අනුව භෞතික ප්‍රගතිය 67.8% කි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා වියදම් වශයෙන් රු. 537,440,191.77 ක් වැය කළ අතර, මුළු වියදම්වල මූල්‍ය ප්‍රගතිය 48.6% කි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

  ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් ගෝලීය ආශ්චර්යය බවට පත් කිරීම

- **මෙහෙවර**

  ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය, සංවර්ධනය, ප්‍රවර්ධනය හා තිරසාර සංස්කෘතික ආර්ථික සාධනය මගින් පෙරදිග සංස්කෘතික උරුම කළමනාකරණය පිළිබඳ විශිෂ්ටත ම ආයතනය වීම


- **අරමුණු**

1. පුරාවිද්‍යාත්මක ගවේෂණ, පර්යේෂණ, කැණීම් හා සංරක්ෂණය සිදු කිරීම
2. ස්පර්ශීය හා අස්පර්ශීය සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම
3. ආයතනික මානව සම්පත දැනුම, ආකල්ප සහ කුසලතා වලින් පරිපූර්ණ තෘප්තිමත් පිරිසක් බවට පත් කිරීම
4. ආයතනය සතු තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය, බෙදා හැරීම සහ ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය සහ පවත්වාගෙන යාම
5. සංස්කෘතික අගයයන් රකිමින් පෙර අපර දෙදිග සංචාරක ආකර්ෂණය තුළින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් ප්‍රචලිත කිරීම
6. ආයතනයේ ආදායම් ඉලක්කයන් ඉදිරි වසර හතර තුළදී 30% කින් වර්ධනය කරගැනීම සහ ඒ තුළින් ආයතනික සේවාවන් වඩාත් කාර්යක්ෂම ව සහ උසස් පාරිභෝගික තෘප්තියකින් පවත්වාගෙන යාම
7. හඳුනාගත් සංස්කෘතික අගයන් සහ හර පද්ධතීන් සමාජගත කිරීම
8. බහු ආගමික සහ බහුජන සංහිඳියාවට සහ ජාතික සමගියට උරදීම
9. ජාතික ප්‍රතිපත්තීන්ට අනුව අන්තර්ජාතික සංවිධාන සහ ආයතනික සහයෝගිතාව ගොඩනැගීම
10. නූතන සමාජයට ගැළපෙන අයුරින් ආයතනයේ සේවාවන් නවීකරණය හා විවිධාංගීකරණය

1.3 කාර්යයන් හා පරමාර්ථ

- සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් යම් ප්‍රදේශයක ඇති මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී වන වියදම් දැරීම
- ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ හා සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් දැරීම
- ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම
- ආගම නංවාලීම, ආගමික ස්ථාන හෝ ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම
- සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්ගෙන් ජාතියට සේවය කර ඇති අය සඳහා ප්‍රදානයන් පිරිනැමීම
- කලාකරුවන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට, මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට ආධාර සැලසීම
- මණ්ඩලයේ මතය අනුව මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්යයන්ට ආධාර ලබා දීම

1.4 සංවිධාන සටහන


Board Of Governors
Director General
HM 1-2
HM 1-1
MM 1-1
JM 1-1
MA 3
MA 2-2
MA 1-2
PL 3
PL 2
PL 1
Director (Finance)
Director (Admin)
Director (Development)
Assi. Director (Finance)
Assi. Director (Legal)
Assi. Director (Admin)
Archetecture
Assistant Director (pro.. & Pub.)
Assistant Director (Lab..& Mus..)
Assistant Director (Conservation)
Assistant Director (Archetecture)
Internal Auditer
Supply
Accounts Officer
Administration Officer
Senior Chemi. Conser. (Artifact/ pain.)
Publicity Officer
Musium keeper
Project Manager/ OIC
Senior Conse. Officer
Senior Arche. Officer
Manager (Bataleeya)
Sciennecetific Officer
Internal Audit Officer
Development Assistant
Chemical Con. (Art/ Pai.)
Production/ Archiving Officer
Meritime Arch.. Officer
Con.. Officer
Arch.. Officer
Book Keeper
Transport Assistant
Archivist/ Labararion
Contity Servey
Lab Assistant
Technical Assistant
Instructor (Art./ Scu/Leth/Cer.)
Senior Formen Production
Ticket Seller/ Shrof
Management
Management Assistant (Security)
Video Cameraman/ Photograpе
Sound Recorder
Qurator
Driver
Bulldozer Operator
Crane Operator
Carpenter
Mason
Plumber
Assi.
Grezer
Lab Atte.
Circui Bunglow Keeper
Lorry
Office
Group Leader
Security
Labour

1.5 මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පවතින ප්‍රධාන අංශ/ ව්‍යාපෘති

- **අරමුදල යටතේ පවතින ප්‍රධාන අංශ**
  - සංවර්ධන අංශය
  - පාලන අංශය
    i. නීති අංශය
    ii. ප්‍රවාහන අංශය
  - මුදල් අංශය
    i. සැපයුම් අංශය
    ii. ගබඩා අංශය
  - අභ්‍යන්තර විගණන අංශය (අධ්‍යක්ෂ ජනරාල් විසින් පාලනය කරනු ලැබේ.)

- **අරමුදල යටතේ පවතින ප්‍රධාන ව්‍යාපෘති**
  - අභයගිරිය ව්‍යාපෘතිය
  - ජේතවනය ව්‍යාපෘතිය
  - මහාවිහාරය ව්‍යාපෘතිය
  - සීගිරිය ව්‍යාපෘතිය
  - පොළොන්නරුව ආලාහන පරිවෙන ව්‍යාපෘතිය
  - මහනුවර ව්‍යාපෘතිය
  - දඹුල්ල ව්‍යාපෘතිය
  - යාපහුව ව්‍යාපෘතිය
  - දඹදෙණිය ව්‍යාපෘතිය
  - පඬුවස්නුවර ව්‍යාපෘතිය
  - කුරුණෑගල ව්‍යාපෘතිය

  වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘති

  - තිස්සමහාරාම ව්‍යාපෘතිය
  - මාතර ව්‍යාපෘතිය
  - රම්බා විහාරය ව්‍යාපෘතිය
  - ගාල්ල ව්‍යාපෘතිය

  රුහුණු සංස්කෘතික කලාපය

  - ගම්පහ ව්‍යාපෘතිය
  - කෑගල්ල ව්‍යාපෘතිය
  - කොළඹ ව්‍යාපෘතිය
  - රත්නපුර ව්‍යාපෘතිය
  - මොණරාගල ව්‍යාපෘතිය
  - යාපනය ව්‍යාපෘතිය
  - අතපත්තු කාර්යාලය (ප්‍රකාශන අංශය)
  - ජාතික අනුරූ පාසල
  - ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය
  - බදුල්ල ව්‍යාපෘතිය


1.6 මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පවතින අරමුදල්

2016 වර්ෂය සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2016.12.31)

අනු අංකය	විස්තරය	බලාපොරොත්තු වූ ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)
01	ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම	3,000,000,000.00	3,445,925,208.00
02	අනුරූ අලෙවි ආදායම	30,000,000.00	2,608,009.00
03	ප්‍රකාශන අලෙවි ආදායම	15,000,000.00	8,846,068.00
04	මුද්‍රණ අලෙවි ආදායම	15,000,000.00	13,155,989.00
05	ආයෝජන ආදායම	115,000,000.00	233,863,909.00
06	වෙනත් ආදායම	25,000,000.00	53,661,110.00

අනු අංකය	විස්තරය	ප්‍රගතිය (%)
01	පුනරාවර්තන වියදම්	72.65
02	ප්‍රාග්ධන වියදම්	23.17
03	ආදායම්	117.44

ආදායම් (%)



02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 මූල්‍ය ප්‍රගතිය

2015 - 2016 වර්ෂ සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය

අනු අංකය	විස්තරය	2015 වර්ෂය		2016 වර්ෂය	
		බලාපොරොත්තු වූ ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)	බලාපොරොත්තු වූ ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)
01	කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම්	1,237,000,000.00	1,451,793,061.99	1,500,000,000.00	1,426,124,047.56
02	ගමන් වියදම්	27,000,000.00	15,001,925.72	50,000,000.00	19,973,852.19
03	සැපයුම් වියදම්	235,000,000.00	158,770,101.00	300,000,000.00	166,301,492.69
04	නඩත්තු වියදම්	343,000,000.00	75,951,004.09	100,000,000.00	62,628,968.10
05	ගිවිසුම් ගත සේවා වියදම්	133,500,000.00	62,516,440.99	148,000,000.00	75,191,242.94
06	වෙනත් වියදම්	354,500,000.00	173,037,431.00	572,000,000.00	189,568,606.34
07	ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ වියදම්	490,000,000.00	47,161,767.00	480,000,000.00	111,231,002.00

2016 වර්ෂය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදලේ කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ කටයුතුවලට අමතරව අනෙකුත් දෛනික කාර්යාල කටයුතු සුසුරුදු පරිදි පවත්වාගෙන යන ලදි. එම කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තු අනුව සිදුකරන ලදි.

අරමුදලේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප්, දීමනා හා අනෙකුත් සුභ සාධන කටයුතු වෙනුවෙන් රු. 1,500,000,000.00 ක මුදලක් වෙන් කරන ලද අතර, ඉන් රු. 1,426,124,047.56 ක ප්‍රමාණයක් වියදම් වී ඇත. එම වියදම ප්‍රතිශතයක් ලෙස ගත්විට 2015 වර්ෂයේ 117.36% ක් වූ අතර 2016 වර්ෂයේ 95.07% ක් වන අතර, 2015 වර්ෂයට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම ගමන් වියදම් 2016 වර්ෂයේ දී රු. 19,973,852.19 ක් ද 2015 වර්ෂයේ දී රු. 15,001,925.72 ක් වැය වී ඇත.


ආයතනයේ සැපයුම් කටයුතු වෙනුවෙන් රු. 300,000,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර, ඉන් රු. 166,301,492.69 ක මුදලක් වියදම් වී ඇත. 2015 වර්ෂයේ දී එය රු. 158,770,101.00 කි. එමෙන්ම නඩත්තු කටයුතු සඳහා රු. 62,628,968.10 ක මුදලක් වැය වී ඇත. 2015 නඩත්තු වියදම ප්‍රතිශතයක් ලෙස 22.14% ක් වන අතර, 2016 දී එය 62.62% ක් වී ඇත.

ගිවිසුම් ගත කටයුතු වෙනුවෙන් 2016 දී රු. 75,191,242.94 (50.80%) ක් වියදම් වී ඇති අතර, 2015 දී එය රු. 62,516,440.99 (22.14%) කි.

එමෙන්ම වෙනත් වියදම් යටතේ 2016 වර්ෂයේ දී කලාකරුවන්, ලේඛකයන් හා කතුවරුන් සඳහා රු. 4,125,000.00 ක් ද පුරාවිද්‍යා උරුම දායකත්වය වෙනුවෙන් රු. 104,490,691.16 ක් ද පරිත්‍යාග ලෙස රු. 1,550,122.59 ක මුදලක් ද ලබා දී ඇත.

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් ලෙස 2016 වර්ෂයේ දී රු. 111,231,002.00 (23.17%) ක මුදලක් වැය කර ඇති අතර, 2015 වර්ෂයේ දී එය රු. 47,161,767.00 (9.62%) කි.


රත්නපුර, යාපනය, ත්‍රිකුණාමලය හා බදුල්ල යන ව්‍යාපෘති 2016 වර්ෂයේ දී අලුතින් ආරම්භ කරන ලද බැවින් 2015 වර්ෂයට සාපේක්ෂව ඇතැම් වියදම් වැඩි වීමට හේතු වී ඇත.



අනු අංකය	විස්තරය	ප්‍රගතිය (%) (රු.මී.)	
		2015	2016
01	පුනරාවර්තන වියදම්	83.16	72.65
02	ප්‍රාග්ධන වියදම්	9.62	23.17
03	ආදායම්	99.26	117.44

පුනරාවර්තන වියදම් 2015 වර්ෂයේ දී පුනරාවර්තන වියදම් ලෙස 83.16% ක් ද 2016 දී එය 72.65% ක් ද වේ. ප්‍රාග්ධන වියදම් 2015 දී 9.62% ක් වන අතර, 2016 දී එය 23.17% ක් ලෙස වැඩි වී ඇත. ඊට හේතු වී ඇත්තේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් නව ව්‍යාපෘති 04 ක් ආරම්භ කිරීමයි.

2015 දී ආදායම්වල ප්‍රගතිය 99.26% ක් වන අතර, 2016 දී එය 117.44% ක් වන අතර, සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනය හා අනෙකුත් ආදායම් උත්පාදන මාර්ග වලින් ලද ආදායම් පෙර වසරට සාපේක්ෂව වැඩිවීම ඊට හේතු වී ඇත.




අනු අංකය	විස්තරය	2015 වර්ෂය		2016 වර්ෂය	
		බලාපොරොත්තු වූ ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)	බලාපොරොත්තු වූ ආදායම (රු.)	සත්‍ය ආදායම (රු.)
01	ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම	2,750,000,000.00	2,751,061,677.00	3,000,000,000.00	3,445,925,208.00
02	අනුරූ අලෙවි ආදායම	40,000,000.00	2,923,806.00	30,000,000.00	2,608,009.00
03	ප්‍රකාශන අලෙවි ආදායම	15,000,000.00	1,931,050.00	15,000,000.00	8,846,068.00
04	මුද්‍රණ අලෙවි ආදායම	15,000,000.00	11,299,313.00	15,000,000.00	13,155,989.00
05	ආයෝජන ආදායම	55,000,000.00	95,006,954.00	115,000,000.00	233,863,909.00
06	වෙනත් ආදායම	25,000,000.00	16,459,409.00	25,000,000.00	53,661,110.00

2016 වර්ෂයේ දී දෙස් විදෙස් සංචාරකයින්ට සංචාරක ප්‍රවේශපත්‍ර අලෙවිකිරීම තුළින් රු. 3,115,925,208.00 ක මුදලක් ලැබී ඇති අතර, 2015 වර්ෂයේ දී රු. 2.751,061,677.00 ක් විය. සංචාරක ප්‍රවර්ධන කටයුතු වර්ධනය කිරීම හා සංචාරක පැමිණීම වර්ධනය හේතුවෙන් ප්‍රවේශපත් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව වර්ධනය වීමට ප්‍රබල ලෙසම බලපා ඇත. ප්‍රතිශතයක් ලෙස එය 2015 දී 100.03% ක් වන අතර, 2016 දී 114.86% කි.

2016 දී අනුරූ, ප්‍රකාශන හා මුද්‍රණ අලෙවි ආදායම ලෙස රු. 24,610,066.00 (41.01%) ක් ද 2015 දී රු. 16,154,169.00 (23.07%) ක් ද උපයාගෙන ඇත. එමෙන්ම 2015 සාපේක්ෂව 2016 දී ප්‍රකාශන හා මුද්‍රණ අලෙවි ආදායම වර්ධනය වී ඇත. 2015 වර්ෂයේ දී රු. 13,230,363.00 (44.10%) ක් වූ එම අදායම 2016 දී රු. 22,002,057.00 (73.34%) ක් වේ.

එමෙන්ම ආයෝජන ආදායම 2015 වර්ෂයට වඩා රු. 138,856,955.00 කින් වැඩි වී ඇති අතර, වෙනත් ආදායම් ද 2015 වර්ෂයට සාපේක්ෂව රු. 37,201,701.00 කින් වර්ධනය වී තිබේ.



2.2 භෞතික ප්‍රගතිය

ඒ අනුව, 2016 වර්ෂය තුළ දී පුරාවිද්‍යා පර්යේෂණ, කැණීම්, සංරක්ෂණ හා සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමේ කාර්යයන් ප්‍රධාන ව්‍යාපෘති 21 ක් තුළ සිදු කරන ලදී. ඉකුත් වූ වර්ෂය සඳහා යථෝක්ත සියලු ව්‍යාපෘති ආවරණය වන පරිදි කාර්යයන් 310 ක් යෝජනා වූවත් විවිධ ප්‍රායෝගික හේතුවෙන් කාර්යයන් 272 ක් ආරම්භ කිරීමට හැකි වූ අතර, ඉන් කාර්යයන් 33 ක වැඩ අවසන් කිරීමට හැකි විය.

දෙසැම්බර් මාසය අවසාන වන විට වර්ෂයට යෝජිත වැඩ ඒකක 165,168.60 කින් ඒකක 140,816.48 එනම්, 67.8% භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. වියදම් ලෙස රු. 537,440,191.77 (48.6%) ක් වැය කර ඇත. 2016 ජනවාරි සිට දෙසැම්බර් මාසය අවසානය දක්වා මිනිස් දින 275,281 ක් භාවිතා කර ඇති අතර, කාර්යක්ෂමතාවය 85% ක් පවත්වා ගැනීමට හැකි විය.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඉහත සඳහන් සියලු ම කාර්යයන් කාර්යක්ෂමව හා සාර්ථකව ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය වන ප්‍රවාහන පහසුකම් පාලන අංශය යටතේ පවතින ප්‍රවාහන අංශය මඟින් සිදු කෙරිණි.

➢ අභයගිරිය ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

අභයගිරි ස්තූපයේ උතුරුපස පොකුණ කැණීම, විජයාරාම ශුද්ධ චතුරස්‍ර ප්‍රාකාර බැම්ම හා බෝධිඝරය කැණීම, විජයාරාම පර්යේෂණ කැණීම, කපාරාමුළ පර්යේෂණ කැණීම යන කැණීම් කාර්යයන් සිදු කර ඇත. එමෙන්ම මැටිබඳුන් විශ්ලේෂණය මෙන්ම විවිධ පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කර තිබුණි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
32,036,351.35	20,000,528.75	66%	58%



විජයාරාම ශුද්ධ චතුරස්‍ර ප්‍රාකාර කැණීම් කිරීමට පෙර



විජයාරාම ශුද්ධ චතුරස්‍ර ප්‍රාකාර කැණීම් කිරීමට පසු

සංරක්ෂණ හා නඩත්තු

තවද විජයාරාම ස්තූපය සංරක්ෂණය, අංක 36 පිළිමගෙය සංරක්ෂණය, අංක 03 කුට්ටම් පොකුණ ගොඩනැඟිල්ල සංරක්ෂණය, සංචාරක පෙත්මඟ ඉදිකිරීම, උත්තරමූල භූ දර්ශන සැකසීම, ගබඩා කාර්යාලය අලුත්වැඩියා කිරීම, ශ්‍රව්‍ය දෘශ්‍යාගාරය අලුත්වැඩියා කිරීම, අභයගිරි ප්‍රධාන කාර්යාලය අලුත්වැඩියා කිරීම, විද්‍යාත්මක නඩත්තු කටයුතු හා සාමාන්‍ය නඩත්තු කටයුතු සිදුකර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
114,958,789.40	80,794,900.20	76%	80%



අංක 36 පිළිමගෙය සංරක්ෂණය කිරීමට පෙර



අංක 36 පිළිමගෙය සංකරක්ෂණය කිරීමට පසු

කෞතුකාගාර

කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන පවත්වා ඇත.

අභයගිරි ව්‍යාපෘති රසායනාගාරය මඟින් පුරාවස්තු සංරක්ෂණය, රුවන්වැලි සෑ විහාර මන්දිරයේ බුදුපිළිමය සංරක්ෂණය, අභයගිරි ආරාම සංකීර්ණයේ ඇති මුරගල නැවත සංකරක්ෂණය හා ආරාම සංකීර්ණයේ අංක 21 ආවාස සංකීර්ණයේ ඇති සඳකඩපහන හා සිංහරුව සංරක්ෂණය කිරීම හා කෞතුකාගාරයේ ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීම යන කාර්යයන් සිදු කර ඇත.

- **ජේතවන ව්‍යාපෘතිය**

කැණීම් හා පර්යේෂණ

ජේතවන ආරාම සංකීර්ණය තුළ පිහිටා ඇති ආරාමික ගොඩනැඟිල්ලක් වන වන මෙම ගොඩනැඟිල්ල කැණීමට ලක් කර පාදාගෙන විද්‍යාත්මක ලක්ෂණ හඳුනාගෙන සංරක්ෂණයට අවශ්‍ය කටයුතු සලස්වා ඇත. මෙහිදී මෙම ගොඩනැඟිල්ල මතුපිට ගල්කණු කිහිපයක් හා දොරටුව ලෙස අනුමාන කරන ලද ස්ථානයේ තවත් ගල්පුවරු කිහිපයක් දක්නට ලැබී ඇත. මෙම කැණීම තුළින් දොරටුව අසල වූ පඩිපෙලෙහි පඩි 03 ක් හා කැටයම් රහිත සඳකඩපහණක් මෙන්ම කාසි, මැටි පෙති, පබලු, යකඩ ඇණ, මැටි බඳුන් හා පාෂාණ අවශේෂ යනාදිය හමු වී ඇත. JMMC 2016 කැණීම නමින් මෙය හඳුන්වනු ලැබේ.

එමෙන්ම අනුරාධපුර යුගයේ ඉපැරණි රජදරුවන්ගේ රාජ්‍ය අනුග්‍රහයට බඳුන් වූ භූමියක් බව ශේෂිත නටබුන් මඟින් පැහැදිළි වන උච්චාවලික රජමහා විහාර භූමියෙහි මූලික ගවේශණයක් සිදුකර පාංශු ස්ථරායනය හඳුනා ගනිමින් සෝදාපාලුවට ලක්ව ඇති ස්තූප වැලි මළුව හා ප්‍රාකාර බැම්ම කැණීම් කිරීම හා පියගැටපෙළ පාදා ගැනීම කර ඇත.

අතීතයේ දී සමන විහාරය නමින් හැඳින්වූ අක්කර 20 ක් පුරාවට ව්‍යාප්ත ව ඇති වෙස්සගිරි පුරාවිද්‍යා භූමිය, ක්ෂේත්‍ර සිතියමට අනුව A, B, C යනුවෙන් පර්වත 03 ක් හඳුනාගෙන ඒ අනුව කැණීම් කටයුතු ආරම්භ කර ඇත. එහිදී B පර්වතයට නැගෙනහිරින් වූ ස්ථානයක් කේන්ද්‍රකර ගනිමින් කොටු දැලක් නිර්මාණය කර, ඒ තුළ කැණීම් කටයුතු සිදුකර ඇත. මෙම ගුහා කැණීම් භූමිය V.G. Cava No 02 2015 ලෙස නම්කර ඇති අතර, ප්‍රාග් ඓතිහාසික යුගයේ ගුහාවේ උපයෝගිතාවය, අවධීන් හා තාක්ෂණය හඳුනා ගැනීම මෙහි අරමුණ වේ. මෙම කැණීම මඟින් මැටි බඳුන්, පාෂාණ, ලෝහ, අඟුරු අවශේෂ හමු වී ඇත.

මීට අමතරව ජේතවන ස්තූප බටහිර ආයක ආශ්‍රිතව 1998 වර්ෂය තුළ සිදුකරන ලද පර්යේෂණ කැණීමෙන් වාර්තා වූ පබළු පිළිබඳ අධ්‍යයනය කිරීම හා 1982 - 2015 දක්වා වර්ෂවල සිදු කරන ලද කැණීම්වලින් හමුවූ විශ්ලේෂණය කර ඇති සම්පූර්ණ හා සංරක්ෂණය කරන ලද මැටි බඳුන් විවිධ තේමා යටතේ විශ්ලේෂණය කිරීම සිදු කර ඇත.

විද්වත් ප්‍රවීන දේශක මඩුල්ලක් ගෙන්වා මාසික දේශන මාලාවක් පැවැත්වීම, ජේතවන පර්යේෂණ පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම, අවශ්‍යතාවය අනුව ජංගම ප්‍රදර්ශන පැවැත්වීම වැනි ප්‍රවර්ධන ක්‍රියාකාරම් ද සිදු කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
16,835,180.00	12,026,540.00	74%	86%



JMMC 2016 කැණීම කිරීමට පෙර



JMMC 2016 කැණීම කිරීමට පසු



වෙස්සගිරි ගුහා කැණීමෙන් හමු වූ පාෂාණ හා මැටි බඳුන් අවශේෂයන්

සංරක්ෂණ හා නඩත්තු

අවස්ථා කිහිපයක දී සංරක්ෂණයට භාජනය කර ඇති අතර, ඇති වූ තාක්ෂණික ගැටළු හේතුවෙන් නවතා දමා තිබූ බෝධිඝර පුරාවිද්‍යා විද්වත් සභාවක් කැඳවා ගන්නා ලද තීරණ අනුව සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම කර ඇත. මෙම සංරක්ෂණ කටයුතු සිදු කිරීමෙන් පසු අවධි නිරවුල්ව හඳුනාගැනීමට හැකිවන පරිදි පිරිසිදු කර ගොඩනැගිල්ල පිහිටි ස්ථානය ඉස්මතු කර ගැනීම, ගල් ගරාදි වැටේ අඩු කොටස් ගඩොලින් පුරවාලීම, වැඩි ජලය පිට කිරීම සඳහා සුදුසු වැහි සිවිලිමක් සකස් කිරීම, පියගැටපෙළ ගඩොලින් නිර්මාණය කිරීම යනාදි කටයුතු සිදුකර ඇත.

මල්වතු ඔය පටුමග ගොඩනැඟිල්ල සංරක්ෂණය කිරීම, 2009 වර්ෂයේ මැයි මාසයේ සංරක්ෂණ කටයුතු අවසන් කර ජනතා අයිතියට පත් කරන ලද ජේතවන ස්තූපයේ අකුණුසැර වැදීමෙන් හානියට පත්වූ හතරැස් කොටුව ආශ්‍රිත ප්‍රදේශය හා කොත්කැරැල්ල නැවත සංරක්ෂණය කිරීම, කෞතුකාගාරයේ ඇති ප්‍රදර්ශන භාණ්ඩ සංරක්ෂණය කිරීම යනාදි සංරක්ෂණ කටයුතු සිදුකර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
55,290,191.40	28,107,257.23	55%	61%



බෝධිඝර ගොඩනැඟිල්ල සංරක්ෂණය අතරතුර



බෝධිඝර ගොඩනැඟිල්ල සංරක්ෂණයෙන් පසු

කෞතුකාගාර

කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන/ සම්මන්ත්‍රණ පවත්වා ඇති අතර, නරඹන්නන් සඳහා චිත්‍ර ඇඳීමේ වැඩසටහනක් පවත්වාගෙන ගොස් ඇත.

- **මහාවිහාර ව්‍යාපෘතිය**

කැණීම් හා පර්යේෂණ

වැඩබිම් අංක 17 පොකුණ කැණීම් කිරීමේ කටයුතු අවසන් කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
2,914,510.00	888,000.00	30%	22%

සංරක්ෂණ හා නඩත්තු

ජය ශ්‍රී මහා බෝධි නැගෙනහිර පිට ප්‍රාකාරය සංරක්ෂණය, ථූපාරාම අංක 60 හා 61 ගොඩනැඟිලි සංරක්ෂණය, මහාවිහාර නැගෙනහිර සීමා ප්‍රාකාර සංරක්ෂණය, ථූපාරාම පිළිමගෙයි සංරක්ෂණය, රුවන්වැලි සෑය සහ ජය ශ්‍රී මහා බෝධිය අතර පෙත් මගෙහි බෝක්කුව ගලවා නැවත සකස් කිරීම, ඇතුල්නුවර සිට රුවන්වැලි සෑය දෙසට ඇති ප්‍රාකාර බැම්ම සංරක්ෂණය, රුවන්වැලි සෑ මළුව සැකසීම, රුවන්වැලි සෑය දාන ශාලාවේ විද්‍යාත්මක නඩත්තු කටයුතු හා දෛනික නඩත්තු කටයුතු සිදුකර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
54,119,725.20	31,361,208.27	66%	74%



ථූපාරාම අංක 60 ගොඩනැඟිල්ල සංරක්ෂණයට පෙර



ථූපාරාම අංක 60 ගොඩනැඟිල්ල සංරක්ෂණයට පසු



ථූපාරාම අංක 61 ගොඩනැඟිල්ල සංරක්ෂණයට පෙර



ථූපාරාම අංක 61 ගොඩනැඟිල්ල සංරක්ෂණයට පසු

- **සීගිරිය ව්‍යාපෘතිය**

කැණීම් හා පර්යේෂණ

2012 වර්ෂයේ සිට අඛණ්ඩව පවත්වාගෙන පැමිණි උතුරු දොරටුවේ ඇතුළු දිය අගල කැණීම් කර දිගින් 62m ක් හා පළල 36m හා 02m ගැඹුරකින් පස් ඉවත් කිරීම, දකුණුපස සීතල මාලිගාව වටා දිය අගලෙහි පස් ඉවත්කිරීම සඳහා කරනු ලබන කැණීම, මැටි බඳුන් හා වළං කැබිලි විශ්ලේෂණය හා උතුරු කොටසෙහි ජලමල් යථාවත් කිරීම යනකැණීම් හා පර්යේෂණ කටයුතු සිදු කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
29,588,730.00	20,710,731.00	77%	73%



උතුරු ඇතුළු දිය අගල කැණීම අතරතුර



දකුණුපස සීතල මාලිගාව වටා ඇති දිය අගල කැණීම අතරතුර

සංරක්ෂණ හා නඩත්තු

5 වන සියවසට අයත් යැයි සැලකෙන ජල උද්‍යානය තුළ හමුවන ශේෂව ඇති එකම හුණු බදාම කපරාරුව වන ජල උද්‍යාන හුණු කපරාරුව භායනවීම වළකා එහි ජීවකාලය උපරිමය දක්වා පවත්වා ගැනීමට අදාළ සංරක්ෂණ කටයුතු සිදු කිරීම, සිංහපාද මළුව බටහිර අන්තය අධික බෑවුම් සහිත ස්වභාවය නිසා සෝදා පාළුවට ලක්වීමෙන් වන හානිය වැළැක්වීම සඳහා එහි ආරක්ෂාවට බැමි සංරක්ෂණය කිරීම, කැටපත් පවුර සංරක්ෂණය කිරීම, ගල මුදුන සංරක්ෂණය කිරීම, සිංහ පාදය මළුව සංරක්ෂණය කිරීම, පඩිපෙළ සංරක්ෂණය කිරීම, ආසන ගුහාව ආශ්‍රිත සියලු බැමි සංරක්ෂණය කිරීම, උතුරු දිය අගල කැණීමට සමගාමීව පාදාගත් කොටස් සංරක්ෂණය කිරීමේ කටයුතු සිදුකරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
250,894,996.79	93,060,047.25	77%	73%



උතුරු ඇතුළු දිය අගල කැණීම
අතරතුර



දකුණුපස සීතල මාලිගාව වටා
ඇති දිය අගල කැණීම අතරතුර

කෞතුකාගාර

කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට, තොරතුරු ගවේශකයින්ට හා දෙස් විදෙස් සංචාරකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වීම, සංස්කෘතික සංදර්ශන පැවැත්වීම මෙන්ම ශාස්ත්‍රීය සඟරා (අප්සරා) නිකුත් කිරීම ද සිදු කර ඇත.

- **පොළොන්නරුව ව්‍යාපෘතිය**

කැණීම් හා පර්යේෂණ

දෙමළ මහා සෑය සංරක්ෂණයට අවශ්‍ය මුල් ඉදිකිරීමට අයත් සාධක සොයා ගැනීම මූලික අරමුණ කර ගනිමින් දෙමළ මහා සෑය කැණීම් කිරීම, අධික වර්ෂා කාලවලදී අධික ලෙස ජලය රැස්වීම හේතුවෙන් ගිලා බැසීමේ අවධානමකට ලක්වී ඇති ශිව දේවාල අංක 02 ගොඩනැගිල්ලේ නැගෙනහිර දොරටුව හරහා ජලය බැසයාමට සැලැස්වීම සඳහා දොරටුව අසල කැණීම් කිරීම, ශිව දේවාල ගොඩනැඟිල්ලේ නැගෙනහිර පිවිසුම් දොරටුව හරහා පිවිසීමට මාර්ගයක් සකස් කිරීම සඳහා නැගෙනහිර බටහිර පැරණි වීදිය කැණීම් කිරීම, ශිව දේවාල පරිශ්‍රය ක්‍රමවත් ලෙස සංචාරකයින්ට හඳුන්වා දීමේ අරමුණින් ශිව දේවාල අංක 02 ට අදාළ මූලික මාර්ග පද්ධතිය හා ඒ අවට ජල කළමනාකරණ පද්ධති පිළිබඳ සාධක සොයා ගැනීමේ අරමුණින් කැණීම් යනාදි කැණීම් කටයුතු සිදු කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
35,262,271.00	22,826,531.35	71%	79%

සංරක්ෂණ හා නඩත්තු

ඇතුළුනුවර නැගෙනහිර හා උතුරු ප්‍රාකාර බැම්මේ ඉතිරිවී ඇති කොටස් හා දකුණු ප්‍රාකාර බැම්ම සංරක්ෂණය කිරීම, දිරාගිය ගඩොළු ස්ථර ඉවත්කරමින් පැරණි බදාමයට සමාන බදාමයක් එක් කරමින් ලංකාතිලක පිළිමගෙයි බුද්ධ ප්‍රතිමා ඉදිරිපස ගඩොළු ඇතිරීමේ ඉතිරි සංරක්ෂණ කටයුතු හා ගර්භය හා අන්තරාලය වෙන්වන දොරටුව දෙපස වූ සංකීර්ණය බොරදම් 13 හඳුනා ගනිමින් ඒවා නිසි පරිදි සංරක්ෂණය කිරීමේ කටයුතු සිදු කිරීම,

පරාක්‍රමබාහු මාළිගාවේ, බද්ධසීමා ප්‍රාසාදයේ සහ රන්කොත් වෙහෙරේ ගර්භයේ පැරණි කපරාරු සංරක්ෂණය කිරීම, ශිව දේවාල අංක 02 අසල ගොඩනැගිල්ල හා උතුරු ප්‍රාකාර බැම්ම සහ ජලබස්නා කාණු පද්ධතිය සංරක්ෂණය කිරීමේ කටයුතු සිදු කර ඇත.

එමෙන්ම පොත්ගුල් විහාර සංකීර්ණයේ ස්මාරක නඩත්තු කටයුතු, ඇතුල්නුවර ස්මාරක නඩත්තු, දළදා මළුව හා පබළු වෙහෙර ස්මාරකය නඩත්තුව, මැණික් වෙහෙර ස්මාරකය නඩත්තුව, ලංකාතිලකය අවට ස්මාරක නඩත්තුව යනාදි විද්‍යාත්මක නඩත්තු කටයුතු ද සිදුකර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
183,491,522.45	51,355,373.21	33%	56%



පොත්ගුල් විහාර සංකීරණයේ ස්මාරක සංරක්ෂණයට පෙර



පොත්ගුල් විහාර සංකීරණයේ ස්මාරක සංරක්ෂණයට පසු

කෞතුකාගාර

කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට, තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වීම සිදු කර ඇත.

➢ මහනුවර ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

2014 වර්ෂයේ එළිමහන් ජනාවාසයක් වූ වික්ටෝරියා ජලාශය මධ්‍යයේ පිහිටි බඹරගල සිදුකළ කැණීමෙන් හමු වූ ශිලා මෙවලම් 460 ක පමණ එකතුවක් විශ්ලේෂණය කිරීම,උඩුනුවර ගල්ලැන්ගොල්ල පොත්ගුල් විහාරයේ හා යටිනුවර සූරියගොඩ නරේන්ද්‍රසිංහරාම විහාරයේ පුස්කොළ පොත් එකතූන් 02 ක් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත තොරතුරු වාර්තා කිරීම කරන ලදි.

කැණීම්, සංරක්ෂණ හා පර්යේෂණ වාර්තා සකස් කිරීම,අධ්‍යාපන හා ප්‍රචාරණ කටයුතු සංචාරක ප්‍රවර්ධන කටයුතු (බඹරගල), මැටිබඳුන් විශ්ලේෂණ කටයුතු සහ මැදවාසල කෞතුකාගාර ප්‍රවර්ධන කටයුතු සිදුකරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
7,422,345.00	4,225,286.45	60%	74%

සංරක්ෂණ හා නඩත්තු

මැණික්හින්න පොත්ගුල් විහාර පුස්තකාල ගොඩනැගිල්ල පුරවහලකින් ආරක්ෂා කිරීම මූලික සංරක්ෂණ ක්‍රියාවක් ලෙස ආරම්භ කර දිරාපත් වූ දැව වහල, සෝල්දර තට්ටුව, බොල් වූ බිත්ති සංරක්ෂණය කරමින් ගොඩනැගිල්ලේ ගෙබිම හා පිල කාලීන අවශ්‍යතාවය මත සංරක්ෂණය කර අවසන් කරන ලදි.

අස්ගිරිය මැද පන්සල ගොඩනැගිල්ලේ ජරා ජීරණයට පත් වූ වහල පෙර පරිදි සකස් කිරීම, සෝල්දරය හා දැවකණු ආදිය පෙර වූ කැටයමින් යුක්තව සංරක්ෂණය කිරීම හා වාස්තු විද්‍යා අංගයන්ට හානියක් නොවන පරිදි පෝට්කෝවක්, පැරණි ජනෙල් ආකෘති ආදිය එක් කිරීම කර ඇත.

තිත්ත පජ්ජල ගලේ විහාර පිළිමගෙය දිරාපත් වූ වහල සංරක්ෂණය කිරීම අවසන් කිරීම හා බිතුසිතුවම් ආරක්ෂාව උදෙසා අවශ්‍ය සංරක්ෂණ කටයුතු සිදු කිරීම, මහනුවර පූජා භූමිය තුළ පිහිටි 1843 වර්ෂයේ සිට පැවත එන ශාන්ත පාවුළු දේවස්ථානයේ වහලය සංරක්ෂණය කිරීම, අස්ගිරි ආදාහන මළුව ගෙඩිගේ විහාරයේ කරඬුව වඩම්මන ගෙය හා ඒ සඳහා වූ ප්‍රවේශ මාර්ගය සංරක්ෂණය කිරීම, අස්ගිරි මුල්ලේගම පන්සලේ ආවාසගෙයි වහලය, ජනෙල්, දොරවල් දැවයෙන් සකස් කර පන්සල් සංකීර්ණයට අයත් පොදු වාස්තුවිද්‍යා වටිනාකම් ඉස්මතු කර සංරක්ෂණය කිරීම, ගඩලාදෙණිය විහාර පරිශ්‍රය තුළ පිහිටි විහාර පොහොයගෙයි වහලය හා හතරලියැද්ද වැලිවිට සංඝරාජපුර කෞතුකාගාරයේ වහලය සංරක්ෂණය කිරීම හා වතුපොළ පුරාණ විහාර ආවාසගෙයි ගරාවැටී තිබූ බිත්ති නැවත ස්ථාපිත කර වහලය සංරක්ෂණය කිරීමේ කටයුතු ද සිදුකරන ලදි.

සූරියගොඩ රජමහා විහාරයේ මහනුවර යුගයේ ප්‍රතිමා, වාස්තුවිද්‍යාව, චිත්‍ර ශිල්පය නිරූපිත වරිච්චි බිත්ති ආධාර බදාම බොල්වී ගැලවීම හා පිපිරීම, වර්ණ ස්තර ගැලවීම සහ කෘමි උවදුරට ගොදුරුවීම යනාදියෙන් වූ හානි සංරක්ෂණය කිරීම කරන ලදි.

ගල්ගමුව රජමහා විහාරයේ හා කඩිගමුව නාගවනාරාම රජමහා විහාරයේ බිතුසිතුවම්වල බදාම බොල් වී ගැලවී තිබීම, වර්ණ ස්ථර ගැලවීම, කුඩු වශයෙන් ඉවත් වීම හා වේයන්ගේ ක්‍රියාකාරකම්වලින් සිදුව ඇති හානි සඳහා සංරක්ෂණය කිරීම කරන ලදි.

දෙගල්දොරුව රජමහා විහාරය තුළ ඇති බිතු සිතුවම්වලට පැවති අධික වැසි හේතුවෙන් ජල කාන්දුවීම නිසා හානිවීම වැළැක්වීම සඳහා කාණු පද්ධති පිරිසිදු කිරීම, බදාම සවි ගැන්වීම කර වවුලන් අභ්‍යන්තර කුහරවලට පැමිණීම වළක්වමින් ලෙන තුළ නිසි වායු සංරක්ෂණ ක්‍රම ඇති කර සංරක්ෂණ කාර්යයන් අවසන් කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
74,635,812.00	28,741,514.39	45%	77%

➢ දඹුල්ල ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

ඉබ්බන්කටුව මෙගලිතික සුසාන භූමිය කැණීම් මඟින් ලබා ගන්නා ලද සියලු බරණි හා මැටි බඳුන් විශ්ලේෂණය කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
6,236,300.00	2,381,284.50	38%	95%

සංරක්ෂණ හා නඩත්තු

දඹුල්ල සිතුවම් කෞතුකාගාරයේ සිතුවම් ගබඩාව විවිධ චිත්‍ර එකතුවකින් සමන්විත වන අතර, මෙම චිත්‍ර පරීක්ෂා කර චිත්‍ර සංරක්ෂණ කටයුතු සිදුකරන ලදි.

ගැරඬියාගල රජමහා විහාරයේ අනුරාධපුර යුගයේ මුල් අවධියට අයත් කටාරම් කොටා ඇති ලෙන්වල චිත්‍ර සංරක්ෂණය කිරීම, සිල්වත්ගල රජමහා විහාරයේ හා තල්ගහගොඩ විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණය, කොස්වත්ත රජමහා විහාරය සිතුවම්වල වර්ණ ස්ථරයේ පළුදු, වර්ණ ස්ථරය දුර්වර්ණ වීම, වර්ණ ස්ථරය කුඩු වශයෙන් හා පොතු වශයෙන් ගැල වී යාම වළක්වා ඒවාට පිළියම් යෙදීම හා සීගිරිය සිතුවම් ගුහාවේ දත්ත වාර්තා කිරීම කරන ලදි.

වේරගම බෝධිමාලාකාරාමය වාස්තු විද්‍යාත්මක සංරක්ෂණය, වළගම්බා පිරිවෙන දානශාලා වහලය අලුත්වැඩියා කිරීම, උකුවෙල වැලිගල පුරාණ රජමහා විහාරය වාස්තු විද්‍යාත්මක සංරක්ෂණය හා දඹුල්ල ව්‍යාපෘති කාර්යාලය, ප්‍රකාශන ගබඩාව හා වාහන ගරාජය අලුත්වැඩියා කිරීම කරන ලදි. එමෙන්ම බිතුසිතුවම් සංරක්ෂණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා බිතුසිතුවම් සංරක්ෂණ සහතික පත්‍ර පුහුණු පාඨමාලා පැවැත්වීම කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
85,540,509.00	19,677,279.39	25%	76%



ගැරඬියාගල රජමහා විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණයට පෙර



ගැරඬියාගල රජමහා විහාරයේ බිතුසිතුවම් සංරක්ෂණයට පසු

කෞතුකාගාර

කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට, තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වීම සිදු කර ඇත.

- **යාපහුව ව්‍යාපෘතිය**

කැණීම් හා පර්යේෂණ

යාපහුව දළදා මාලිගය ලෙස හඳුන්වන විසිතුරු සෝපාන පන්තිය සහිත ගොඩනැගිල්ලට උතුරු දෙසින් පිහිටා ඇති පැරණි ඉදිකිරීම් සාධක කිහිපයේ උපයෝගීතාව, වාස්තුවිද්‍යාත්මක තාක්ෂණ හා ශිල්පීය ක්‍රමවේදය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ අරමුණ ඇතිව දළදා මාලිගාව සමීපයේ හඳුනානොගත් ගොඩනැගිල්ල කැණීම් කිරීම ආරම්භ කරන ලද අතර, මෙම කැණීම තුළින් ගොඩනැගිල්ලක පාදමක්, ගල් කණුවක් යැයි සිතිය හැකි පාෂාණමය අවශේෂයක්, ගල්වරි දෙකකින් යුත් පාදමක් යැයි සිතිය හැකි අවශේෂ හා වෙනත් නිශ්චිත ව නිගමනය කළ නොහැකි පාෂාණමය කිහිපයක සාධක සොයාගෙන ඇත.

ප්‍රාකාර බැම්මේ නිර්මාණ තාක්ෂණය අධ්‍යයනය කිරීම, ඉදිකිරීම් අවධි පිළිබඳ අධ්‍යයනය, අනෙකුත් ප්‍රාකාර බැමි හා සන්සන්දනය, සංරක්ෂණ කටයුතු සඳහා කටයුතු කිරීමේ අරමුණින් දකුණු දොරටුවේ සිට බටහිර දොරටුව දක්වා පිටත ප්‍රාකාර බැම්ම කැණීම ආරම්භ කරන ලද අතර, ඒ මඟින් ප්‍රාකාරයේ ඉදිකිරීම් අවධි හඳුනා ගැනීම සඳහා සිරස් හා තිරස් ක්‍රම යොදා ගෙන ඇත. කලුගල් හා ගඩොල් යොදා නිර්මාණය කර ඇති මෙම ප්‍රාකාර බැම්ම දැඩි ලෙස හායනයට ලක් වී ඇත.

සෙනරත් පරණවිතානයන් විසින් හඳුන්වන පිටදිය අගලට පිටතින් පිහිටා ඇති මඩ අගල බලකොටු රාජ්‍යයක පවතින ආරක්ෂිත ක්‍රමවේදයක් වශයෙන් භාවිතා කිරීමේ පුරාවිද්‍යාත්මක හා වාස්තුවිද්‍යාත්මක ලෙස නිවැරදිව හඳුනාගැනීමේ අරමුණින් මඩ අගල පර්යේෂණ කැණීම සිදු කර ඇත. මෙම කැණීම තුළින් පාංශු ස්ථර වෙන වෙනම හඳුනා ගැනීම සිදු කරන ලද අතර, අංක එම් අගල කැණීමෙන් පාදා ගන්නා ලද සාධක අනුව මේ තුළ පැහැදිළිව ම අගලක ලක්ෂණ හඳුනා ගත හැකි විය.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
22,068,447.50	5,471,478.18	27%	19%



දළඳා මාලිගාව සමීපයේ හඳුනා නොගත් ගොඩනැගිල්ල කැණීමට පෙර



දළඳා මාලිගාව සමීපයේ හඳුනා නොගත් ගොඩනැගිල්ල කැණීමට පසු



ප්‍රාකාර බැම්ම කැණීමට පෙර



ප්‍රාකාර බැම්ම කැණීමට පසු



B කැණීම් මඩ අගල කැණීමට පෙර



B කැණීම් මඩ අගල තුළ පාංශු ස්තර පිහිටා ඇති ආකාරය

සංරක්ෂණ හා නඩත්තු

නාගොල්ල ඡන්තාඝරය සංරක්ෂණය කිරීමේ දී බිත්ති ශක්තිමත් කිරීම සඳහා වැලි, ගල්කුඩු, හුඹස් මැටි මිශ්‍රණයෙන් ඡන්තාඝරයේ කුස්තර පිරවීම, ගොඩනැගිල්ල අභ්‍යන්තරයේ ඇති කොටස් දෙකකින් යුතු පිල්කඩ කුඩුගල් හා ගඩොල් පමණක් භාවිතා කර සංරක්ෂණය කිරීම කරන ලදි. කුස්තර පුරවා බිත්ති ශක්තිමත් කිරීම සඳහා 1:2:8:1 වශයෙන් සිමෙන්ති, හුණු, මෘදු වැලි, හුඹස් මැටි බදාමය සාදා ඇත.

දිග මීටර් 1020 ක් හා පළල මීටර් 18 කින් යුක්ත වන අශ්වලාඩමක හැඩය ගන්නා පිටදිය අගල ආරම්භක ස්ථානයේ සිට නැගෙනහිර දොරටුව දක්වා වූ ප්‍රමාණය සංරක්ෂණය කරන

ලදි. දිය අගලේ පාෂාණමය පැති බැම්ම ඒකාකාරීව ඉහළට එසවෙන විට එය ඇද වැටීමේ ප්‍රවණතාව වැඩි බැවින් බැම්ම බැඳීමේ දී කලුගල් වරියෙන් වරිය ඉහළට යන විට අඟලක පමණ ප්‍රමාණයක් පිටුපසට කර බැම්ම බැඳ ඇත. බැම්ම බැඳීමෙන් පසු 1:1:1:1 වශයෙන් වැලි, සිමෙන්ති, ගල්කුඩු හා හුඹස් මැටි මිශ්‍රණයෙන් බැම්මෙහි කුස්තර පිරවීම කර ඇත.

2016.08.01 දින අදියර කිහිපයක් යටතේ ආරම්භ කරන ලද ගුරුගොඩ ස්ථූප සංරක්ෂණයේ පළමු අදියර ලෙස ස්ථූපයේ සිවුරැස් ප්‍රාකාර බැම්මේ බටහිර බැම්මේ සංරක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. දෙවන අදියර ලෙස සිවුරැස් බැම්මේ උතුරු ප්‍රාකාර බැම්ම සංරක්ෂණය කිරීම සිදුකර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
23,975,107.02	20,296,456.50	109%	88%




පිටදිය අගල සංරක්ෂණය අතරතුර




ගුරුගොඩ ස්ථූපය සංරක්ෂණය අතරතුර

➢ දඹදෙණිය ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

දඹදෙණිය විජයසුන්දරාරාම විහාරස්ථානයේ නව කෞතුකාගාර ගොඩනැඟිල්ල අතර භූමියේ පුරාවිද්‍යා කැණීමක් සිදු කිරීම සහ ස්ථානීය භූ දර්ශනය සකස් කිරීම, වෙස්සගිරි කන්ද ආරණ්‍යය සේනාසන ආශ්‍රිත පුරාවිද්‍යා ගවේශණය කිරීම සහ දඹදෙණිය මාලිගාගල උමහෙහි මූලික ගවේශණයක් කර ඇත.

නාරම්මල හා වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඇති ශිලා ලිපි පර්යේෂණ අධ්‍යයනය කිරීම කර ඇත. මෙහි දී දඹදෙණිය විජයසුන්දරාම රජමහා විහාර ශිලා ලිපිය, මැටියගනේ මයුරාවතී විහාරස්ථානයට අයත් ගිරි ලිපිය මෙන්ම රුවන්ගිරි කන්ද, විහාරේගම රජමහා විහාරස්ථානය, ශ්‍රී බැබිලවනාරාම විහාරය, මැටියගනේ මයුරාවතී, විහාරෙගම හා රුක්මලේ ගිරිගුහාරාමය යන විහාරස්ථානවල ශිලා ලේඛන ද අධ්‍යයනය කර ඇත.

විජයසුන්දරාමයේ නව කෞතුකාගාරය ඉදිරිපස කැණීමෙන් හා රුවන්ගිරි කන්ද ගවේශණයෙන් හමු වූ පුරාවස්තු අධ්‍යයනය කර වාර්තා කිරීම කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
3,770,077.00	2,327,775.24	66%	71%



නව කෞතුකාගාර ගොඩනැඟිල්ල ඉදිරිපස කැණීමට පෙර



නව කෞතුකාගාර ගොඩනැඟිල්ල ඉදිරිපස කැණීමට පසු

සංරක්ෂණ හා නඩත්තු

දඹදෙණිය විජයසුන්දරාරාම විහාරස්ථානයේ බටහිර ප්‍රාකාර බැම්ම කැණීම අනුව ප්‍රාකාර බැම්ම ඉදිකිරීමට අවශ්‍ය සංරක්ෂණ කටයුතු සිදුකිරීම, විහාර මළුව දකුණු දෙසින් පැරණි නටඹුන් දැකගත හැකි අතර, උපෝසථාගාරයක් වන අතර එම භූමිය කැණීම් කර මතුකර ගැනීමෙන් පසු ස්මාරකවල ආරක්ෂාව හා සංචාරක ආකර්ශනය වන පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම කර ඇත.

නාරම්මල බුලපිටය ශ්‍රී සුගතාරාම විහාරයේ පතුරු ගැලවී තිබූ බිතුසිතුවම් සංරක්ෂණය කිරීම, දොරටුව දෙපස මකර තොරණ හා මුර රූප, සිවිලිමේ සමාධි පිළිමයේ අක්‍රමවත් පිරවුම් රැස්කර සැකසීම, ඇතුළත බිත්තිවල ඇති සිතුවම් තහවුරු කිරීම හා ප්‍රතිනිර්මාණය කර ඇත.

දඹදෙණිය සිරිගල පුරාණ විහාරයේ කැටයම් සහිත ලී කණු කෘමීන්ගේ හානිය හේතුවෙන් දැවමය කොටස් පළුදුවීම්, දැඩිලෙස පිපුරුමට ලක් වී ඇති කැටයම් සහිත කොටස් නැවත පුරවා සකස්කිරීම කර ඇත. ලී පෘෂ්ටයේ ඇති වියපත් වූ ආරක්ෂිත ආලේපය සහ ලයිකන ස්ථර ඉවත්කර නැවත ආරක්ෂිත ආලේපයක් යෙදීම හා තඹ මිශ්‍ර ලෝහ කාසි, කැබලි, යකඩ මැටි, ඊයම් පුරාවස්තු සංරක්ෂණය කිරීම කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
5,775,424.50	2,139,208.24	38%	44%



නාරම්මල බුළුපිටිය ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ පිළිම සංරක්ණයට පෙර



නාරම්මල බුළුපිටිය ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ පිළිම සංරක්ණයට පසු

- **පඬුවස්නුවර ව්‍යාපෘතිය**

කැණීම් හා පර්යේෂණ

තිස්සව පුරාණ රජමහා විහාරය ආශ්‍රිත ප්‍රදේශය ගවේෂණය හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ ප්‍රධාන ක්‍රම 02 ක් අනුගමනය කරමින් ප්‍රධාන කොටස් 04 කට බෙදා අධ්‍යයනය කර ඇත. එම ප්‍රධාන කොටස් 04 පහත පරිදි වන අතර, මෙම කාර්යය අවසන් කර ඇත.

- තිස්සව පර්වතය ආශ්‍රිත ස්මාරක (සිරිපතුල, ආකාස චෛත්‍යය, ගල්පියසි, කටාරම් සහිත ලෙන්)
- තිස්සව විහාර පරිශ්‍රය (බෝධීන් වහන්සේ, පොහොයගේ වත්ත, දාගොඩැල්ල)
- උයන්වත්ත විහාර පරිශ්‍රය (බෝධීන් වහන්සේ, ලෙන් විහාරය)
- තිස්සව තදාශ්‍රිතයේ පිහිටි ස්මාරක (වලානේ පත්තිනි දේවාලය, පට්ට පොලේගල - ස්තූප අංක 01, 02 නගුල්මුන්න රඹගල ස්මාරකය, හමු වූ පුරාවස්තු - මැටි බඳුන්, ඌරා කැට ළිං කැබැල්ල)

කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා ඇති පූර්ව බ්‍රාහ්මීය ශිලාලේඛන සහිත ස්ථාන සියල්ල වෙත යාමට නොහැකි බැවින් මූලිකව ම සෙල්ලිපි පිළිබඳව ප්‍රකාශයට පත් වී ඇති ග්‍රන්ථ ඇසුරින් අභිලේඛන අධ්‍යයනය හා වාර්තා සැකසීම කර ඇත. තවද පුරාවස්තු ලේඛනගත කිරීම හා වර්ගීකරණ තත්ව වාර්තාවක් සකස් කර ඇත.

පඬුවස්නුවර දිය අඟල හා බණ්ඩාරනායක විදුහලට බටහිර දිශාවට වන්නට පිහිටා ඇති මෙම භූමියේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වයඹ කාර්යාලය පිටුපස ඇති ගඩොල් බැම්ම හා පාසල අතර සම්බන්ධතාවය පරීක්ෂා කිරීමේ අරමුණින් මෙම කැණීම සිදුකර ඇත. පරීක්ෂණ කැණීමක් ලෙස සිදුකල මෙය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ද අධීක්ෂණය යටතේ අගල් කැණීම් ක්‍රමවේදය යටතේ සිදු කළ ද පුරාවිද්‍යා සාධක කිසිවක් අනාවරණය කර ගැනීමට නොහැකි වූ බැවින් කැණීම වසා දැමීමට කටයුතු කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
911,590.00	278,160.00	32%	30%





ගවේෂණයෙන් සොයා ගන්නා ලද ලෙන්





තිස්සව ලෙන් ගවේෂණයෙන් සොයා ගන්නා ලද මැටි බඳුන් කිහිපයක්

සංරක්ෂණ හා නඩත්තු

දණ්ඩගමුව ශ්‍රී සුදර්ශනාරාම විහාරයේ බණ මඩුවේ වහලයට යෙදූ දැව හා බිත්තිවල අධික ලෙස වෙයන් බෝවීමත්, වර්ෂා ජලයෙන් දිරාපත් වූ උළුවල සිදුරු සෑදී වර්ෂා කාලයේ සිදුරු ඔස්සේ ජලය ගලාගෙන ගොස් රීප්ප දිරායාමත් සිදු වී තිබූ හානිය සංරක්ෂණය කරන ලදි.

නාථගනේ ස්තූපයේ පේසා වළලු 03 සම්පූර්ණයෙන් ඉදිකොට අවසන් ව තිබූ අතර, ගර්භයේ බටහිර කොටස ඉපැරණි බදාම සහිත ව ගඩොල් වරි 07 වන සේ සංරක්ෂණය කිරීම, ස්තූප ගර්භයේ ශේෂ ව තිබූ ඉපැරණි කපරාරුව සංරක්ෂණය කිරීම, ස්තූපය අවට භූ දර්ශන කටයුතු හා නඩත්තු කටයුතු කරන ලදි.

අතීතයේ වහන්තරේ රජමහා විහාරය ලෙස හැඳින්වූ මෑත කාලයේ නාවින්න ටැම්පිට විහාරය ලෙසින් ප්‍රචලිත මෙම විහාරයේ ටෙම්පරා ක්‍රමයට නිර්මාණය කර ඇති සිතුවම් දක්නට ලැබේ.

කෘමි හා පාරිසරික හේතු මත මෙම බිතුසිතුවම් විනාශ වී ඇත. එමෙන්ම සිතුවම් පෘෂ්ට මතුපිට බදාම හරහා නාලාකාර කුහර නිර්මාණය වී බදාම තුළ හිස් අවකාශ සෑදී ඇති අතර, බිත්ති මුළු පිපිරීම හේතුවෙන් සිතුවම් බදාමේ දුර්වල තත්ත්වයන් පෙනෙන්නට විය. ඒ අනුව එම සිතුවම් සංරක්ෂණය කරන ලද අතර, දෛනික නඩත්තු කටයුතු සිදු කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
28,992,639.00	17,020,130.76	64%	63%



නාථගනේ ස්තූපය
සංරක්ෂණයට පෙර



නාථගනේ ස්තූපය
සංරක්ෂණයට පසු

- **කුරුණෑගල ව්‍යාපෘතිය (රිදීගම)**

කැණීම් හා ගවේෂණ

කුරුණෑගල පැරණි ප්‍රාකාර බැම්ම හා කිරිදිගල්ල හත්තාම්පොත ගවේශණ කටයුතු සිදු කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
793,539.30	389,562.74	54%	43%

සංරක්ෂණ හා නඩත්තු

ජයකඩුව රජමහා විහාරය බණ මඩුව සංරක්ෂණය කිරීම (හානියට පත් වූ වහලය පිළිසකර කිරීමේ කටයුතු අවසන් කිරීම), රිදී විහාරයේ පැරණි බණ මඩුවේ වහලය සංරක්ෂණය කිරීම, මොරපාය රජමහා විහාරයේ ස්තූපය පිළිසකර කිරීම, ඉබ්බාගල රජමහා විහාරයේ ආරක්ෂිත බැම්ම ඉදිකර අවසන් කිරීම, රිදී විහාර විශ්‍රාම ශාලාව ඉදිකිරීම, වරක වැළඳු විහාරය බිතුසිතුවම් සංරක්ෂණය, මාස්පොත රජමහා විහාරය බණ මඩුව සංරක්ෂණය (2017 වර්ෂය සඳහා නැවත වරක් ඇස්තමේන්තු සකස් කරන ලදි.) හා පඩුවස්නුවර ව්‍යාපෘතියෙන් ගෙනෙන ලද පුරාවස්තු සංරක්ෂණය කිරීම කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
43,276,143.22	14,415,815.13	35%	58%

- **තිස්සමහාරාම ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

යටාලය රජමහා විහාර භූමියේ ආසනඝරය සහිත ප්‍රදේශය විද්‍යාත්මක කැණීමක් කර ඇත. ඒ අනුව කැණීම් භූමිය ආවරණය වන පරිදි හතර දිශාවට අගල් 04 ක් දියත්කර නැවත මීටරය බැගින් කොටුවලට බෙදා කැණීම ආරම්භ කර ඇත. මෙහි දී ගඩොල් බැම්, ගල් කණු, පුරාවිද්‍යාත්මක සාධක හමු වී ඇති අතර, එම කැණීම් වැඩිදුරටත් සිදු කරමින් පවතී. එම කැණීම තුළින් පාදෝවන ගල, පබළු, කාසි, මැටි කවච, මැටි බඳුන් කොටස්, මැටි කොත, උළු, බෙලි කවච, අස්ථි කොටස් ආදිය හමු වී ඇත.

අගල් කැණීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් සඳගිරිය පිළිමගෙය අසල විවෘත භූමිය කැණීම් කරන ලද අතර, එහිදී කාසි, කාසි අච්චු, පබළු, මැටි බඳුන් හා කැබලි, අක්ෂර සහිත මැටි බඳුන් කැබැල්ලක්, වීදුරු කැබලි, බෙලි කවච, අස්ථි කොටස්, උළු හා ගඩොල් හමු වී ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
10,755,123.12	6,226,291.93	61%	74%



යටාල රජමහා විහාරයේ ආසනඝර කැණීම අතරතුර










යටාල රජමහා විහාරයේ ආසනඝර කැණීමෙන් හමු වූ පුරාවස්තු කිහිපයක්



සඳගිරිය කැණීම් භූමියේ ස්ථර
හඳුනාගැනීමෙන් පසු









සඳගිරිය කැණීම් භූමියෙන් හමු වූ පුරාවස්තු
කිහිපයක්

සංරක්ෂණ හා නඩත්තු

නයිගල රජමහා විහාරයේ ස්මාරක දිගු කාලයක් හායනයට ලක්වීම නිසා වූ හානිය නිසිලෙස සංරක්ෂණය කර මහජනයාට නැරඹීමට හැකි ලෙස එළිමහන් ගැලරියක් සැකසීම, ආරාම සංකීරණයක් වූ සඳගිරිය පොහොය ගෙය ආශ්‍රිතව පාදම් බැමි හා ගල් කණු කොටස් වැටීම ආදී ස්වභාවික ක්‍රියාකාරකම් නිසා හායනයට ලක් වී ඇති ස්මාරක කැලය ඉවත්කර පාදම් බැමි හා ගල් කණු නැවත පැවති ලෙස සංරක්ෂණය කිරීම, අබලන් තත්වයේ තිබූ කතරගම රාම ක්‍රිෂ්ණ මඩම අළුත්වැඩියා කිරීම, තිස්සමහාරාම විහාරයේ ආවාසගෙයි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම හා කතරගම කෞතුකාගාරයේ නඩත්තු කටයුතු සිදුකිරීම යනාදිය සිදු කර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
25,392,946.50	8,513,581.18	36%	66%

- **මාතර ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

මාතර කොටුව අභ්‍යන්තරයේ ව්‍යාප්තව ඇති පැරණි ගොඩනැගිලි ගවේෂණය කර ගොඩනැගිලි වර්ගීකරණයක් සිදුකර ලේඛනගත කිරීම, මාතර පැරණි ගාලුපාර තුළ වර්තමානයේ නිරුපද්‍රිතව දැකගත හැකි පැරණි ගොඩනැගිලි පිළිබඳ ගවේෂණය කර ලේඛනගත කිරීම, මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09ක් පුරා විහි දී තිබූ ලෙන් විහාර පිළිබඳ තොරතුරු රැස් කිරීම යනාදිය සිදුකරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
2,367,800.00	633,580.00	30%	42%

සංරක්ෂණ හා නඩත්තු

බිත්තානය්‍ය යුගයේ ගෘහ නිර්මාණ ලක්ෂණවලින් යුත් විනාශයට පත් වී තිබූ වසර 130 ක් පමණ පැරණි මිගදාය සංඝාවාස ගොඩනැගිල්ලේ වඩිම්බු ලී උළු ආදිය ගලවා නැවත ශක්තිමත් කිරීම, වැහි කූඩු සැකසීම, සඳළුතල මැටි බිම්ගල් අල්ලා කුස්තුර පිරවීම, දොරවල් සංරක්ෂණය, ලී අත්වැට සංරක්ෂණය කිරීම ආදිය සිදුකරන ලදි.

ක්‍රි.ව. 1755 දී පාසලක් වශයෙන් ආරම්භ කරන ලද යෝනකපුර මුස්ලිම් පල්ලියේ කෘමීන්ගේ උවදුරු හා වර්ෂා ජලයෙන් දිරාපත් වූ වහලය සංරක්ෂණය කිරීම, විවිධ පාරිසරික ක්‍රියාකාරකම් මත ගෙබිම ඉරිතලා ගොස් තිබූ ගෙබිම ටෙරාකොටා බිම්ගල් අල්ලා ගෙබිම සැකසීමේ දී අස්ථි අවශේෂ, කාසි, පෝසිලේන් භාජන කොටස් ආදිය හමු වී ඇත.

ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා හානියට පත් වී තිබූ උමංගල ඔවාගිරි විහාරයට පහළින් ඇති ආධාරක බැම්ම, පෙත්මහ සමඟ දිවෙන පඩිපේලි හා ජලය බැසයාමේ කාණු සකස් කිරීම, පිළිමගෙයි වහළයේ දැව සංරක්ෂණ, සණ්ඨාර කුළුණු හා චෛත්‍ය සංරක්ෂණය කිරීම කරන ලදි.

ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා හානියට පත් වී තිබූ ගන්දර පුරාණ විහාරය සීමා මාලකය හා චෛත්‍ය පිළිසකර කර සංරක්ෂණය කිරීම, වැලිගම ගොවියාපාන ධර්ම සුමනාරාම ධර්ම ශාලාව සංරක්ෂණය කිරීම, මිරිස්ස වෙහෙරගල සමුද්‍රගිරි විහාරයේ පැරණි පිළිමගෙය සංරක්ෂණය කිරීම, උඟරාපොල තේනජෝති විද්‍යාතන පිරිවෙන ආරක්ෂක ගල් බැම්ම ඉදිකිරීම, ගැටබරුව රජමහා විහාරයේ විශ්‍රාම ශාලාව ඉදිකිරීම, ගලගම ශෛලාරාම වාහල්කඩ ඉදිකිරීම, මිරිස්ස සමුද්‍රගිරි විහාර බිතුසිතුවම් සංරක්ෂණ කිරීම, ගන්දර පිළිමගෙය බිතුසිතුවම් සංරක්ෂණය කිරීම හා ගොවියාපාන විජය සුමනාරාම විහාරස්ථානයේ ධර්මශාලා ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
26,763,611.00	6,657,599.09	26%	46%



යෝනකපුර මුස්ලිම් පල්ලිය
සංරක්ෂණයට පෙර



යෝනකපුර මුස්ලිම් පල්ලිය
සංරක්ෂණයට පසු



මිරිස්ස සමුද්‍රගිරි විහාරයේ
බිතුසිතුවම් සංරක්ෂණයට පෙර



මිරිස්ස සමුද්‍රගිරි විහාරයේ
බිතුසිතුවම් සංරක්ෂණයට පසු

- **රම්බා විහාර ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

පාෂාණ වලින් සමන්විත අංක 03 පිටත ප්‍රාකාර බැම්ම කැණීම් කිරීම කරන ලද අතර, බැම්මේ දකුණු කෙළවරට ආසන්නව බැම්මට පිටතින් සුවිශේෂී උළු තට්ටුවක් හා පහන් ගොඩක තැම්පතුවක් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. පැරණි උළු ඇසුරුමක් සහ අතීතයේ

ඉවතලන පහන් ගොඩ කරන ලද ස්ථානයක් ලෙස අනුමාන කළ හැකිය. බටහිර බැම්මේ උතුරු කෙළවරින් සුවිශේෂී ගොඩනැගිල්ලක සාධක අනාවරණය කර ගැනීමට හැකියාව ලැබී ඇත. ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක ස්වරූපය අනුව මෙය කැසිකිළි සංකීර්ණයක් විය හැකි බවට අනුමාන කළ හැකිය. උතුරු දිශානුගතව විහිදෙන බැම්මෙහි ගොඩනැගිලි සාධක සහිත සාධක සහිත කොටසෙහි පර්යේෂණ මට්ටමින් කැණීම් සිදුකරන ලද අතර එහි දී හුණුකිල්ලෝටයක් යයි අනුමාන කළ හැකි තඹමය පුරාවස්තුවක සාධක මෙන්ම පරාක්‍රමබාහු කාසි 03 ක් ද හමු විය. මේවාට අමතරව කැණීම් තුළින් මැටි මුට්ටි කිහිපයක සාධක, වැයක සාධක, පාත්‍රයක කොටසක් යැයි අනුමාන කෙරෙන කොටසක්, මැටි පහන්, පෝසිලේන් කැබලි, යකඩ ඇණ, වළලු කැබලි, පහන් කණු, අර්ධ උන්නත මැටි පුවරු කොටස්වල සාධක මෙන්ම ගෙජ්ජියක කොටස්, දියතලිප්පු නමින් හැඳින්වෙන තිරුවාණා විශේෂයක් ද හමු වී ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
6,059,907.50	4,048,391.00	73%	90%





අංක 03 ප්‍රාකාර බැම්ම කැණීම අතරතුර



කැණීමෙන් හමු වූ උළු ඇසුරුමක්


සංරක්ෂණ හා නඩත්තු

වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ කාර්යයන් යටතේ අංක 02 ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම, 23/11 ගොඩනැගිල්ල සංරක්ෂණය කර ඇත. එමෙන්ම නව ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම, කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම හා ප්‍රවේශපත් අලෙවිසැල සැදීම යනාදිය සිදුකර ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
17,772,779.55	9,651,705.46	59%	59%




අංක 02 ගොඩනැගිල්ල සංරක්ෂණය අතරතුර

නව ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු අතරතුර

- **ගාල්ල ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

අරිප්පු වෙරළේ සිට කි.මී. 09 ක් පමණ දුරින් ගැඹුර මී. 8.5 ක් හා පළල මී. 18 කින් යුක්ත අරිප්පු ලී නෞකාවේ ගවේෂණ කටයුතු කිරීම, 19 වන සියවස අග හෝ 20 වන සියවස මුල භාගයට අයත් වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක, ක්ෂේත්‍රය මී. 05 සිට මී. 19.2 ක් ගැඹුරින් යුක්ත වාෂ්ප නෞකාවේ දළ සැලසුමක් නිර්මාණය කිරීමට මිනුම් ලබා ගැනීම, ඕලුවිල් ප්‍රදීපාගාරය ඉදිරිපිට ගැඹුරු මුහුදේ ගිලී පවතින දෙවන ලෝක යුද්ධ සමයේ ජපන් ප්‍රහාර හේතුවෙන් විශාල ලෙස හානිවී ඇති මී. 40 ක් ගැඹුරින් පවතින HMS Athelstan (1942) නෞකාවේ ගවේෂණ කටයුතු කිරීම, 1942 අප්‍රේල් 09 වන දින ජපන් ප්‍රහාරයෙන් මුහුදුබත් වී ඇති HMS Hillyhgwle (1942) නෞකාවේ සැකැස්ම හා පිහිටීම සටහන් කර ගැනීම හා ඡායාරූප වාර්තා කිරීමට පමණක් කිමිදුම් කිරීම, වාකරේ ප්‍රදේශයට ඉදිරියේ මී. 25 ගැඹුරින් ගිලී කොටස් 02 කට කැඩී ගොස් ඇති British surgen නෞකාවේ GPS දත්ත ලබා ගැනීම කර දළ සැලසුමක් නිර්මාණය කිරීම, පාසිකුඩා නව වාෂ්ප නෞකාව ගවේෂණය කිරීම, මඩකළපුව ආශ්‍රිතව ගිලී ඇති නිව් කාසල්හි නෙදම්බර්ලන්ඩ් සමාගමෙන් තනන ලද Sri john Jackson නෞකාවේ

GPS Location ලබාගෙන ඡායාරූප හා වීඩියෝගත කිරීම, මඩකලපුව නව වාෂ්ප නෞකාවේ කොටසක් මිනුම්ගත කිරීම, කායන්කේනි ගල් පාලම ගවේෂණය කිරීම, භාරුත් ගල් කැටයම් හා වෙනත් භාණ්ඩ විශාල ප්‍රමාණයක් සහිතව උතුරු පළාතේ මුලතිව් මුහුදු ආශ්‍රිතව ගිලීගොස් ඇති S.S. ඉන්ඩස් නෞකාව (මුලතිව් නෞකාව) පිළිබඳ තොරතුරු අනාවරණය කර ගනිමින් GPS සාධක අනාවරණය කරගැනීම හා එම ගවේෂණය තුළින් ඉර ලකුණ සහ P&O සමාගමේ ලාංඡනය සහිත කුඩා ලෝහ බඳුනක් සොයා ගැනීම කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
22,043,680.58	6,052,955.36	30%	47%



අරිප්පු ලී නෞකාව ගවේෂණය අතරතුර

සංරක්ෂණ හා නඩත්තු

සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය සංරක්ෂණය කිරීම, දොඩන්දුව ශ්‍රී ශෛල බිම්බාරාම මහාවිහාරයේ දිරාගිය වහලය උළු ආදිය ඉවත්කර සංරක්ෂණය කිරීම, දෙමහල් ගොඩනැඟිල්ලක් ලෙස ඉදිකර ඇතත් දිරාපත්වීම හේතුවෙන් තනි මහලක් ලෙස හඳුනාගත හැකි ලෙස දැඩි අබලන් තත්වයක තිබූ හබරකඩ ශ්‍රී විජයානන්ද පුරාණ රජමහා විහාරයේ ගොඩනැගිල්ල කඩා ඉවත්කර ධාතු මන්දිරය සහිතව දෙමහල් ගොඩනැගිල්ල අළුතින් ඉදිකිරීම, කතළුව පුර්වාරාම විහාරයේ විහාරගෙයි වහලය දිරාපත් වී විහාරගෙය තුළට වැසි ජලය කාන්දුවීම නිසා සිවිලිමේ හා බිත්ති මත ඇති බිතුසිතුවම් විනාශ වීමේ අවධානමකට මුහුණ පා තිබූ බැවින් දිරාගිය දැව වහල වෙනුවට අළුත් දැව යොදා සිතුවම්වලට හානි නොවන ලෙස වහලය සකස් කිරීම, ඉපැරණි වාස්තුවිද්‍යා ලක්ෂණවලින් හෙබි ශ්‍රී සුභද්‍රාරාම පුරාණ විහාරයේ වහලය හා පොළව විශාල ලෙස හානියට පත්වී තිබූ අතර, ප්‍රධාන වහලය හා බරාඳ කොටසේ දැව රාමුව සවිකර උළු සෙවිලිකර බිත්ති කපරාරු කර සංරක්ෂණය කිරීම සහ පැරණි අබලන් වූ විදුලි පද්ධතිය ගලවා ඉවත් කර නැවත සකස් කර පොළව කොන්ක්‍රීට් කර බදාම දමා දොරවල් සංරක්ණය කිරීම කරන ලදි.

පුරාවස්තු සංරක්ෂණය (තඹ මිශ්‍ර ලෝහ, යකඩ, දැවමය, පියුටර්, ගඩොල්, පාෂාණ), පැරණි බිත්තාන්‍ය ලාංඡන සංරක්ෂණය කිරීම, කෞතුකාගාර සිතුවම් පුවරු හා වෙනත් කෞතුක භාණ්ඩ සංරක්ෂණය කිරීම, රිච්මන්ඩ් විද්‍යාලයේ කෞතුක වස්තු සංරක්ෂණය කිරීම ද කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
34,164,936.50	13,164,598.47	57%	76%





සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය සංරක්ෂණ කටයුතු අතරතුර



කතළුව පූර්වාරාම විහාරයේ විහාරගෙය සංරක්ෂණයට පෙර



කතළුව පූර්වාරාම විහාරයේ විහාරගෙය සංරක්ෂණයට පසු

- **ගම්පහ ව්‍යාපෘතිය**

සංරක්ෂණ හා නඩත්තු

මීගමුව දුව සින්ද්‍රානි දේවස්ථානයේ ලවණවලින් භායනය වී තිබූ බිත්තිවල කපරාදුව ගලවා ඉවත්කර දුව කපරාදුව සිදුකර ග්‍රැනයිට් අල්ලා නිමාව සඳහා බදාම තීරුවක් සැකසීම හා ඉදිරිපස ප්‍රධාන දොර දැව නිර්මාණ සඳහා ජල නිවාරක යොදමින් තීන්ත ආලේප කර නැවත සවි කිරීම කරන ලදි.

මහනුවර සම්ප්‍රදායට අයත් බිතුසිතුවම් හා ප්‍රතිමා දක්නට ලැබෙන හෙයියන්තුඩුව රජමහාවිහාරයේ බිතුසිතුවම් හා ප්‍රතිමා සංරක්ෂණය කිරීම කරන ලදි.



මීගමුව දූව සින්ද්‍රාති දේවස්ථානයේ ලවණවලින් හානියට පත් කපරාරුව සංරක්ෂණයට පෙර



මීගමුව දූව සින්ද්‍රාති දේවස්ථානයේ ලවණවලින් හානියට පත් කපරාරුව සංරක්ෂණයට පසු

- **කෑගල්ල ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

කෑගල්ල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක පිළිබඳ තොරතුරු ගවේෂණය කරන ලද අතර, එහිදී පුරාවිද්‍යා වැදගත් කමින් යුත් ස්ථාන, ස්මාරක, පැරණි මාර්ග පද්ධති හා කැණීම් කළ යුතු ස්ථාන වෙන් වෙන් වශයෙන් හඳුනා ගනිමින් වාර්තා සකස්කරන ලදි.

- **කොළඹ ව්‍යාපෘතිය**

සංරක්ෂණ හා නඩත්තු

කළුතර දිස්ත්‍රික්කයේ තෝරා ගැනුණු පුරාවිද්‍යා හා ඓතිහාසික වටිනාකම් ඇති ස්ථාන කිහිපයක් නිරීක්ෂණය කර ඉදිරි කටයුතු සිදුකිරීමට අදාළ නිරීක්ෂණ වාර්තා සකස් කිරීම කරන ලදි.

- **රත්නපුර ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

රත්නපුර දිස්ත්‍රික්කයේ හා ඒ අවට ඇති පුස්තකාල අධ්‍යයනය සිදුකර පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන පිළිබඳ වාර්තා සකස් කිරීම හා මොලමුරේ සිට කල්තොට දක්වා ඉහළ බෑවුමේ පුරාවිද්‍යාත්මක ගවේෂණ සිදුකරන ලදි.

- **මොණරාගල ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

කුරුල්ලන්ගේ සිතුවම් සහිත විවෘත ස්ථානයක පවතින ගල් පර්වතයක් වන කුරුල්ලන්ගල ගවේෂණය කිරීම, බුදුරුවගල හා මාලිගාවිල පුරාවිද්‍යා පරිශ්‍ර කේන්ද්‍ර කර ගත් ගවේෂණ කටයුතු කිරීම, බදුල්ල දිස්ත්‍රික්කයේ පවතින සංචාරක, වන්දනාමක හා සෞන්දර්යාත්මක ස්ථාන පිළිබඳ හා ශිලා ලේඛන පිළිබඳ වාර්තා සකස් කිරීම කරන ලදි.

සංරක්ෂණ හා නඩත්තු

රක්ඛිතාකන්ද පුරාණ විහාරයේ සංරක්ෂණ කටයුතු අවසන් කිරීම හා මුදලින්දාරාම ටැම්පිට විහාරයේ සංරක්ෂණ කටයුතු සිදු කිරීම ආරම්භ කර සංරක්ෂණ කටයුතු සිදුකිරීම කරගෙන යනු ලබයි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
10,868,505.00	203,415.00	02%	30%

- **යාපනය ව්‍යාපෘතිය**

කැණීම් හා ගවේෂණ

අවුරුදු 300 ක් පමණ පැරණි යාපනය කොටුව කැණීම් කරන ලද අතර එහිදී යබොර කොටස්, මැටි බඳුන් කොටස්, අඟුරු කැබලි, උළු කොටස්, මාබල් කොටස් හා සරණේරු කොටස් හමු වී ඇත.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
3,937,600.00	3,134,380.00	79%	41%

සංරක්ෂණ හා නඩත්තු

යුරෝපීයයන් විසින් නිර්මාණය කරන ලද ඩෙල්ෆ් දූපතේ රෝහල පැරණි ස්වරූපයට හානියක් නොවන පරිදි අළුත්වැඩියා කර සංරක්ෂණය කරන ලදි.

ඇස්තමේන්තුගත කළ මුදල (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (රු.) (ද්‍රව්‍ය හා ශ්‍රම)	වැය වූ වියදම (%)	භෞතික ප්‍රගතිය (%)
3,708,799.95	295,000.00	08%	30%

- **ප්‍රකාශන අංශය**

මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ප්‍රකාශයට පත්කරනු ලබන සියළුම කැණීම් හා සංරක්ෂණ වාර්තා, අත්පත්‍රිකා, මාර්ගෝපදේශ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ග්‍රන්ථ, පෝස්ටර්, පින්තූර තැපැල්පත්, මූර්ති ග්‍රන්ථ යනාදි ප්‍රකාශනයන්, දේශීය සහ විදේශීය ප්‍රවේශපත්‍ර හා බාහිර ආයතනවල ප්‍රකාශන ද මුද්‍රණය කරනු ලබන්නේ ප්‍රකාශන අංශය මඟිනි.

ඡායාරූප හා ප්‍රලේඛන අංශයක් ද පවතින මෙහි මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදුකරනු ලබන විවිධ කාර්යයන් ඡායාරූප ගත කිරීම හා වීඩියෝගත කිරීම කරනු ලබයි.

භූ විද්‍යා හා ක්ෂුද්‍ර ජීව පර්යේෂණ යන අංශවලින් ද සමන්විත වන අතර, මෙම අංශ මඟින් විවිධ පර්යේෂණ හා ගවේෂණ කටයුතු කරමින් කැණීම් හා සංරක්ෂණ කටයුතු වලට අදාළ සහාය ලබාදෙනු ලබයි.

පුස්කොල පොත් සංරක්ෂණය හා සුචිගත කිරීමේ ඒකකය මඟින් ලංකාව පුරා ව්‍යාප්තව ඇති විහාරස්ථානවල ඇති පුස්කොල පොත් සංරක්ෂණය කිරීමේ කටයුතු කරනු ලබයි.

- **ජාතික අනුරූ පාසල (බටලීය)**


1997 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජාතික අනුරූ පාසල අධ්‍යයන, නිෂ්පාදන හා අලෙවි යන අංශයන්ගෙන් සමන්විත වන අතර, පුවත්පත් දැන්වීම් පළකිරීම මඟින් අනුරූ පාසල වෙත වසර දෙකක අධ්‍යයන කාලයකට යටත්ව සිසුන් බඳවා ගැනීමට කටයුතු කර න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීමට කටයුතු කරනු ලබයි.


සිමෙන්ති, ෆයිබර්, දැව, පාෂාණ හා පිත්තල යන ද්‍රව්‍යයන් යොදා ගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදල සතු ප්‍රකාශන හා අනුරූ අලෙවිසැල්වල අලෙවි කිරීම සඳහා අනුරූ නිෂ්පාදනය කරනු ලබයි.

මීට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදල හා බාහිර ආයතන මඟින් ලැබෙන ඉල්ලීම් අනුව විවිධ තොරණ්, සැරසිලි, සමරු තිළිණ, වේදිකා සැරසිලි සකස් කරනු ලබන අතර අනුරූ සහිත ප්‍රදර්ශන කුටි පවත්වනු ලබයි.

ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

භෞතික ප්‍රගතිය




සංරක්ෂණ හා නඩත්තු
(රු.මි.) / %
120
100
80
60
40
20
0
භෞතික ප්‍රගතිය
මූල්‍ය ප්‍රගතිය
අනුරාධපුර
පොළොන්නරුව
මහනුවර
දඹුල්ල
යාපහුව
දඹදෙණිය
පඬුවස්නුවර
කුරුණෑගල
නිස්සංකමල්ල පුර
මාතර
රම්බොඩ විහාරය
ගාල්ල
මොණරාගල
යාපනය

2.3 අභියෝග හා ඉදිරි දැක්ම

අභියෝග

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික ස්මාරක ප්‍රවර්ධනය, ප්‍රතිසංස්කරණය කිරීම හා ආරක්ෂා කිරීම මඟින් අනාගත පරපුරට දායාද කරදීමයි. ලංකාව පුරා පිහිටුවා ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති මඟින් ඒ ඒ ප්‍රදේශයන් පුරා ව්‍යාප්තව ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීමට අදාළ කාර්යය කිරීමේ දී බොහෝ අභියෝග හා ගැටළු රාශියකට ලක්වීමට සිදු වී ඇත. එම අභියෝග හා ගැටළු පහත පරිදි වේ.

- පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ආශ්‍රිතව වර්තමානය වන විට ජනාවාස ඇතිවීම වර්ධනය වීමත් සමඟ බොහෝ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශයට හා හායනයට ලක්වීමේ ප්‍රවණතාව වර්ධනය වීම
- ආරක්ෂණ ක්‍රමවේදයන්වල පවතින දුර්වලතා
- ඒ ඒ ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාව විසින් අදහනු ලබන විවිධ ආගමික ක්‍රමවේදයන් හා සංස්කෘතික ගැටළු
- ජනතාවගේ මිත්‍යාමත හා නොදැනුවත් බව
- විශේෂඥ දැනුමේ සාපේක්ෂ හිඟය
- අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම
- ඉතා කඩිනමින් කළ යුතු සංවර්ධන තත්වයන් සඳහා නිර්දේශ ලබා ගැනීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටළු
- ස්වභාවික ආපදා හා විවිධ සත්ත්ව කාණ්ඩයන් විසින් කරනු ලබන ක්‍රියාකාරකම්

ඉදිරි දැක්ම

අරමුදල මුහුණ දෙන අභියෝග සාර්ථකව ජයගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දරන උත්සාහයන් තව තවත් ශක්තිමත් කර ගනිමින් අරමුදලේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම ප්‍රධාන කර්තව්‍යය වේ. ඒ අනුව,

- අනුරාධපුර, පොළොන්නරුව පූජා භූමි හා සීගිරිය ලෝක උරුම ස්මාරකයන් ආශ්‍රිතව පිහිටා ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම.
- මධ්‍යම සංස්කෘතික අරමුදලේ දීප ව්‍යාප්ත ව්‍යාපෘති ඔස්සේ මෙතෙක් සිදු කරමින් පවතින සංරක්ෂණ හා නඩත්තු කාර්යයන් අඛණ්ඩව තවදුරටත් පවත්වාගෙන යාම.
- පුරාවිද්‍යා කැණීම් හා පර්යේෂණ කාර්යයන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම.
- දෙස් විදෙස් සංචාරකයින් උදෙසා යටිතල පහසුකම් සම්පාදනය හා සංවර්ධනය
- ශ්‍රී ලංකාව පුරා විසිර පවතින බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා කතෝලික ආගමික සිද්ධස්ථාන සංවර්ධනය හා සංරක්ෂණය කිරීම.
- ගුණාත්මක කලා නිර්මාණ උදෙසා දායක වූ කලාකරුවන්ගේ කලා නිර්මාණ ඇගයීමේ වැඩසටහන් ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකාව ඇතුළත හා විදේශයන්හි ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ස්ථාපිත කිරීම.
- අළෙවිය සඳහා අනුරූ නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ග්‍රන්ථ ප්‍රකාශන මුද්‍රණය හා අළෙවි කටයුතු සිදු කිරීම.

2.4 ඉදිරියේදී අරමුදලේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

1. පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම

මහජනතාව, පාසැල් සිසුන් හා විශ්වවිද්‍යාල සිසුන් සහභාගිත්වයෙන් පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක ආරක්ෂා කිරීම පිළිබඳ විවිධ ක්‍රියාකාරකම් හා වැඩමුළු සංවිධානය කිරීම, පුරාවිද්‍යා විෂය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම, පාසල් සිසුන්ගේ පුරාවිද්‍යා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පාසල් ආශ්‍රිතව විවිධ වැඩමුළු හා දේශන පැවැත්වීම, දේශීය හා විදේශීය සංචාරකයින් උදෙසා ප්‍රදර්ශන හා ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීම, පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ වැරදි තොරතුරු ප්‍රචලිත වීම වැළැක්වීම උදෙසා මාර්ගෝපදේශකයන්ට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමට විවිධ දේශන, වැඩමුළු හා ක්‍රියාකාරකම් මෙහෙයවීම, පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් විවිධ භාෂාවන්ගෙන් යුත් අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදාහැරීම, අන්තර්ජාලය භාවිතා කර පුරාවිද්‍යාත්මක තොරතුරු වඩාත් සිත්ගන්නා අයුරින් ප්‍රචලිත කිරීම, ප්‍රදර්ශන පැවැත්වීම

2. නව පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

3. මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය මඟින් වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය ආශ්‍රිත කර ගනිමින් විවිධ වැඩමුළු, ක්‍රියාකාරකම් වර්ෂය පුරා විහිදෙන පරිදි ක්‍රියාත්මක කිරීම

4. සේවක සුභසාධනය ඉහළ නැංවීමට අදාළ කටයුතු මෙහෙයවීම

5. පුරාවිද්‍යා ස්ථාන නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් උදෙසා සනීපාරක්ෂක හා යටිතල පහසුකම් ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම

6. ව්‍යාපෘති කාර්යාලවල යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම

7. පුරාවිද්‍යාත්මක ස්ථාන සම්බන්ධව සිදුකරනු ලබන විවිධ හානිදායක විනාශයන් සහ පුරාවස්තු සොරකම් කිරීම, නිදන් හැරීම වැනි ක්‍රියාවන් වැළැකක්වීම උදෙසා පනවා තිබෙන නීති ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම හා නව නීති ඇතිකිරීම

8. පුරාවිද්‍යාත්මක ස්ථාන කැණීම් හා සංරක්ෂණ කටයුතු වඩාත් පුළුල් කිරීම

03. වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

03.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ

CENTRAL CULTURAL FUND
STATEMENT OF FINANCIAL POSITION
AS AT DECEMBER 31, 2016

ASSETS	Notes	2016 Rs.	2015 (Restated) Rs.
CURRENT ASSETS			
Cash & Cash Equivalents	1	139,070,261	49,124,197
Receivable	2	147,392,501	71,080,629
Inventories	3	77,602,071	80,624,726
Investments		2,903,502,450	1,315,672,997
		3,267,567,283	1,516,502,549
CAPITAL WORK IN PROGRESS		20,541,024	8,994,388
NON CURRENT ASSETS			
Receivables	4	171,638,043	199,055,377
Foreign Funded Projects		676,432	676,432
Property, plant & Equipments	5	954,780,870	965,590,731
Gratuity Investments		691,102,852	654,908,485
		1,818,198,197	1,820,231,024
TOTAL ASSETS		5,106,306,504	3,345,727,961
LIABILITIES			
CURRENT LIABILITES			
Payables and Accruals	6	140,041,140	76,987,772
NON CURRENT LIABILITES			
Provision for Gratuity	7	678,031,282	658,739,422
Special Funded Projects	8	16,821,196	8,806,885
Foreign Funded Projects	9	4,849,969	4,367,338
TOTAL LIABILITIES		839,743,587	748,901,417
NET ASSETS		4,266,562,917	2,596,826,544
CAPITAL CONTRIBUTED BY			
Capital Reserves		429,160,000	430,462,000
Assets Revaluation Reserves		251,414	4,751,268
Foreign Resource Fund		248,050,137	269,346,213
Accumulated Surplus/ Deficit		3,589,101,366	1,892,267,063
		4,266,562,917	2,596,826,544

The Accounting policies on page 3 to 8 and Notes on pages 13 to26 from and integral part of these Financial Statements.
The Board of Directors are responsible for the preparation and presentation of these Financial Statements.
These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

U.R.Arandara
Director Finance
Central Cultural Fund

Prof. P. Gunawardana
Director General
Central Cultural Fund

Sunil Hettiarachchi
Secretary
Ministry of Education

Prof. S. Dissanayaka
Director General
Dept. of Archeology

Signed on : 28.....Feb 2017

Sunil Hettiarachchi
Secretary
Ministry of Education
"Isurupaya"
Battaramulla.

Prepared By
M.G. Ariyarathna
(Asst.Accountant)

CENTRAL CULTURAL FUND

Cash Flow Statement for the year Ended 31st December 2016

Cash Flow from Operating Activities	2016	Rs.	2015	Rs.
Surplus/(deficit) for the year		1,696,834,303		867,115,251
Adjusments for non cash movements				
Depreciation	110,494,226		73,681,337	
Amotisation	(27,097,930)			
Profit on disposal of fixed assets			(6,755)	
Prior year adjustments & tranf .to Reserve A/c.s			(74,633,779)	
Provision for Gratuity	51,209,952	134,606,247	228,479,519	227,520,322
Operating result before changes in items of working capital		1,831,440,551		1,094,635,573
Changes in work in capital				
Increase in Shortterm Receivables	(76,311,868)		(11,735,538)	
Inventories	3,022,651		23,709,014	
Payment of gratuity	(31,918,092)		(8,769,575)	
Payables and Accruals	63,053,369	(42,153,941)	(23,896,578)	(20,692,677)
Net Cash Generated from Operation Activities		1,789,286,610		1,073,942,896
Cash Flows from Investment Activitles				
Increase in Long term Receivables	27,417,335		13,201,420	
Acquisition of fixed assets	(99,684,366)		(122,559,100)	
Capital WIP	(11,546,636)			
Sale proceed of fixed assets			6,755	
(Increase)/Decrease in investments	(1,500,000,000)			
Interest Capitalised	(124,023,820)		(971,761,998)	
Net cash used in investing activities		(1,707,837,488)		(1,081,112,923)
Cash Flows from Financing Activities				
Special funded projects	8,014,311		3,742	
Foreign funded projects	482,631		(1,049,300)	
Cash used in financing activities		8,496,942		(1,045,558)
Net cash increase in cash and cash equivalents		89,946,065		(8,215,585)
Cash and cash equivalents at the beginning of year		49,124,196		57,339,782
Cash and cash equivalents at the end of year		139,070,261		49,124,197


Statement of Changes in Equity
for the year ended 31st December 2016

	Accumulated Fund	Capital Reserves	Revaluation Reserves	Foreign reserve Fund	Accumulated Surplus	Total
Balance as at 01/01/2015	19,944,705	16,064,386	444,422,000	286,249,551	1,077,745,952	1,844,426,594
Add: Surplus for the year	-	-	-	-	867,115,251	867,115,251
Revalution Surplus	-	-		-	-	-
Capitalization foreign fund	-	-	-		-	-
Prior year adjustments	-	-			(74,633,782)	(74,633,782)
Balance as at 01/01/2016	19,944,705	16,064,386	444,422,000	286,249,551	1,870,227,421	2,636,908,063
Add: Surplus for the year	-	-	-	-	1,696,834,303	1,696,834,303
Prior year adjustments	(19,944,705)	413,095,614	(444,170,586)	(38,199,415)	22,039,642	(67,179,450)
Balance as at 31/12/2016	0	429,160,000	251,414	248,050,136	3,589,101,366	- 4,266,562,916

CENTRAL CULTURAL FUND
STATEMENT OF FINANCIAL PERFORMANCE
FOR THE YEAR ENDED DECEMBER 31, 2016

	Note	2016 Rs.	2015(Restated) Rs.
Income			
Tickets Sales	10	3,445,925,208	2,751,061,677
Contribution from Replicas Sales	11	2,608,009	2,923,806
Contribution from Publication Sales	12	8,846,068	1,931,050
Contribution of Printing	13	13,155,989	11,299,313
Income from Investments		233,863,909	95,006,954
Deffered Income		27,097,930	
Other Income	14	26,563,180	16,459,409
Total Income		**3,758,060,292**	**2,878,682,209**
Expenditure			
Wages, Salaries,& Employee Benefits	15	1,367,626,547	1,238,315,468
Gratuity		51,209,952	228,479,520
Depreciation		110,494,226	73,681,337
Sales Promotion and Public Relations		10,943,554	14,793,399
Supplies and Consumable Used	16	166,301,493	158,770,101
Impairment of Property, Plant & Equipments	17	62,628,968	75,951,005
Contractual Services	18	74,347,011	47,861,827
Finance Cost		344,232	176,828
Audit Fees		500,000	500,000
Bonus	19	27,261,401	
Other Expenses	20	189,568,606	173,037,474
Total Expenditure		**2,061,225,989**	**2,011,566,959**
Surplus/(Deficit) for the year		**1,696,834,303**	**867,115,250**

03.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණන වාර්තාව



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සිවිරත්/සී/ඔඩිඔකල්/1/16/34 ඔබේ අංකය / உமது இல. / Your No } දිනය / திகதி / Date } 2018 ජනවාරි 29

අධ්‍යක්ෂ ජනරාල්,

මධ්‍යම සංස්කෘතික අරමුදල.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්තන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ඊදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව නියමිත පුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) වැවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ලබා ගැනීම සිඳිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. එමෙන්ම පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සිඳිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලසිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතුය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජනය කළ රු.මිලියන 1,600 ක් සහ ආයෝජන ආපසු ගැනීම් රු.මිලියන 100 ක් පිළිවෙලින් මුදල් ගලායාමක් සහ මුදල් ගලාඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙන් වෙන්ව දක්වා නොතිබුණි. තවද වර්ෂය තුළදී ප්‍රාග්ධනීත කරන ලද ආයෝජන පොලී රු.මිලියන 124 ක් මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 191.4 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අපහරණය සඳහා පවතින වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවන රු.1,587,362 ක ණයගැති ශේෂ පැවතියදී ඒ පිළිබඳ සමාලෝචනය කිරීමකින් තොරව සෑම වර්ෂයකදීම රු.1,964,833 ක් අඩමාණ ණය ලෙස වෙන් කරමින් තිබුණි.

(ආ) අරමුදල විසින් පුරාවිද්‍යාත්මක ස්ථාන නරඹන්නන් සඳහා නිකුත් කිරීමට මුද්‍රණය කර තිබූ ප්‍රවේශපත්‍ර වලින් සමාලෝචිත වර්ෂය අවසානයට මුද්‍රණ වියදම් රු.3,424,990 ක් වූ

ප්‍රවේශපත්‍ර නොග මුල්‍ය ප්‍රකාශනවලල ඇතුළත් නොකිරීම නිසා ප්‍රවේශපත්‍ර අවයන් නොග ශේෂය සහ වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) නොග සම්ක්ෂණ වාර්තා අනුව ව්‍යාපෘති 08කට අදාළව පැවති රු.13,179,037 ක් වටිනා අතුරු, ගොඩනැගිලි දුව්‍ය, ලිඛිද්‍රව්‍ය හා ප්‍රකාශන 2016 දෙසැම්බර් 31 දිනට අවයන් ගබොගයේ ඇතුළත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන නොගය හා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) වර්ෂය තුළදී විවිධ පාර්ශවයන් වෙත පරිත්‍යාග කරන ලද රු.1,415,122ක් වටිනා අතුරු සහ ප්‍රකාශනු, නොග ගිණුමට බැර කිරීම වෙනුවට විකුණුම් ගිණුමට බැර කිරීම නියා වර්ෂයේ විකුණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද වර්ෂ අවසාන අතුරු නොගය වටිනාකම රු.1,286,258 කින් හා ප්‍රකාශන නොගය රු.128,864 ක් වැඩියෙන් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට නොග සම්ක්ෂණ වාර්තාව අනුව පේතවන ව්‍යාපෘතියට අදාළව රු.1,944,837 ක් වටිනා අනිරික්ත නොගයක් වාර්තා කර තිබුණු අතර ඊට හේතූන් සොයා මුල්‍ය ප්‍රකාශනවල ඇලපිම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අරමුදලේ ජංගම ගිණුමකට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2016 ජුනි සිට පැවත එන රු.10,000 ක හඳුනා නොගත් බැර ශේෂයක් දක්වා තිබුණු අතර එම ශේෂය 2017 ඔක්තෝබර් වන විටද හඳුනාගෙන මුල්‍ය ප්‍රකාශනවලට ඇළපිම් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ව්‍යාපෘති 2කට අදාළව ස්ථිර කම්කරුවන් වෙත ලබාදුන් යතුරුපැදි ණය ශේෂය සඳහා ප්‍රධාන කාර්යාලය විසින් පිළියෙල කළ සැසඳුම් ප්‍රකාශනය අනුව සහ ව්‍යාපෘති මඟින් එවන ලද වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.270,808 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණය රු.287,083 ක්ද, සේවකයන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු නිවාස ණය රු.766,048 ක්ද, සේවකයින් 55 දෙනෙකුගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් රු.267,525 ක්ද, සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු විශේෂ අත්තිකාරම් රු.28,991 ක් වශයෙන් වර්ෂ 1ත් වර්ෂ 5 ත් අතර කාල පරාසයක් තුළ අයවීම් නිහඬීව් ණය ලේඛ ඇපකරුවන්ගෙන්, දේපල වලින් හෝ නීතිමය ක්‍රියාමාර්ග වලින් අයකර ගැනීමට මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද වර්ෂ 05කට වැඩි උත්සව අත්තිකාරම් රු.1,049,260 ක්ද. විශේෂ අත්තිකාරම් රු.76,499 ක්ද අයකරගෙන නොතිබුණු අතර එම ණය ශේෂද වර්ෂයක් තුළ අයකරගත යුතුව තිබුණද එසේ නොකිරීමට හේතු පැහැදිලි කර නොතිබුණි.

(ආ) විවිධ ණයගැනි ශේෂය තුළ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් වසර 4 කට අධික කාලයක සිට අයවිය යුතු රු. 672,577 ක ශේෂයක් පැවතුණි.

(ඇ) ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති විශේෂ අරමුදල් හා විදේශ අරමුදල් ව්‍යාපෘතිවලට අදාළ පිළිවෙලින් රු.8,806,885 ක සහ රු.4,376,549 ක ශේෂ 2012 වර්ෂයට පෙර සිට පැවති නමුත් එම ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ නිරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1980 අංක 57 දරන ඔධ්‍යම සංස්කෘතික අරමුදල් පනත	
(i) 4 (ඇ) වගන්තිය	මුල්‍ය ප්‍රකාශනවල වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ රු.79,074,872 ක් පන්සල්, පෙරහැර, විහාර හා ආගමික උත්සව සඳහා ලබාදී තිබුණ ද මෙම පරිත්‍යාග සම්බන්ධයෙන් යටෝක්ත වගන්තිය අනුව පාලක මණ්ඩල

		ඇතුළත්ය ලබාගෙන නොතිබුණි. එසේ යලෝක්ත වගන්තියට පටහැනිව පාලක මණ්ඩල අනුමැතියකින් තොරව සලකාලෝචිත වර්ෂය තුළදී විවිධ පාර්ශවයන් වෙත බිලිගවලින් රු.1,286,258 ක් හා රු.128,864 ක් පරිහරණ අනුපාත හා ප්‍රකාශන පරිත්‍යාග කර තිබුණි.
(ii)	4 (ඊ) වගන්තිය	යලෝක්ත වගන්තිය ප්‍රකාර අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන යුතු වුවත් සලකාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රුපියල් මිලියන 1,600 ක් සම්බන්ධයෙන් පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ)	1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 21(1) වගන්තිය	යලෝක්ත ආඥා පනතේ 21(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා කොමසාරිස්වරයාගෙන් ලබාගත් අවසරයකින් තොරව හෝ 20 වන වගන්තිය යටතේ ඇතිකරගත් ගිවිසුමකින් තොරව හෝ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක කිසිදු අළුත්වැඩියාවක්, ප්‍රතිසංස්කරණයක්, වෙනස් කිරීමක් හෝ අතිරේක ඉදිකිරීමක් සිදුකළ නොහැකි වුවද, 2008 ජූනි 06 දිනැති අංක 1553 දරන ගැසට් පත්‍රයෙන් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති සිත්තම ගල්ලෙන රජමහා විහාරයට අයත් භූමියෙහි ධර්මශාලාවේ සහ ඉපැරණි දේවාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අරමුදල විසින් රු.16,258,246 ක් වැයකර තිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 102.103,104 හා 105	❖ 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තා අනුව මොණරාගල ව්‍යාපෘතියට අයත් උදළු, කුළුගෙඩි වැනි ආයුධ සහ ආම්පන්න වර්ග 9 කට අදාළ අයිතම 19 ක් ද බටලිය අනුරු පාසලට අයත් වර්ග අඩි 3132 ක පිත්තල තහඩු තොගයක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා

		වගනිවයුත්තන් හඳුනාගැනීම් 2017 නොවැම්බර් 30 දින දක්වා සිදුකර නොතිබුණි.
		❖ දඹුල්ල ප්‍රකාශන ගබඩාවේ රු.499,368 ක් වටිනා ප්‍රකාශන තොග උනතාවයක් ඇතිව වසර 5 කට අධික කාලයක් ගතව ඇතත් ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුත්තන් හඳුනාගැනීම හා අදාළ පුද්ගලයන්ගෙන් අලාභ අයකරගැනීම හා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම් ආදී කටයුතු සිදුකර නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 381(1)	දිවයින පුරා පිහිටි ප්‍රාදේශිය කාර්යාල සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බැංකු ජංගම ගිණුම් 25 ක් ආරම්භ කර තිබුණි.
(ඇ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගත හැකිවන පරිදි ඒ ඒ වත්කම් කාණ්ඩය යටතේ ඇති වත්කම් සංකේත කිරීම සිදුකර නොතිබුණි. මේ නිසා අරමුදලට අයත් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල වල පැවති වටිනාකම රු.1,155,763,937 ක් වූ වත්කම්වල භෞතික පැවැත්ම සත්‍යාපනය කිරීමට හැකි තත්ත්වයක් පැවතුණි.
(ඉ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල වල පැවති රු.56,002,545 ක් වටිනා පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඊ)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	අභයගිරිය විහාරයේ නවතා තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි ට්‍රැක්ටර් 04 ක්, යතුරුපැදි 02 ක්, ත්‍රිරෝද රථයක් සහ ජල බවුසරයක් සම්බන්ධයෙන් යටෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව අපහරණ කටයුතු සිදුකර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,696,834,303 ක අතිරික්තයක් වූ අතර එය අනුරූපී පූර්ව වර්ෂයේ අතිරික්තය රු. 867,115,250 ක් විය. ඒ අනුව ඉදිරි වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලය රු. 829,719,053 කින් එනම් සියයට 95.6 කින් වර්ධනය වී තිබුණි. ඉදිරි වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම රු. 694,865,531 කින්, ප්‍රකාශන අලෙවි ආදායම රු.6,915,018 කින්; ආයෝජන ආදායම රු.138,856,955 කින්, වෙනත් ආදායම් 10,103,771 කින් හා විලඹගිය ආදායම රු.27,097,930 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉදිරි වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.227,294,733 ක්වූ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එවැනි පාරිශ්‍රමික හා ප්‍රංශම කොටස් වැන්කම් සඳහා වූ බැංකු ශේෂය වීම් පැලනිල්ලට ගැනීමෙන් පසු 2012 වර්ෂයේ රු. 891,233,340 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු. 3,034,217,986 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත අනුව සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ වෙනත් ප්‍රදේශයක සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීම, ඒකාබද්ධ දැඩුබ යෝජනා ක්‍රමයෙහි හා වෙනත් යෝජනා ක්‍රමයන්හි සියලු ක්‍රියාදම සියැරීම, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ආගමික කටයුතු ප්‍රවර්ධනය, ආගම් නංවාලීම හෝ ආගමික ස්ථාන පවිත්‍රාගත යාම, සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයට පේටය කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් පිරිනැමීම, කලා කටයුතු සඳහා ආධාර ලබාදීම හා මහජනයාට ප්‍රතිලාභයක් සැලසෙන වෙනත් ආගමික හෝ සංස්කෘතික කාර්යයන් සඳහා අරමුදල් යෙදවීම යනාදිය ප්‍රධාන අරමුණු විය. මෙම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංචාරක ඒජන්සිවල වෙබ් අඩවියෙහි ප්‍රකාශිත තොරතුරු වලට අනුව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලංකාවට පැමිණි ය යාඋකයින් සංඛ්‍යාව හා අරමුදලේ පොත්පත් අනුව, අරමුදල් විසින් අලෙවි කළ සංචාරක ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව අතර විශ්ලේෂණයක් පහත දැක්වේ.

වර්ෂය	ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව	අරමුදල් විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය	අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සංචාරකයින්ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස	ප්‍රවේශපත්‍ර ආදායම්
				රු.
2013	1,274,593	504,699*	39*	1,748,439,894
2014	1,527,153	627,136*	41	2,200,143,813
2015	1,798,380	722,676*	40	2,751,061,677
2016	2,050,832	903,755*	45	3,445,925,208

(*එක් සංචාරකයකු විසින් එක් ප්‍රාචීදෘශ්‍යමය ස්ථානයක් පමණක් නරඹන්නේ යයි උපකල්පනය කර ගණනය කිරීම සිදුකරන ලදී.)

ඉහත තොරතුරු අනුව 2013, 2014 හා 2015 හා 2016 වර්ෂ තුළ ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවට සාපේක්ෂව අරමුදල විසින් අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය පිළිවෙලින් සියයට 39, සියයට 41, සියයට 40 ක් හා සියයට 45 ක් විය. ඒ අනුව පෞරාණික සංස්කෘතික තටඹුන් සහිත ස්ථාන නැරඹීම හා ආගමික කටයුතු ප්‍රවර්ධනය සඳහා සංචාරකයින් ආකර්ෂණය කරගැනීමට අලෙවි ප්‍රවර්ධන වැඩසිළිවෙලක් ක්‍රියාත්මක කිරීම තුළින් තවදුරටත් ආදායම් වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ආ) අරමුදල විසින් පිළියෙල කර තිබූ වැඩ සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකිරීමට සැළසුම්කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.92,657,086 ක් වූ කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති වලට අදාළ වැඩකිම් සහ ක්‍රියාකාරකම් 22 ක් වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි.

(ඇ) වැඩ සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකිරීමට සැළසුම් නොකළ ව්‍යාපෘති 03 කට අදාළ වැඩකිම් සහ ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු.3,976,597 ක් වැය කර තිබුණි.

(ඌ) 2016 වර්ෂයේ ප්‍රගති පාර්ශ්වයෙන් අනුව විවිධ තුළ වැඩ අවසන් වූ වැඩසටහන් හා ක්‍රියාකාරකම් 51කින් 21 ක් පමණ වැඩ පැහැර අනුව අයි ඇස්තමේන්තු මත මුදල් වෙන් කිරීම සිදුකර තිබුණි. එතුළ වූ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් 13 කට අයි ඇස්තමේන්තු මත වැය වීකක පැළෙමි කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාවලි ඌනතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෝළඹ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ නීතානුකූල අයිතිය අරමුදලට පවරා ගැනීමට 2017 ඔක්තෝම්බර් 31 දින දක්වාම අපොහොසත්ව තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පැවති අළේගම ආයතනයේ අධීක්ෂණ කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදලට පැවරීම සඳහා දෙපාර්ශ්වය විසින් අත්සන් කබන ලද 2016 ජූනි 16 දිනැති අංක ED/10/NH/03/02/01/07 දරන අවබෝධතා ගිවිසුමේ 08 ඡේදයට අනුව එහාම ක්‍රියාත්මක වන පරිදි අළේගම ආයතනයේ සියලු ගොඩනැගිලි සහ භාණ්ඩ විටිමත් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් භාර ගැනීමට කටයුතු කළයුතු වුවද අරමුදල විසින් 2017 ඔක්තෝබර් 31 දින දක්වා එසේ සිදුකර නොතිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දින රජයේ ව්‍යාපාර කමිටුව විසින් ගනු ලැබූ අංක 09 දරන තීරණය පරිදි පවතින කාර්ය මණ්ඩල ප්‍රමාණය පිරවීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත් ඊට අදාළව භාණ්ඩාගාර අනුමැතිය ලබාගන්නා ලෙසත් දක්වා තිබුණි. එහෙත් අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ (පාලන), ප්‍රවේශපත්‍ර අලෙවිකරු, සහකාර අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන පරීක්ෂණ නිලධාරී, නීති නිලධාරී තනතුරු සඳහා බඳවාගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවාගෙන සේවයේ යොදවා තිබුණි.

(ඈ) මහින්තලා රජමහා විහාරස්ථානයේ ආවාසගෙය සහ ධර්මශාලාව ඉදිකිරීම සඳහා 2016 මැයි 11 දිනැති අංක 2863 දරන ගෙවීම් වවුචරය මඟින් රු.මිලියන 15 ක් ප්‍රාදේශීය දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණද ගෙවීම් මුදල් පොකෙහි ගෙවීමිලාභියා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ලෙස දක්වා තිබුණි.

(ඉ) අරමුදල විසින් අලෙවි කළ ප්‍රවේශපත්‍ර සඳහා 2015 දෙසැම්බර් 09 දින ඔනුදෙනුකරුවකුගෙන් ලැබී තිබූ රු.231,000 ක චෙක්පතක් අගරු වී තිබූ අතර එය 2017 ඔක්තෝබර් 30 දින වනවිටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 අගෝස්තු 13 දින රු.5,000,000 ක මුදලක් හාමිඋවුව ගුරුගොඩ විහාරයේ ධර්මශාලාව ඉදිකිරීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබා දී තිබුණි. මෙම ධර්ම ශාලාව ඉදිකිරීම 2017 ඔක්තොම්බර් 31 දින වනවිට ද නිමකර නොතිබුණි.

(උ) 2012 වර්ෂයේ දී රු.මිලියන 4.2 කට තක්සේරු කර ඇති අරමුදලේ දේපළක් වූ මහනුවර පිඹිටි ප්‍රිවිරෝස් ඉඩම 2013 වර්ෂයේ සිට මහරගම ශාසන සේවක සංගමයේ නුවර සංගමය ලෙස ගොඩනැගිලි ඉදිකර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන නමුත් එම දේපළ අරමුදල වෙත පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ඌ) 2016 දෙසැම්බර් 31 දිනට කොග සම්ක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දී අභයගිරිය ව්‍යාපෘතිය මඟින් සඳහිරු සෑය, පොතුවිල් මුහුදු මහා විහාරය, ශ්‍රී සම්බෝධි යෝගාශ්‍රමය, චතමෙවිනා භාවනා අසපුව වෙත 2011 – 2014 කාලය තුළ කාවකාලිකව ලබා දී තිබූ GI යකඩ බට 3105ක්, කප්ලින් (Cufflinks) 4150 ක් හා හාණ්ඩ ප්‍රවාහන විදුලි යෝපාන 01 ක් නැවත ලබාගැනීම සඳහා අරමුදල විසින් අපොහොසත්ව තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.19,944,705 ක් වූ සමුච්චිත අරමුදල තුළ අඛණ්ඩව වූ 1983 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.66,390 ක හඳුනා නොගත් ශේෂය පැහැ නැගීමට හේතු පොයා එය නිරවුල් කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බර කර තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරූ නිෂ්පාදන, ප්‍රකාශන හා මුද්‍රණ යන අංශ වල නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී වත්ත පිරිවැය සැලකිල්ලට නොගැනීම හේතුවෙන් අනුරූ නිෂ්පාදනයන්හි නිෂ්පාදන පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමෙන් කොරව විකුණුම් මිල නිරණය කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරතිබූ වැඩ සැලැස්මෙහි ව්‍යාපෘති 10ක් තුළ ඇතුළත් ක්‍රියාකාරකම් 21 ක ඇස්තමේන්තුගත පිරිවැය සහ ප්‍රගති වාර්තාවන් අනුව තථ්‍ය පිරිවැය අතර සියයට 20 සිට සියයට 186 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.4 එනහේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 02 දිනැති අංක 11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අරමුදල විසින් උපයා ගනු ලබන ප්‍රවේශපත්‍ර ආදායම්වල සියයට 25 ක් පුරාවිද්‍යා ස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් පුරාවිද්‍යා කළමනාකරණ භාරය වෙත ලබාදිය යුතු වේ ඒ අනුව 2016 වර්ෂයේ අරමුදලේ ආදායම් වූ රු. 3,445,925,208 කින් සියට 25 ක් ලෙස රු. 861,481,302 ක් එම භාරය වෙත ලබාදිය යුතු වුවද ලබාදී තිබුණේ රු 104,490,691 ක් පමණි.

(ආ) අරමුදලේ අනුමත කනතුරක් වන සහකාර අධ්‍යක්ෂ (නීති) කනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියකු බඳවාගෙන, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් 2016 අගෝස්තු 01 දින සිට 2017 ජූලි 30 දින දක්වා මාසයකට රු.72,916 ක් බැගින් රු.874,992 ක් දීමනා ගෙවා තිබුණි. අරමුදලේ සියලුම නෛතික කටයුතුවලට අදාළ රාජකාරි මෙහෙයවීම සහ අධිකරණ කටයුතුවලදී අරමුදල වෙනුවෙන් නීතිඥයෙකු ලෙස අධිකරණය ඉදිරියේ පෙනී සිටීම මෙම කනතුරට පැවරෙන කාර්යයන් වී තිබුණි. එහෙත් අවස්ථා 03 කදී බාහිර නීතිඥයන් දෙදෙනෙකුගෙන් ලබාගත් සේවාවන් වෙනුවෙන් අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,457,425 ක් ගෙවා තිබුණි.

(ඇ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3.3 ඡේදාන්කිය අනුව නිල වාහනයක් සහිත නිලධාරියෙකු හට එම නිල වාහනය පාවිච්චි කිරීම හෝ මාසිකව රු.30,000ක් හා සනතුරට ගිමි මාසික ඉන්ධන දීමනාව ලබා ගත හැකි වේ. 2016 ඔක්තෝම්බර් 27 දිනැති අංක 1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2016 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම දීමනාව රු.50,000 දක්වා වැඩිකර තිබුණ ද අරමුදල විසින් වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්) වෙත 2016 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා රු.50,000 ප්‍රවාහන දීමනාව ලබා දී තිබුණි. ඒ අනුව අරමුදල විසින් මාස 08 ක් සඳහා රු.160,000 ක ප්‍රවාහන දීමනාවක් වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්) වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) 2016 ජූලි 06 සිට 08 දක්වා මහනුවර ප්‍රදේශයේ පෞද්ගලික හෝටලයක පැවැත්වූ සංයුක්ත සැලැස්ම පිළියෙල නිරීමේ වැඩමුළුවක් සඳහා අරමුදලේ විධායක හා විධායක නොවන වශයෙන් ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන් හා සේවකයන් 86 දෙනෙක් සහභාගිවී ඒ වෙනුවෙන් රු.1,430,200 ක වියදමක් දරා තිබුණි. අදාළ නිලධාරීන්ට සහභාගිත්ව දීමනා ලෙස රු.53,500 ක් ගෙවා තිබුණද ඊට අදාළ නිකිමය විධිවිධාන

පැහැදිලිකර නොතිබුණි. දෙපැත්ත එකඟවූ සම්මන්ත්‍රණ පැවැත්වීමේදී 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති චක්‍රලේඛයේ අඩංගු විධිවිධාන කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගැටඹරුව විහාරයේ විශ්‍රාම ශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2015 මැයි 21 දින ප්‍රදානය කර තිබුණ ද අධ්‍යක්ෂ ජනරාල් හා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණේ 2015 ජූලි 07 දිනදීය. ගිවිසුම් ගත දින සිට දින 568කින් වැඩ අවසන් කිරීමට නියමිත වුවද 2017 ජූනි 13 දින වනවිට නිමකළ වැඩ ප්‍රමාණය සියයට 73 ක් විය. ලබාදුන් අත්තිකාරම් මුදල් තුළ සියයට 11 ක එකතු කළ අගය මත බදු ලෙස රු.861,871 ක් ඇතුළත් වුවද අත්තිකාරම් නැවත අය කිරීමේ දී එසී මුදල් අයකර නොගැනීම නිසා උක්ත කොන්ත්‍රාත්තුව මගින් අරමුදලට රු.861,871 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ ශ්‍රී ලංකා මාර්ගෝපදේශයෙහි 3.1 හා 3.2 වගන්ති අනුව උපදේශක ආයතන හෝ තේවල උපදේශකයන් තෝරා ගැනීමේදී උපදේශකයින්ගේ තාක්ෂණික හා මූල්‍ය යෝජනා පැසදීම පදනම්කරගෙන තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළයුතු වේ. නමුත් එම වගන්ති වලට පටහැනිව අරමුදල් විද්‍යුත්. පුරාවිද්‍යා උපදේශක, වාස්තු විද්‍යා උපදේශක සහ ගූ විද්‍යාත්මක උපදේශක සේවා සපයා ගැනීම වෙනුවෙන් සම්මාලෝචිත වර්ෂය තුළ රු.2,973,692 ක් වියදම් කිබුණි.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අරමුදලේ පමාපත්

අරමුදලට අයත් හන්තාන පිහිටි වටිනාකම රු.මිලියන 4 ක්වූ ගොඩනැගිලි 02ක්, 2012 වර්ෂයේ සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මුත් එම ගොඩනැගිලි අරමුදල වෙත පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ බදවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 4 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු වසුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අග්‍යන්කර ගෝ

බාහිර විගණන කාර්යාංශයෙන් පැහැදිලි කිරීම් ඉල්ලා සිටියේය. නමුත් එම නිගමනය ඔහුගෙන් කොළඹ අතිරේක අණපනත් ලේකම් වියත් වෙත 02 ක කාලපරිච්ඡේදයකට අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2015 මාර්තු 19 දින කොන්ත්‍රාත් පදනම් මත නිලධාරියෙකු පත්කර තිබුණි.

(අ) අවසියලේ අධ්‍යක්ෂ (ඉදිරි) තනතුර සඳහා 2012 වර්ෂයේ සිට ස්ථිර පත්කිරීමක් සිදුකර නොතිබුණු අතර එම තනතුර සඳහා 2016 අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත් පදනම් මත නිලධාරියෙකු පත්කර 2016 අගෝස්තු 15 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු. 341,210 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එයට අදාළව පහත නිරීක්ෂණ සිදුකරමි.

(i) අවසියලේ බදවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 4.2.3.1 අනු ඡේදය අනුව අධ්‍යක්ෂ (ඉදිරි) තනතුර සඳහා බාහිර පදනම් මත බදවා ගැනීමේදී අධ්‍යාපන ශ්‍රුතියකින් ලබන විශ්ව විද්‍යාල ප්‍රතිසාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් සමග අදාළ විෂය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු බව දැක්වේ. නමුත් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම් මත බදවාගත් නිලධාරියා ගණකාධිකරණ විශ්ලේෂාව සහ වරලත් ගණකාධිකරණ ආයතනයේ අවයවත්වය පිළිගෙය පමණක් සම්පූර්ණ අයෙකු විය.

(ii) අවසියලේ බදවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 4.4 දරන ඡේදය අනුව අධ්‍යක්ෂ (ඉදිරි) තනතුර සඳහා පොදු සුදුසුකම් යටතේ වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතු බව දක්වා තිබුණද කොන්ත්‍රාත් පදනමට බදවාගත් නිලධාරියා අවුරුදු 70 ඉක්මවූ අයෙකු විය.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම් අමතන ලද 2011 ජූලි 21 දිනැති අංක DMS/E/1/54/9/241 දරන ලිපියෙහි 03 ඡේදය ප්‍රකාරව ඉදිරි බදවාගැනීම් සිදු කිරීමට පෙර බදවාගැනීම් පරිපාටිය සංශෝධනය කළයුතු බව දක්වා තිබුණ ද 2017 ඔක්තෝම්බර් 31 දින දක්වාම එම පරිපාටිය සංශෝධනය කර නොතිබුණි.

(ඈ) අවසියලේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ තනතුරකට අධ්‍යක්ෂ තනතුර සඳහා රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරියෙකු 2015 මැයි 05 දින කොන්ත්‍රාත් පදනම් මත වර්ෂයක කාලයකට පත්කර වාර්ෂිකව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. එම

නිලධාරියා වෙන මාසයකට රු.38,500 ක් බැගින් 2016 වර්ෂය තුළ රු.462,000 ක් ගෙවා තිබුණි.

(ඉ) අරමුදලේ බදවාගැනීම් හා උසස් කිරීමේ පරිපාටියේ 4.6.2 අනු ඡේදය අනුව පරිපාලන නිලධාරී තනතුරට අභ්‍යන්තර පදනම මත බදවාගැනීමේදී සේවා පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම්, විශේෂ ක්‍රියාකාරකම් හා කාර්යසාධනය පදනම් කරගනිමින් ලකුණු ලබාදීම කළයුතු වේ. එහි අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් යන නිර්ණායකය යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු බව දක්වා තිබුණද අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් හා අඩු සේවා පළපුරුද්ද සහිත පුද්ගලයෙකු හට ඉහළ ලකුණු ලබාදී පරිපාලන නිලධාරී තනතුර සඳහා 2016 ජනවාරි 01 දින උසස් කොට තිබුණි.

5. ගිණුම්කටයුතුභාවිය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම ✓

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයෙහි 04 ඡේදයට අනුව දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම් ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් විවර්ධිත ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුය.එසේ වුවද අරමුදල විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘති සඳහා පමණක් වැඩ සැලැස්මක් පිළියෙල කර තිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා වර්ෂය ආරම්භ වීමට පෙර සාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද අනුමැතිය ලබාගෙන තිබුණේ 2016 නොවැම්බර් 25 දිනදීය.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ පිරිවැය රු.16,328,430 ක් වූ වාහන සහ පිරිවැය රු.2,970,200 ක් වූ පරිගණක සහ උපාංග සමාලෝචිත වර්ෂය තුළ දී මිලදී ගෙන තිබුණි.

(ඇ) උපදේශකයන් ඉක්මවා ගැනීමෙන් හා සේවයේ යෙදවීමේ ශ්‍රී ලංකා නිර්ගෝපදේශයෙහි 5.2.1 (අ) වගන්තිය අනුව සංරක්ෂණ උපදේශන සේවා සපයා ගැනීම සඳහා ගිවිසුමෙන්-ගෙන්තු ගෙවීම සම්බන්ධයෙන් කොරතුරු අරඹුදලේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා අරඹුදල් වෙනුවෙන් පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්මෙහි, ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන භාණ්ඩ, වැඩ හා සේවා ඇතුළත් කර නොතිබුණි.

5.3 අයවැය ලේඛනාමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.2.5 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පූර්ව එම මූල්‍ය වර්ෂයෙහි අයවැය ලේඛනය, පාලක මණ්ඩලය විසින් අනුමත කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු නුවද 2016 වර්ෂය සඳහා අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2016 නොවැම්බර් 25 දින දිය.

(ii) එම අයවැයෙහි අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් වල සියයට 21 සිට සියයට 203 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාර්යයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.4 වාර්ෂික වාර්තා සභාගත නිරීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013, 2014 හා 2015 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2017 ඔක්තෝබර් 30 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

විගණන ඡේදයට යොමුව හා වර්ෂය	නිරීක්ෂණය
(අ) 2012 – 4.5 අ,ආ,ඇ	පොළොන්නරුව පුජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය කිලෝ මීටර් 1 ක් සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් නිසි ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් කුට්ටි ගල් භාවිතා කර රු. 22,099,917 ක් ගෙවා තිබීම. ප්‍රමාණපත්‍රය අනුව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 4,660,998 ක් ගෙවා තිබීම හා ABC ස්ථරය සියයට 40 ක් හා ගල්කුඩු මිශ්‍රණය සියයට 50 ක් අඩුවෙන් යොදා තිබීම හේතුවෙන් මාර්ගය සමතුලිතතාවයෙන් කොරවිම යන අඩුපාඩු සම්බන්ධව 2017 නොවැම්බර් 30 දින දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ආ) 2013 – 4.4 (අ) (ii)	පොළොන්නරුව පුජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට ඇති මාර්ගය කිලෝ මීටර් 01 ක් දුරට කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉටුනිරීමෙදී නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් කුට්ටි ගල් යොදා ගෙන තිබුණ ද ඒ පිළිබඳව තත්ත්ව පරීක්ෂාවන් සිදුනිරීමට පෙර කොටස් මුදල් ලෙස රු.16,992,545 ක් ගෙවා තිබුණි.

	(අ) 2015 4.8 (අ)	බටලිය අනුරු පාසලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්කුව පෞද්ගලික සමාගමක් වෙත 2014 සැප්තැම්බර් 11 දින රු.මිලියන 46.4 කට ප්‍රදානය කර තිබුණි. 2015 මැයි 11 දින කොන්ත්‍රාත්කුව අවයත් කළයුතුව තිබුණද 2017 ඔක්තෝබර් 31 දින වනවිටද ඉදිකිරීම කටයුතු නිමකර නොතිබුණි.
	(ආ) 2015 4.4 (අ) (iii)	සේවක රක්ෂණ ආවරණය ලබාගැනීම වෙනුවෙන් පුද්ගලික රක්ෂණ සමාගමක් වෙත යාවද්‍යා නාමලේඛනයන් ඉදිරිපත් කර සේවකයින් 50 දෙනෙකුගේ නම් වැඩිපුර ඇතුළත් කර ඒ සඳහා රු. 475,000 ක් ගෙවා තිබුණු අතර අදාළ ව්‍යාජ ලේඛන සකස්කළ නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට 2017 ඔක්තොම්බර් 31 වන විටද කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සම්බන්ධයෙන් වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	අනුරු, ප්‍රකාශන හා මුද්‍රණ යන ඒඑ වලට අදාළව නිෂ්පාදන ගිණුම් පිළියෙල කර නිවැරදිව නිෂ්පාදන පිරිවැය හඳුනාගෙන නොතිබීම.
(ආ)	කාර්ය මණ්ඩල පරිපාලනය	(i) පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලයක පිට ඇතැම් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීම.

		(ii) බදවා ගැනීමේ පරිපාටිය යාවත්කාලීන නොකිරීම.
(ඇ)	ප්‍රසම්පාදනය	(i) පිළියෙල කරනලද ප්‍රසම්පාදන සැලැස්ම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ප්‍රමාදවීම.
		(ii) ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය හා සමගාමීව පිළියෙල කර නොතිබීම.
(ඈ)	අයවැය පාලනය	(i) අයවැය ලේඛනය සඳහා පාලක මණ්ඩල අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාද වීම හා සැළකිය යුතු විචලනයන් පැවතීම.
(ඉ)	ණයගැනී පාලනය	(i) දිගුකලක සිට පවතින ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු නොකිරීම.
		(ii) අධිමාණ ණය චෙන්කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නොමැති වීම.
(ඊ)	තොග පාලනය	(i) තොග සමීක්ෂණ වාර්තා හා මූල්‍ය ප්‍රකාශන අතර වෙනස්කම් පැවතීම.
		(ii) ප්‍රවේශපත්‍ර තොග සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව දක්වා නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

03.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණන වාර්තාව සම්බන්ධ කරුණු දැක්වීම

විගණකාධිපති වාර්තාව-2016 (කෙටුම්පත්) සම්බන්ධයෙන් කරුණු දැක්වීම	2017දෙසැම්බර්08

2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අවසන් ගිණුම් පිළිබඳ ඔබගේ අංක සීඒඑස් /බි /සිසිඑෆ්/1/16/34 අංක දරණ කෙටුම්පත් වාර්තාවේ සඳහන් විගණන විමසුම් පිළිබඳව කරුණු දැක්වීමයි.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2'2'1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

2'2'1(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

ශ්‍රී ලංකා රා.අ.ගි. ප්‍රමිත අංක 01 හි දේදා අංක 53 අනුව මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 05හි සඳහන් දේපල යන්ත්‍ර හා උපකරණවල පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක නොරතුරු 2016 මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමේ දී සිදුවී ඇති බව පිළිගන්නා අතර, ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

2'2'1 (ආ).ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

2016.12.31 ක් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර තැන්පතු වෙනුවෙන්ආයෝජනය කල මුදලින් ආපසු ගැනීම් අඩුකර ඉද්ධ ප්‍රතිඵලය දක්වා ඇත.තවද ප්‍රාග්ධනීත කරන ලද පොළිය ද මුදල් ගලායාමක් හා මුදල් ලෙස සලකා මුදල් ප්‍රවාහයේ දක්වා ඇත.

මෙම තත්වයන් විගණන විමසුමෙහි පෙන්වා දී ඇති ආකාරයට නිවැරදි කරගනිමින්ඉදිරි අවුරුදු ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු වී ඇති ප්‍රමාද දෝෂයන් වලක්වා ගන්නා බවකාරුණිකව දන්වමි.

2'2'1(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

2'2'1(ඇ)i.අරවුදලට අයත් භන්ඩාන ප්‍රදේශයේ පිහිටි කොඩනැඟිලි සම්බන්ධ සටහන්මූල්‍ය ප්‍රකාශනවලසටහන් අංක 2.1.10 යටතේ දක්වා ඇති බව කාරුණිකව දන්වමි.

2'2'1(ඇ) ii. ස්ථාවර වත්කම් වල ඵලදායී ජීවිත කාලය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම නිසා සහ සුන්බුන් අඟය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම නිසා එම ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත.නමුත් මෙම ස්ථාවර වත්කම් වලින් වැඩි ප්‍රමාණයක් වන මෝටර් රථ අළුත්වැඩියාවන් සිදුකරමින් භාවිතයට ගනිමින් පවතී.රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව ඇස්තමේන්තුගත දෝෂයේප්‍රමාණාත්මකභාවය සලකා බලාඉදිරි ගිණුම් වර්ෂවල නිවැරදි කිරීමට කටයුතු කරනුලබන බව කාරුණිකව දන්වමි.

2'2'1(ඇ) iii.ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ නීත්‍යානුකූල අයිතියසම්බන්ධ සටහන්සටහන් අංක 2.1.10 යටතේ දක්වා ඇති බව කාරුණිකව දන්වමි

2'2'1(ඇ)ivඅරවුදලේ දේපලක් වූ මහනුවර පිහිටි පිම්රෝස් ඉඩමේ භුක්තිය නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලබන බව කරුණිකව දන්වමි.

2.2.2ගිණුම්කරණප්‍රතිපත්ති

අධිමාන ණය වෙන් කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 2.3 යටතේ දක්වා ඇති බව කාරුණිකව දන්වමි.

2.2.3ඉණකාධිකරණ අඩුපාඩු

2.2.3(අ).2012 වසරේ ණයගැතියන් සමාලෝචනය කර අධිමාණ ණය ලෙස වෙන්කර ඇති මුදලින් කොටසක් මේ දක්වා පවතින බැවින් හා ඊට පසු වර්ෂවලදී ණයගැතියන් සමාලෝචනය කිරීමේදී එලෙස අධිමාණ ණය ලෙස වෙන් කිරීමට ශේෂයන් හඳුනාගෙන නොමැති බැවින් එම වෙන්කරන ලද මුදල මේ දක්වා පවතින බවත් එය සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද වෙන්කිරීමක් නොවන බවත් කාරුණිකව දන්වමි.

2.2.3(ආ)පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීම සඳහා අරමුදල විසින් නිකුත් කරනු ලබනප්‍රවේශපත් වලඉතිරි තොග, වර්ෂ අවසානයේ තොගවල ඇතුලත් කල යුතු වුවත් අරමුදල මේ දක්වා කිසිදු ගිණුම් වර්ෂයක ඉතිරි තොගයේ දක්වා නොමැත.මෙය ගිණුම්කරණ අඩුපාඩුවක් බවපිළිගන්නා අතර ඉතිරි ගිණුම්වර්ෂ වලදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.3 (ඇ).ද්විත්වසටහන් ක්‍රමය අනුව මූලික සටහන් පොත්වල (ජර්නල් සහ මුදල් පොත්වල) සටහන් කරන ලද ගනුදෙනු ලෙජරයෙහි පිටපත් කරයි.ඒ අනුව 2016.12.31 දින රු.150,000,000/= වටිනා ස්ථාවර තැම්පතුවක් ඇරඹීම සඳහා කොල්ලුපිටිය ලංකා බැංකුවේ කළමනාකරු නමට ලියන ලද චෙක්පත ද ස්ථාවර තැම්පතු ගිණුමට පිටපත් කර ඇත. මෙලෙස පිටපත් කිරීමේදී අදාල චෙක්පත බැංකුව විසින් ගෙවා තිබුණාද නැද්ද යන්න ද්විත්ව සටහන් ක්‍රමයේදී සාමාන්‍යයෙන් සැලකිල්ලට නොගන්නා බැවින් එලෙස සටහන් කර ඇත. බැංකුව විසින් නොගෙවා ඇති චෙක්පත් බැංකු සැසඳුම් ප්‍රකාශය මඟින් හෙළිදරව් කරන බැවින් හා මෙම ස්ථාවර තැන්පතුව සඳහා ලියන ලද චෙක්පත සලකා බලන ගිණුම් වර්ෂයෙන් පසුව මාරුවී ඇති බැවින් එය බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇත.

ඔබගේ විගණන විමසුමෙහි "ස්ථාවර තැන්පතු වටිනාකම රු. මිලියන 150 කින් වැඩියෙන්ද මුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි" යනුවෙන් සඳහන් කර ඇත.

උක්ත ස්ථාවර තැන්පතුව 2017.01.02 දිනැතිව තැන්පතු සහතිකය අප වෙත නිකුත් කර ඇති බැවින් එදින දක්වා රදවා ගැනීමේ / මාර්ගස්ථ ගිණුමක මෙම මුදල දැක්විය හැකි වුවද මුදල් පොතේ ශේෂයට ගැලපීම් සිදුකරන්නේ කෙසේද යන්න ගැටළු සහගතය.

2.2.3(ඇ).පහතසඳහන් ව්‍යාපෘති වලට අදාලව නොග සමීක්ෂණ වාර්තා අනුව සත්‍ය වශයෙන්ම අවසන් නොගයට ඇතුලත් නොවී පවතින නොග විටිනාකම් පහත පරිදි වන බව කාරුණිකව දන්වමි.

	ව්‍යාපෘතිය	නොග අයිතමය	විගණන විමසුමෙහි සඳහන් විටිනාකම	ගිණුම්ගත කලයුතු විටිනාකම(පිරිවැයට)	ගිණුම්ගතකර ඇති විටිනාකම(පිරිවැයට)	අඩුවෙන් ගිණුම්ගත කරඇති විටිනාකම(පිරිවැයට)
01	ගාල්ල	අනුරූ නිශ්පාදන	390,345/-	260,230/-	260,230/-	-
02	මහනුවර	අනුරූ නිශ්පාදන	651,520/-	413,013/	413,013/	-
03	අලභාන	අනුරූ නිශ්පාදන	646,395/-	430,930/-	-	430,930/-
04	රම්බා	ගොඩනැගිලි දුව්‍ය	9,131,190/-	913,190/-	-	913,190/-
05		ලිපිදුව්‍ය	208,933/-	208,933/-	-	208,933/-
06		ප්‍රකාශන	46,400/-	46,400/-	-	46,400/-
07	මොණරාගල	ගොඩනැගිලි දුව්‍ය	7,395/-	7,395/-	-	7,395/-
08		ලිපිදුව්‍ය	168,617/-	168,617/-	-	168,617/-
09	සීගිරිය	අනුරූ නිශ්පාදන	668,921/	445,947/	-	445,947/
10		බිත්තිසිතුවම්	53,500/-	35,667/-	-	35,667/-
11	යාපනය	ප්‍රකාශන	497,915/-	497,915/-		497,915/-
12		අනුරූ නිශ්පාදන	615,550/-	407,700/-	-	407,700/-
13		ලිපිදුව්‍ය	54,571/-	54,571/-	-	554,571/-
14	දඹුල්ල	අනුරූ නිශ්පාදන	41,795/-	27,863/	27,863/	-
එකතුව			13,179,037	3,918,372/-	701,107/-	3,717,265/-

ඉහත අංක 1, 2 හා 14 යන අයිතමයන්නිවැරදිව පිරිවැය විටිනාකමට නොගයට ඇතුලත් කර ඇති බවත් අංක 4 හි සඳහන් අගය සාරාංශගත කිරීමේදී විටිනාකම වැරදීමකින් 9,131,190/= ක් ලෙස දැක්වුවදත්‍ය විටිනාකම රු 913,190/= ක් වන බවත් කාරුණිකව දන්වමි.

ඒ අනුව විගණන විමසුමෙහි රු 13,179,037/- ක ප්‍රමාණයක් නොග විටිනාකමට ඇතුලත් නොවී ඇති බව දැක්වුව ද ඉහත වගුව අනුව සත්‍යවශයෙන්ම නොග විටිනාකමට ඇතුලත් නොවී ඇති ප්‍රමාණය රු 3,717,265/-කි.

2.2.3(ඉ)කුලී ආදායම් ගිණුමට බැර කර ඇති, විගණන විමසුමෙහි සඳහන් රු 16,000/-ක මුදල සත්‍ය වශයෙන්ම අපේගමපරිශ්‍රයෙන් ලද කුලී ආදායමක් වන බැවින් එය නිවැරදිව ගිණුම්ගත කර ඇත.එම කුලී ආදායම එම ගිණුමේ සටහන්කිරීමේදී විස්තරය වශයෙන් අනපසුවීමකින් ටෙන්ඩර් තැන්පතු ලෙසදක්වා ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

2.2.3(ඊ)වර්ෂය තුලදී විවිධ පාර්ශ්වයන් වෙත කරන ලද අනුරූ පරිත්‍යාග සහ ප්‍රකාශන පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කර ඇත.

දෙපාර්තමේන්තු/ආංශික ගිණුම් සැකසීමේදී අනුරූ අංශය විසින් හා ප්‍රකාශන අංශය විසින් සිදුකරන ලද නිෂ්පාදන එම අංශයන්හි ආදායමක් ලෙසත් එම නිෂ්පාදන ප්‍රධාන කාර්යාලය මඟින් පරිත්‍යාග වශයෙන් ලබා දී ඇති බැවින් ප්‍රධාන කාර්යාලයේ වියදමක් ලෙසත් දක්වා ඇත.මෙය අරමුදලේ සමස්ථ අවසන් මූල්‍ය ප්‍රතිඵලයට බලනොපාන නාමමාත්‍ර සටහනක් වන බැවින් ලාභයේ වැඩිවීමක් හෝ තොග වටිනාකමේ වැඩිවීමක් වී නොමැති බවකාරුණිකව දන්වමි.

2.2.3(උ)ගැටඹරු රජමහා විහාරයේ ධර්ම ශාලාව ඉදිකිරීම ආරම්භකිරීමේ අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල රු 4,889,050/- ක් නොව රු 7,835,192/-කි. රු 4,889,050/24ක් ගෙවා ඇත්තේ අවසාන බිල්පත වෙනුවෙනි.එම ගෙවීම දෙවරක් හර කොට නොමැති බවත් නිවැරදිව ගිණුම්ගතකොට ඇති බවත් කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් පහත විස්තර ඔබගේ වැඩිදුර අවධානය සඳහා ඉදිරිපත් කරමි.

නිමකරනලද සම්පූර්ණ වැඩ ප්‍රමාණය	=	30,522,369.95
අඩුකලා රදවාගත් මුදල 10%/ 5%	=	2,082,987.90
= 28,439,382.05		
එකතුකලා වැටබදු11%/15%	=	3,359,160.90
ගෙවිය යුතු සම්පූර්ණ මුදල	=	31,798,542.95

මෙම ගෙවියයුතු මුදලින් අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් ගිණුමට පහත සඳහන් පරිදි ගෙවීම් කරන ලද අවස්ථාවේ දී හරකර ඇත.

2016.01.12	5,312,397.66
2016.04.06	6,038,897.50
2016.07.05	2,884,423.43
2016.10.06	4,738,482.11
2016.12.26	4,889,050.24
	23,863,250.95

කරන ලද වැඩ ප්‍රමාණයට අදාලව ගෙවිය යුතු මුදල රු 31 798 542/95 ක් වුවද අතුරු බිල්පත් ගෙවීමේදී අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් ගිණුමට හර වී ඇත්තේ රු 23 863 250/95ක් පමණක් වන බැවින් ආරම්භක අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු 7,835,192/=ක මුදලද අත්තිකාරම් ගිණුමට බැර කොට අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් ගිණුමට හර කලයුතු බැවින් එසේ සිදුකොට ඇත.මෙම්මගින් ධර්මශාලාව ඉදිකිරීම සඳහා වැයවන සම්පූර්ණ වියදම් අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් ගිණුමින් පියවීඇති වන බවත් දෙවරක් ගිණුම්ගතකොට නොවැනි බවත් කාරුණිකව දන්වමි.

2.2.3(ඌ)ඒතෙවන ව්‍යාපෘතියට අදාලව 2016/12/31 දිනට රු 1,944, 837/20 ක අතිරික්ත තොගයක් වශයෙන් තොග සම්ක්ෂණ වාර්තාවේ දක්වා ඇත්තේ භාවිතයට නොගෙන ගබඩාවේ ගොඩගැසී ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය වේ.මේවා තොග පොත්වල ශේෂයන්ට අනුව අතිරික්ත තොග නොවේ.භාණ්ඩ සම්ක්ෂණ මණ්ඩලය එලෙස කාලයක් තිස්සේ භාවිතයට නොගෙන ගොඩගැසී ඇති ද්‍රව්‍ය සඳහා වෙනම වාර්තාවක් සම්ක්ෂණ වාර්තාවට "අතිරික්ත තොග" ලෙස අමුණා ඇත.

මෙම භාවිතයට නොගෙන ගබඩාවේ තිබූ ගොඩනැගිලි ද්‍රව්‍ය ආදිය පිළිබඳව සොයා බැලීමේදී පෙනීගියේ සමහර අලුත්වැඩියා කටයුතු සඳහා ද්‍රව්‍ය ඇණවුම්කර ලබාගත්තාද එම අලුත්වැඩියා කටයුතු සිදුකිරීම මෙතෙක් සිදුකර නොනිමීම නිසා මෙලෙස ද්‍රව්‍ය ගබඩාවේ ගොඩ ගැසී ඇති බවයි.

දැනට මෙලෙස ගොඩ ගැසී තිබූ ද්‍රව්‍ය සමහරක් 'අපේ ගම' ආදී වෙනත් ව්‍යාපෘති සඳහා නිකුත් කර භාවිතයට ගෙන ඇති බවත් ඉතිරි ද්‍රව්‍ය ද එලෙස වෙනත් ව්‍යාපෘතියක හෝ අවශ්‍යතා අනුව භාවිතයට ගැනීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වමි.

2.2.3(එ)අරමුදලේ අංක 1630470 දරණ බැංකු ගිණුමට 2016-ජූනි 28 වන දින රු 10,000 ක මුදලක් අරමුදලේ ව්‍යාපෘතියක් මඟින් හෝ වෙනත් තෙවන පාර්ශවයක් විසින් බැර කර ඇත. මෙම මුදල පිළිබඳව සොයා බලා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු යොදනු ලබන බව කාරුණිකව දන්වමි.

2.2.3(ඒ)2015/12/09 දින ඔනුදෙනුකරුවෙකුගෙන් ලද රු 231000/- වටිනා චෙක්පත් දෙකක් අඟරු වී තිබුණි.මෙම අඟරු වී තිබූ චෙක්පත් දෙක උපලබ්ධි කොවූ චෙක්පත් ලෙස දක්වා තිබීම නිවැරදි කර අඟරු වූ චෙක්පත් වශයෙන් දැක්වීමට කටයුතු යොදන බව කාරුණිකව දන්වමි.

2.2.4. <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

අරමුදල විසින් ස්ථිර කම්කරුවන් වෙත ලබාදුන් යතුරුපැදි ණය සඳහා ප්‍රධාන කාර්යාලය විසින් පියවෙල කරන ලද සැසඳුම් ප්‍රකාශ ශේෂ හා ව්‍යාපෘති මඟින් එවන ලද සැසඳුම් ප්‍රකාශ ශේෂ වාර්තා අතර වෙනසක්පවතින බව පිළිගනිමි.ඉදිරි ගිණුම්වර්ෂවලදී නිවැරදි ණය සැසඳුම් වාර්තාවක් පිළියෙල කිරීමට කටයුතු කරනුලබන බව කාරුණිකව දන්වමි.

2.2.5අවිනිශ්චිත ගිණුම්

1979 වසරේ සිට 2006 වසර දක්වා විදේශ ප්‍රාග්ධන ප්‍රදානයන් වශයෙන් ලැබිනිබූ දේපල යන්ත්‍ර හා උපකරණ වල පිරිවැය සමුච්චිත අරමුදල නමින් ගිණුම්කට බැර කර තිබුණි.නමුත් 2006 වසරේ සිට එලෙස ලැබිනිබූ ප්‍රාග්ධන ප්‍රදානයන් බැරකර තිබුනේ විදේශ සම්පත් අරමුදල"ටය.මෙලෙස විදේශ ප්‍රාග්ධන ප්‍රදානයන් සම්බන්ධයෙන් ගිණුම් දෙකක සටහන් වී තිබීම නිවැරදි කර සමුච්චිත අරමුදලේ තිබූ රු 19,944,704/58ක මුදල විදේශ සම්පත් අරමුදලට මාරු කරන ලදි. මෙම වටිනාකමින්1983 වර්ෂයේදී සමුච්චිත අරමුදලට බැර කර තිබූ රු 66390/-ක වටිනාකමට අදාල තොරතුරු සොයා ගැනීමට නොහැකි වූයෙන් සහ සමුච්චිත අරමුදලෙහි අතුලත්ව තිබූ අනෙකුත් වටිනාකම් සියල්ල විදේශ ප්‍රධානයන් වන බැවින් මෙම හදුනා නොගත් රු.66,390/= ක ප්‍රමාණාත්මක භාවයෙන් අඩු මුදල ද ප්‍රාග්ධන ප්‍රධානයක් සේ සලකා ගිණුම්ගත කරන ලදි.(ඇමුණුම 1)

2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

2.3 (අ)මුල්‍ය ප්‍රකාශනවල වෙනත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති රු. 79,074,872/= ක මුදලින් දරා ඇති බොහොමයක් වියදම් අරමුදලේ ක්‍රියාකාරී සැළැස්මේ ඇතුලත්ය. එම ක්‍රියාකාරී සැළැස්ම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. නවද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින්අරමුදල මඟින් සිදුකරන ලද ඉදිකිරීම් කටයුතු ආදිය වෙනුවෙන් (උදා - ගැටබරු රජමහා විහාරයේ ධර්මශාලාව ඉදිකිරීම, රිදී විහාරයේ පැති බැමම ඉදිකිරීම ආදිය) දරණ ලද වියදම්ය.

එසේ නොවන පන්සල්, පෙරහැර, විහාර හා ආගමික උත්සව ආදිය සඳහා පරිත්‍යාග කරන ලද මුදල් සම්බන්ධයෙන් පාලක මණ්ඩල අනුමැතිය 200 වන පාලක මණ්ඩල රැස්වීමේ දී ලබාගෙන ඇත. ඔබගේ කාරුණික අවධානය සඳහා එම පාලක මණ්ඩල පත්‍රිකාවේ පිටපතක් මෙයට යා කරමි. (ඇමුණුම 2)

2.3(ආ)1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත ප්‍රකාරව (4වී) අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පාලක මණ්ඩලයේ අභිමතය අනුව සිදුකල හැකිය.කාර්තුමය හා ආදායම් හා වියදම් වාර්තා පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇති නිසාත් අවසන් ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා ගෙන ඇති නිසාත් අදාල ආයෝජනයන් එම ප්‍රකාශනවල දක්වා ඇති නිසාත් සිදුකල ආයෝජනයන් සඳහා අනුමැතිය ලබාගෙන ඇති බව ව්‍යංගයෙන් අදහස් කෙරේ. කෙසේ වුවද ඉදිරියේ දී සිදුකරනු ලබන ආයෝජන සඳහා පොදු අනුමැතියක් 204 වන පාලක මණ්ඩල රැස්වීමේදී ලබාගෙන ඇත. එම පාලක මණ්ඩල පත්‍රිකාවේ පිටපතක් ඔබගේ කාරුණික අවධානය සඳහා මෙයට යාකරමි. (ඇමුණුම 3)

2.3(ඇ) 1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘත අරමුදල් පනත යටතේ 4(ඇ) වගන්තියට අනුකූලව සමාලෝචිත වසරේ දී විවිධ පාර්ශවයන් වෙත පරිත්‍යාග කරන ලද රු. 1,286,258.00 ක් වටිනා අනුරු සඳහා 203 වන පාලක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාගෙන ඇත. එම අනුමැතිය ලබාගැනීම සඳහා යොමුකරන ලද පාලක මණ්ඩල පත්‍රිකාවේ පිටපතක් මෙයට යා කරමි. (ඇමුණුම 4)

2.3(ඇ)සිත්තම්ගල්ලෙන රජමහා විහාරයට අයත් භූමියෙහි ධර්ම ශාලාව අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා පුරාවිද්‍යා කොමසාරිස් විසින්ලබාදෙන ලද අනුමැතික පිටපතක් මෙයට යාකොට ඇත. (ඇමුණුම 5)

ඉපැරණි දේවාල ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කොට ඇති හා අනුමත පාලක මණ්ඩල පත්‍රිකාවමෙයට යාකොට ඇත. (ඇමුණුම 6)පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ද පාලක මණ්ඩල සාමාජිකයෙකු වන බව කාරුණිකව දන්වමි.

2.4<u>ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්</u>

2.4(අ)දිගුකලන සිට අයවිය යුතු උත්සව අත්තිකාරම් සහ විශේෂ අත්තිකාරම් ශේෂයන් පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුවට ද වාර්තාකර ඇත.මෙම ණය ශේෂ වලින් අයකරගතහැකි ශේෂයන් ඇතොත් ඒවා අයකර ගැනීමට කටයුතු කරන බවත් අය කර ගත නොහැකි ශේෂයන් විගණන හා කළමණාකරන කමිටුවේ නිර්දේශය මත පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ගිණුම් වලින් කපාහැරීමට කටයුතු යොදන බවත් කාරුණිකව දන්වමි.

2.4(ආ)විවිධ ණයගැති ශේෂ තුල සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් අයවියයුතු රු 672,577/- ක මුදල නිරවුල් කරගැනීමට කටයුතු යොදන බව දන්වමි.

2.4(ඇ)ගෙවිය යුතු ණය හිමි ශේෂය තුල අඩංගු රු 25605575/- ක මුදල 2013 වසරේ සිට පැවත එයි.පොලොන්නරුව පුජා නගරයේ ඉදිකරන ලද අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු වල සිදු වී ඇති අඩුපාඩු නිරීක්ෂණය වී සිටු බැවින් එම මුදල රදවාගෙන ණය හිමි ශේෂයක් ලෙස දක්වා ඇත.මෙම මාර්ගයේ ඉදිකිරීම් සම්බන්ධ තත්ව වාර්තාවක් මෙතෙක් ඉදිරිපත් වී නොමැති බවත් තත්ව වාර්තාව ලබා ගැනීමෙන් පසු ගෙවීම් සිදුකරනු ලබන බවත් කාරුණිකව දන්වමි.

2.5 <u>නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

2.5 (අ) iමොණරාගල ව්‍යාපෘතියේ අස්ථානගත වී ඇති ඉන්වෙන්ට්‍රි අයිතමයන් හා බටලිය අතුරු පාසලේ අස්ථානගත වී ඇති බවට වාර්තා වී ඇති පිත්තල තහඩු වර්ග අගල් 3132 පිළිබඳව මු.රෙ. 102 හා 103 අනුව කටයුතු කරනු ලබන බවකාරුණිකව දන්වමි.

2.5 (අ)iiදබ්ලිල්ල ප්‍රකාශන ගබඩාවේ රු .499,368/- ක් වටිනා ප්‍රකාශන නැතිවීම සිදුවූ කාලයේ සේවය කල ගබඩාකරු සියදිවි හානිකරගෙන ඇත.එබැවින් මෙම ප්‍රකාශන තොගය ගිණුම් වාර්තාවලින් ඉවත් කිරීම සඳහා දැනට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.

2.5 (අ)iiiඅරමුදල මගින් ආරම්භ කර ඇති ජංගම ගිණුම් 25 සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.අරමුදලේ මූල්‍ය පරිපාලන පහසුව සඳහා එක් එක් ව්‍යාපෘති සඳහා මෙසේ ජංගම ගිණුම් ආරම්භ කොට

ඇති අතරඉත් අහයගිරිය, ඒෂවනය, පොලොන්නරුව, සීගිරිය, මහනුවර, දඹුල්ල ව්‍යාපෘති හා ප්‍රධාන කාර්යාලයේ ප්‍රංගණගිණුම් අරමුදල් ආරම්භකල වකවානුවේ සිට පවත්වාගෙන යයි.අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වෙනත් ප්‍රදේශ වලද පසුව කාර්යාල පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මතුවීම හේතුවෙන් මෙලෙස ප්‍රංගණ ගිණුම් 25ක් පමණ ආරම්භ කිරීමටසිදුවිය. මෙලෙස ආරම්භ කර ඇති ප්‍රංගණ ගිණුම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට ලිඛිතලේඛන දැනටමත් ඉදිරිපත් කොට ඇත.

2.5 (අ)දැනට අරමුදල සතු ස්ථාවර වත්කම් සියල්ල පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛණයක් සකස්කර ඇත. අක්‍රමවත්ව පැවති ස්ථාවර වත්කම් ලේඛණය 2015 වසරේදී මූලුමනින්ම සකස්කලද එහි සංකේත අංක පමණක් දක්වා නොමැත.ප්‍රධාන කාර්යාලයේ හා ව්‍යාපෘතිවල පවත්නා ස්ථාවර වත්කම්වල සංකේත අංක දැනටමත් යොදාඇති බැවින් එම අංක ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් කිරීමට කටයුතු යොදනු ලබනු බව කාරුණිකව දන්වමි.

ස්ථාවර වත්කම් ලේඛණයේ වැඩිම අගයක් දක්වා ඇති එනම් සමස්ත ස්ථාවර වත්කම් වලින් 50%ක්වන ගොඩනැගිලිවල ගොඩනැගිල්ලේ නම (අතපත්තු ගොඩනැගිල්ල, සීගිරි කෞතුකාගාරය, ප්‍රධාන කාර්යාලය ආදී ලෙස)දක්වා ඇති බැවින් ගොඩනැගිලි පහසුවෙන් සත්‍යාපනය කල හැක.මී ලඟට වැඩිම අගයක් දක්වා ඇති එනම් සමස්ථ ස්ථාවර වත්කම් වටිනාකමින් 21%වන මෝටර්රථ වලද ලියාපදිංචි අංකය ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා ඇති බැවින් ඒවාද පහසුවෙන් සත්‍යාපනය කල හැකිය.

වත්කම් අයත් ස්ථානය ස්ථාවර වත්කම් ලේඛණයේ දෙපාර්තමේන්තු ශීර්ෂය යටතේ දක්වා ඇති බවද කාරුණිකව දන්වමි.

2.5 (ඇ)2002 නොවැම්බර් 28 දිනැති අයි.ඒ.අයි.2002/02 දරණ භාණ්ඩාගාර වක්‍රලේඛය අනුව හෙලිදරව් කලයුතු අමතර තොරතුරු ඇතුලත් කර දැනට පිලියෙල කර ඇති පරිගණක හා මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛණය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

03 මූල්‍යසමාලෝචනය

3.1විගණන විමසුමෙහිදක්වා ඇති මූල්‍ය ප්‍රතිඵලයන්එනම් වාර්ෂික අතිරික්තයන් සහ ක්ෂය වීම සම්බන්ධයෙන් එකඟ වෙමි.

04. මෙහෙයුම්සමාලෝචනය

04.01 කාර්යසාධනය

04.01 (ආ) (i)

වර්ෂය	ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව	අරමුදල විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය	අලෙවිකළ ප්‍රවේශපත්‍ර ප්‍රමාණය සංචාරකයින්ට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස	ප්‍රවේශපත්‍ර ආදායම්	ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාවේ වර්ධනය %	අරමුදල විසින් අලෙවිකළ සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණයේ වර්ධනය %	ප්‍රවේශපත්‍ර අලෙවි ආදායමේ වර්ධනය %
2013	1,274,593	504,699	39*	1,748,439,894			
2014	1,527,153	627,136	41	2,200,143,813	20	24	26
2015	1,798,380	722,676	40	2,751,061,677	18	15	25
2016	2,050,832	905,755	45	3,445,925,208	14	25	25

විගණන විමසුමෙහි දක්වා ඇති ආකාරයට හා ඉහත වගුවට අනුව ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 2014, 2015 හා 2016 වසර වල දී පිළිවෙලින් 20%කින් 18%කින් හා 14%කින් වර්ධනය වී ඇතත් අරමුදල විසින් අලෙවි කල සංචාරක ප්‍රවේශපත්‍ර ප්‍රමාණය පිළිවෙලින් 24% කින්, 15%කින් හා 25%කින් වැඩි වී ඇත.ප්‍රවේශපත්‍රඅලෙවි ආදායමද පිළිවෙලින් 26% කින්, 25% කින් හා 25% කින් වර්ධනය වී ඇත. එබැවින් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ වර්ධනයට සාපේක්ෂව අරමුදල මගින් පාලනය කරනු ලබන ඓතිහාසික ස්ථාන නැරඹීමට පැමිණි සංචාරකයින්ගේ වැඩි වර්ධන වේගයක් පවතින බව ඉහත වගුව නිරීක්ෂණයේ දී නහවුරු වේ.

04.01 (ආ)ii.වර්ෂය තුලදී ආරම්භ කිරීමට සැලසුම්කර තිබූ සමහර වැඩබිම් වෙනුවට නව වැඩබිම් ආරම්භ කිරීම , අනපේක්ෂිත ස්වභාවික තත්වයන්ට මුහුණ පෑමට සිදු වීම, ප්‍රමාණවත් කම්කරු සංඛ්‍යාවක් සපයාගැනීමට නොහැකිවීම පුරාවිද්‍යා වැඩබිම් වලට ආවේනික වැඩකරගෙන යාමේදී සැළසුම් වෙනස් කිරීමට සිදුවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලින්හි පැවති ප්‍රමාද වීම නිසා වර්ෂය තුලදී සමහර වැඩබිම් ආරම්භ කිරීමට නොහැකි විය.

04.01 (ආ)iii. අවශ්‍යතානුකූලව ඉටුකල යුතු කැණීම් හා සංරක්ෂණ කටයුතු ඒවා සැළසුම් කර නොනිමුනද වහා සිදු කල යුතු වූ බැවින් මෙලෙස සැලසුම්කර නොනිමූ වැඩබිම් හා ක්‍රියාකරම සඳහා සඳහා මුදල් වැයකිරීමට සිදුවුනි.

04.01 (ආ)iv. පුරාවිද්‍යා කැණීම් හා සංරක්ෂණ කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීම ඉතා දුෂ්කර කාර්යයකි. මක් නිසාද යත් මතුපිටින් පෙනෙන තත්වයන් නිරීක්ෂණය කර ඇස්තමේන්තු සකස්කලද එම කාර්යයන් කරගෙන යාමේදී බලාපොරොත්තු වූ වැඩ ප්‍රමාණයට වඩා වෙනස් තත්වයන්ටමුහුණ දීමට සිදු වීම නිසා මෙලෙස අධි ඇස්තමේන්තු ගත තත්වයන්ට මෙන්ම ඌන ඇස්තමේන්තු ගත තත්වයන්ටද මුහුණ දීමට සිදු වේ.

4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

4.4(අ)අපේගම ආයතනය පවරා දීමේදී අධ්‍යාපයන අමාත්‍යාංශයෙන් ලබාදුන් රු.8,014,311.00 ක මුදල් අරමුදලේ ප්‍රධාන කාර්යාලීය ප්‍රංගම ගිණුමේ තැම්පත් කලද එම ප්‍රංගම ගිණුමේ පවතින අතිරික්ත මුදල් වසින් වර ස්ථාවර තැම්පත් වල ආයෝජනය කරනු ලබන බැවින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබාදෙන ලද ඉහත මුදල් සඳහා ද පොළී ආදායම් ලැබෙමින් පවතින බව කාරුණිකව දන්වමි.

4.4(ආ)හානිගස්සුව ගුරුගෙවල විහාරයේ ධර්මශාලාව ඉදිනිරීමේ කාර්යය තාවකාලිකව නැවතී තිබුණ ද එහි වැඩකටයුතු මේ වන විට ආරම්භ කර ඇත. යාපනුව විභාගනියේ අධික්ෂණය යටතේ සිදුවන මෙම කාර්යය සඳහා අදාල කොන්ත්‍රාත් කරු වෙත කරන ලද වැඩ ප්‍රමාණය අනුව 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද බිල්පතක් සඳහා ගෙවීම් කරන ලෙසට අරමුදල මගින් ප්‍රාදේශිය ලේකම් වෙත දැනුම් දී ඇත. දැනට ඉදිරිපත් වී ඇති තවත් බිල්පතක් සඳහා කොන්ත්‍රාත්කරු වෙත මුදල් නිදහස් කල හැකිද යන්න පිළිබඳව ඇගයීම් කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.මෙම කරන ලද වැඩවලට අදාල වාර්තා වල පිටපත් ඔබගේ කාරුණික අවධානය සඳහා මෙයට යාකොට ඇත. (ඇමුණුම7)

4.4(ඇ) අභයගිරිය විභාගනියේ අපහරණය කිරීමට නිර්දේශකර තිබූ ටැක්ටර් 04 න් 01 ක්ද, ත්‍රීරෝද රථයද සහ ජල බවුසරයද මේ වන විට වෙන්දේසි කර ඇත. තාක්ෂණික හේතූන් නිසා වෙන්දේසි කිරීමට නොහැකි වූ ඉතිරි ටැක්ටර් 03 හා යතුරුපැදි 02 හැකි ඉක්මනින් වෙන්දේසි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි.

4.5කළමනාකරණ ක්‍රියාකාරකම්

4.5(අ) අධ්‍යාපන අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පැවති අපේගම ආයතනයේ සියළු ගොඩනැගිලි හා හාණ්ඩ සම්බන්ධ මණ්ඩලයක් පත්කර භෞතික පරීක්ෂාවකින් පසු අරමුදල මගින් ගිවිසුමෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව භාරගෙන ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

4.5(ආ) රජයක සභාජ ආර්ථික හා සංස්කෘතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සූක්ෂ්ම, කාර්යක්ෂම හා විෂය ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂඥ සූද්ගලයන් පත්කර ගැනීම සාමාන්‍ය සම්ප්‍රදායකි. ආයතන සංග්‍රහයේ 11.4.1 වගන්තිය අනුවද මෙලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමට අමාත්‍ය මණ්ඩලයට සූළුවන. ඒ අනුව අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කොට ඇත. මෙම පත්කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර, එම අනුමැතිය ලබා දීමේ දී වැඩි දුරටත් දන්වා ඇත්තේ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4 ඉ වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අරමුදලේ පාලක මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල් තනතුර පත්කිරීමේ බලතල පැවරී ඇති බවයි. (ඇමුණුම 8)

තවද අරමුදලේ බදවා ගැනීමේ පටිපාටිය දැනට සංශෝධනට කරමින් පවතින බවත් සූදුසු සූද්ගලයකු අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පිහිටුවීමට අවකාශ ලැබෙන පරිදි දැනට පවතින බදවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් ප්‍රසිද්ධ දැන්වීම් පලකර ඉල්ලුම්පත් කැඳවීම මගින් සම්මුඛ පරීක්ෂණ පවත්වා බදවා ගැනීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට කටයුතු යොදා ඇති බවද කාරුණිකව දන්වමි.

4.5 (ඇ)(i) මධ්‍යම සංස්කෘතික අරමුදලේ පනතේ 4(ඉ) වගන්තිය අනුව මෙම තනතුර මෙකී නිලධාරියා කොන්ත්‍රාත් පදනම් මත බදවා ගැනීමට පාලක මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත..

4.5 (ඇ)((ii) මෙම කොන්ත්‍රාත් පත්වීම ලබා දීමේ දී නිලධාරියාගේ වයස පිළිබඳව පාලක මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කර නැත. තව ද 2017.04.23 දින සිට මෙම්සේවාලාභියාගේ සේවා දිගුව ලබා දී නොමැත.

4.5(ඇ) 2015.09.21 දිනැති 1933/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට මධ්‍යම සංස්කෘතික අරමුදල ඇතුළත් කර ඇති අතර, අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ඇතිව අරමුදලේ බදවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

4.5(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබ බදවා ගැනීම් පටිපාටියේ අඩුපාඩු ඇති බැවින්, නැවත එය සංශෝධනය කරගෙන යන අතර, ආයතනයේ කාර්යයන් පුළුල්වීමත් සමග නව තනතුරු ඇති කිරීමටත්, පවත්නා කාර්යයන් කරගෙන යාම සඳහාත් අධ්‍යක්ෂ මුදල්, අධ්‍යක්ෂ පාලන, ද්විතීය පදනම මත) ප්‍රවේශපත් අලෙවිකරු , සහකාර අධ්‍යක්ෂ මුදල් , ප්‍රධාන පරීක්ෂක නිලධාරී (වැ.බ) , නීති නිලධාරී යන තනතුරු සහ පාලක මණ්ඩල අනුමැතිය ලබා කොන්ත්‍රාත් පදනම් මත නිලධාරීන් බදවා ගෙන ඇත.

4.5(ඊ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ විෂය පථය පුළුල් වීමත් සමග කෞතුකාගාරවල අධීක්ෂණකටයුතු සහ පාලක මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනමින් නිලධාරියෙකු සේවයේ යොදවා ගැනීම.

4.5(උ) පරිපාලන නිලධාරී තනතුර සහ පත්වීම් ලබා දී ඇති අභ්‍යන්තර පදනම මත බදවාගත් නිලධාරියාට වසර 14 ක සේවා පළපුරුද්දක් ඇති අතර, ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රථම ශ්‍රාස්ත්‍ර පරීක්ෂණය සඳහා ද ඉදිරිපත් වුවෙක් බව සඳහන් කරන අතර, මින් තහවුරු වනුයේ ඔහු උසස් පෙළ සමත් අයෙකු යන්න ය.

.4.6දෘශ්‍ය අක්‍රමිකතා

4.6(අ)I මහනුවර ප්‍රෙදේශයේ පෞද්ගලික හෝටලයක පැවැත්වූ සංයුක්ත සැළැස්ම පිළියෙල කිරීමේ වැඩමුළුව සඳහා සහභාගිත්ව දීමනා ගෙවීම් කර ඇත්තේ එවැනි වැඩමුළු සඳහා සහභාගිවන නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා ලබාගෙන ඇති පාලක මණ්ඩල අනුමැතියක් මතයි. එම පාලක මණ්ඩල තීරණයේ පිටපතක් ඔබගේ කාරුණික අවධානය සඳහා මේ සමග යාකරමි. (ඇමුණුම 9)

4.6(අ) iiසංයුක්ත සැලැස්ම පිලියෙල කිරීම සඳහා පවත්වන ලද වැඩමුළුවේ ප්‍රතිඵලයක් ලෙස 2017 – 2021 කාල පරිච්ඡේදය සඳහ සංයුක්ත සැලැසමක් සකස්කරනු ලදී. ඉහල කලමණාකාරීත්වය විසින් එම සැළැස්ම නැවත නැවත සමාලෝචනය කිරීම නිසා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් නිබුණ ද එය 2017.05.30 දින පාලක මණ්ඩල පත්‍රිකා අංක D/DD/17 මගින් පාලක මණ්ඩලයට ඉදිරිපත් කොට ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

4.6(අ) iiiමෙවැනි වැඩමුළු ඉදිරියේ දී සංවිධානය කිරීමේ දී අවම පිරිවැයක් සහිතව ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි වන අයුරින් සංවිධානය කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි.

4.6(ආ)මිහින්තලා රජමහා විහාරස්ථානය පිහිටි භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සංරක්ෂණය වන නිසාත් එම භූමියෙහි කිසිදු කැනීම් හෝ සංරක්ෂණ කටයුත්තක් අරමුදලට පවරා නොමැති නිසාත්

2016 මැයි 11 වන දිනැති අංක2863 දරණ ගෙවීම් වවුචරයෙන් ගෙවා ඇති මුදල් පුරාවිදුන උරුමභාරයට ගෙවා ඇති මුදලක් ලේ සලකා ගිණුම්ගත කර ඇත. මෙම මුදල් පුරාවිදුහු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ බාහිර ආයතනයක් මගින් සිදුකර ගැනීමට නියමිතව තිබූ කාර්යයන් සඳහා වන පෙරින් දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ එම මුදල් ගෙවීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙත එම මුදල් නිදහස් කල බැවින් මුදල් පොතෙහි ගෙවීම් ලාභියා ලෙස අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් දක්වා ඇත.

4.7මෙහෙයුම් අකාර්යක්ෂමතා

4.7 (අ) අනුරූ නිෂ්පාදන අංශයේ හා මුදුණ අංශයේ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී සෘජු වියදම් පමණක් නොව වක්‍ර වියදම් ද ඇතුලත් කොට ඇත. පොදු කාර්ය වියදම් ලෙස ප්‍රතිශතයක් සෘජු වියදම් වලට එකතු කිරීමෙන් වක්‍ර වියදම්, මිල ගණනය කිරීමේදී සලකා බලා ඇති බව කාරුණිකව දන්වමි.

4.7 (ආ) පුරාවිද්‍යා කැණීම් හා සංරක්ෂණ කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කිරීම ඉතා දුෂ්කර කාර්යයකි. එක් නිසාද යත් මතුපිටින් පෙනෙන තත්වයන් නිවැරදිලෙස කර ඇස්තමේන්තු සකස්කලද එම කාර්යයන් කරගෙන යාමේදී බලාපොරොත්තු වූ වැඩ ප්‍රමාණයට වඩා වෙනස් තත්වයන්ට මුහුණ දීමට සිදු වීම නිසා මෙලෙස අධි ඇස්තමේන්තු ගත තත්වයන්ට මෙන්ම ඌන ඇස්තමේන්තු ගත තත්වයන්ටද මුහුණ දීමට සිදු වේ.

4.8.මතභේදයට තුඩුදෙන ගණුදෙනු

4.8. (අ)අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් උපයාගනු ලබන ආදායමින් 25%ක් පුරාවිද්‍යාකළමනාකරණ භාරය වෙත ගෙවිය යුතු වුවද අප විසින් එම ප්‍රමාණයට අඩුවෙන් මුදල් ගෙවා තිබියදීත්ගෙවන ලද මුදල් ආපසු භරවා එවන ලද අවස්ථා ඇති අතර .(ඇමුණුම10)යවන ලද මුදල් කළමණාකරනය කරනුලබන ආකාරයෙහිපවතින දුර්වලතාවයන් පිළිබඳව ද අප වෙත වාර්තා වී ඇත.(ඇමුණුම 11).එබැවින් සහ අප විසින් ලබාදෙනුලබන මුදල් නිසි භාවිතයක් කරන්නේද යන්න තහවුරු කරගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ යෝජිත වැඩබිම් පිළිබඳව ඇස්තමේන්තු ගෙන්වා ගෙන ඒ අනුව මුදල් ගෙවීම සිදුකරමින් පවතී. 2017 වර්ෂය සඳහා ද එලෙස ඉල්ලා සිටින ලද මුදල් සියල්ල නිදහස් කර ඇත. 2017 දෙසැම්බර් මස සිට පුරාවිද්‍යා උරුම භාරයට ගෙවීමට නියමිත මුදල් ගෙවීම සඳහා වැඩ පිළිවෙලක් මේ වන විට සකස් කර ඇති බැවින් ඉදිරියේදී සියලු මුදල් ලබා දිය හැකි බව දන්වා සිටිමි .

කවද අරමුදලේ ආදායමින් 25% ගෙවන ලෙසට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කල අවධියේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සංරක්ෂණය වූ හෝ නඩත්තු වූ වැඩබිම් ගණනාවක් දැනට මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත පවරා එම සංරක්ෂණ හා නඩත්තු කටයුතු අරමුදල මගින් සිදුකරනු ලබන බවද කාරුණිකව සිහිපත් කරමි.

4.8. (ආ) තනතුරට පැවරෙන රාජකාරී ලැයිස්තුවේ මෙම නිලධාරියාට සියලුම නෛතික කටයුතුවලට අදාල රාජකාරී මෙහෙයවීම සහ අධිකරණ කටයුතුවල දී මධ්‍යම සංස්ථානික අරමුදල වෙනුවෙන් නීතිඥයෙකු ලෙස අධිකරණය ඉදිරියේ පෙනී සිටීම සහකාර අධ්‍යක්ෂ නීතිගේ කාර්යය ලෙස රාජකාරී ලැයිස්තුවේ යදහන් කර නොමැත. එබැවින් පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි බාහිර නීතිඥයින්ගේ සහාය ආයතනයේ නීතිමය කටයුතු සඳහා බාහිර නීතිමය සේවාව ලබා ගෙන ඇත.

4.8. (ඇ) අරමුදල විසින් 2016 01/01 දින සිට 2016/08/31 දින දක්වා සේවය කල වැඩ බලන මුදල් අධ්‍යක්ෂ ලබාගෙන ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛය අනුවය. නමුත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛය ප්‍රමාද වී නිකුත් කර ඇත. එබැවින් ගෙවන ලද මාසික ඉන්ධන දීමනාව පිලිබඳව සොයා බලා වැඩිපුර ගෙවන ලද කිසියම් මුදලක් ඇත්නම් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

4.9 වෙනත් බාහිර පාර්ශ්වයන් ලබාදුන් අරමුදලේ සම්පත්

2016/12/31 දිනට කොග සම්ක්ෂණ වාර්තාවට අනුව අරමුදලේ ව්‍යාපෘති මඟින් විවිධ ප්‍රණ්‍ය ආයතන හා බාහිර පාර්ශ්වයන් වෙනුවෙන් ලබා දී තිබුණු ද්‍රව්‍ය හා උපකරණ නැවත ලබාගැනීම සඳහා අරමුදල මඟින් කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.(අදාල ලිපිලේඛණවල පිටපත් මෙයට අමුණා ඇත. ඇමුණුම 12)අභයගිරිය ව්‍යාපෘතිය මඟින් ලබා දීඇති බට හා කප්ලිං අරමුදල් පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක වී ඇති බවත් එම බට,කප්ලිං හා උපකරණලබා දුන් කාර්යයන් මේ වන විටත් සිදුකරමින් පවතින බැවින් එම බට හා උපකරණ ආපසු ලබා ගැනීම මේ දක්වා නොහැකි වී ඇති බවත් අමුණා ඇති ලිපි ලේඛණ වලින් තහවුරුවනබව කාරුණිකව දන්වමි.

(05) ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

කැනීම් හා සංරක්ෂණ ව්‍යාපෘති සඳහා මෙන්ම අනෙකුත් ක්‍රියාකාරී වැඩ සඳහා ද ක්‍රියාකාරී සැලැස්මක් සකස්කරන ලෙසට විගණන උපදෙස් පරිදි අදාල අංශ දැනුවත් කර ඇත

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 හා 2014 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා සභාගත කිරීම සඳහා 2017.10.30 දිනට පෙර ඉදිරිපත් කර ඇත.

5.3 අයවැය ලේඛණමය පාලනය

2016 වසර සඳහා වූ අයවැය ලේඛණය සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත්තේ 2016 පෙබරවාරි මාසයේදීය. මේ අනුව අයවැය ලේඛණය සඳහා අනුමැතිය ලබා ගැනීමට මාස දෙකක පමණ ප්‍රමාදයක් සිදු වී තිබුනද එම ප්‍රමාදයන් දැනට මගහරවාගෙන ඇත. ඒ අනුව 2017 වර්ෂය සඳහා වූ අයවැය

ලේඛණය සඳහා ප්‍රමාදයකින් තොරව 2016 නොවැම්බර් මස අනුමැතිය ලබා ගෙන ඇති අතර 2018 වර්ෂය සඳහා වන අය වැය ලේඛණය පාලක මණ්ඩලය වෙත මේ වන විට ඉදිරිපත් කොට ඇත.

2016 වසර සඳහා සිළියෙල කරන ලද අයවැය ලේඛණය එම වසර සඳහා වූ සත්‍ය වියදම් හා සැසඳීමේදී වෙනස්කම් පවතින බව පිලිගනිමි.

එබැවින් ඉදිරියේදී සිළියෙල කරනු ලබන අයවැය ලේඛණවල විචලනාවයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් අයවැය ලේඛණය ක්‍රියාත්මක කිරීමේදී සිදුකරනු ලබන වෙනස්කම් සඳහා වර්ෂය තුලදී සංශෝධන සිදුකර පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරඇති බවත් කාරුණිකව දන්වමි.

5.4නොවිසඳී ඇති විගණන ඡේද

5.4 (අ) පොලොන්නරුව පුජා භූමියේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීමේ කාර්යය සම්බන්ධයෙන් ධර්මධාස කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ එන්ටර්ප්‍රයිසස් ආයතනය මගින් ඉටු කරන ලද වැඩ වල ප්‍රගතිය පිලිබඳ වාර්තාවක් ලබා ගැනීමට පත් කරන ලද කමිටුව මගින් මෙවන විට වාර්තාව ඉදිරිපත් කොට ඇත .එම වාර්තාවේ අඩංගු නිර්දේශ මත ඉදිරි සංවර්ධන කටයුතු සහගෙවීම් කටයුතු සිදු කිරීමටත් බලාපොරොත්තු වන බව කාරුණිකව දන්වමි.මෙම කාර්යය වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කරුගෙන් රු.1935455 ක මුදලක් රදවාගෙන ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

5.4 (ආ)පොලොන්නරුව පුජා භූමියේ පිටවීමේ දොරටුවේ සිට අභ්‍යන්තරයට ඇති මාර්ගය කි.මී. 1ක් දුරට වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සමග රු.27,500,000 ක් වටිනා ගිවිසුමකට එළඹියද පසුව රේඛිය අමාත්‍යාංශයේද අනුමැතිය මත ගිවිසුම් ගත මුදල (වැට බදු රහිතව) රු.48,575,892.84 දක්වා වැඩිකර ගිවිසුම් ගත වී ඇත.

තව ද මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවන ලද මුදල රු.29,235,510.ක් නොව රු.23735,533.54 ක් බවද දන් වා සිටිමි.මෙම කාර්ය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති බිල්පත් අනුව නොගෙවා රු.මිලියන 25 කපමණ මුදලක් රදවා ගෙන ඇත.මෙම කාර්යය සම්බන්ධයෙන් ද පත් කොට ඇති කමිටුවේ නිර්දේශ මත ඉදිරි සංවර්ධන කටයුතු භාගෙවීම් කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

මෙම කාර්යය හදිසියේ අප වෙත පැවරුණු හෙයින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.එබැවින් රාජ්‍ය ආයතනයක් වන මාර්ගසංවර්ධන අධිකාරිය වෙත පවරා එම කාර්යය ඉටුකර ගැනීමට සිදුවිය.

5.4(ඇ) බටලිය අනුරු පාසැලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ටෙන්ඩරය ප්‍රධානය කිරීමේදී සිදුවී ඇති අඩුපාඩු හා එම ඉදිකිරීම සම්බන්ධ වාර්තාවක් ලබා ගැනීමට කමිටුවක් මේ වන විට පත් කර ඇත. මෙම කමිටුව මගින් කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර ඇති වැඩ සඳහා ප්‍රමාණාත්මකව ගෙවීම් කිරීමටත්හා ඉතිරි වැඩ කටයුතු කරගෙන යෑම සඳහා. නව කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුලත්වීමටත් නිර්දේශ ඉදිරිපත් වී ඇත. මෙම නිර්දේශ සලකා බලා අදාල කාර්යය හැකි ඉක්මණින් නිම කිරීමට කටයුතු යොදන බව කාරුණිකව දැනුම් දෙමි.

5.4(ඇ) සේවක වෛද්‍ය රක්ෂණාවරණ ලබාගැනීම වෙනුවෙන් ගෙවන ලද මුදල් පිළිබඳව දැනට විධිමත් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වමින් තිබෙ. මේ හැරුනු විට අල්ලස් හා දූෂණ විමර්ෂන කොමිෂන්සභාව මගින් ද තවත් පරීක්ෂණයක් සිදුකරමින් පවතී. තවද ඉදිරි රක්ෂණ ආවරණ ලබාගැනීමේ කටයුතු වලදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ අනුව කටයුතු කරන බවද දන්වා සිටිමි.

5.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

(අ).ගැටබරුව විහාරයේ විශ්‍රාම ශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ගෙවන ලද අත්තිකාරම් මුදල් සියල්ල අයකර ගෙන ඇත. එම අය කිරීම් පිළිබඳ විස්තර පහත වගුව මගින් දක්වා ඊටිම්.

Bill No.	Work done without VAT (accumulated)	Previous Payments without VAT (accumulated)	Retention 10%/5% (accumulated)	VAT 11%/15%	Mobilization Advance Recovery
No. 01	7,092,687.13		709,268.71	702,176.03	1,773,171.78
No. 02	15,155,334.00	6,383,418.42	1,515,533.40	798,202.04	2,015,661.72
No. 03	19,006,400.00	13,639,800.60	1,900,640.00	381,255.53	962,766.50
No. 04	24,751,648.00	17,105,760.00	2,082,987.90	611,919.01	1,436,312.00
No. 05	30,522,369.95	22,668,660.10	2,082,987.90	865,608.29	1,747,280.00
	30,522,369.95	22,668,660.10	2,082,987.90	3,359,160.90	7,935,192.00

5.5(ආ)ගැටබරුව විහාරයේ ධර්මශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ගිවිසුම් අත්සන් කිරීමේ ප්‍රමාදයක් නාක්ෂණික කරුණු හේතුවෙන් සිදුවී ඇති බව පිළිගනිමි. මෙම කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කරගෙන යමින් පවතින අතරතුර යෝජනා වී ඇති අතිරේක වැඩ කටයුතු ක්‍රියාත්මක කර නිමවන තෙක්කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කටයුතු නිම කිරීමේ බාධාවක් මතුවී ඇත. එබැවින් කොන්ත්‍රාත් කාලය 2017/12/31 දින දක්වා දීර්ඝ කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

(ඇ) අරමුදලේ දෛනික අවශ්‍යතාවය පරිදි සියළුම ව්‍යාපෘති සඳහා එදිනෙදා සිදුකරනු ලබන කැණීම් සංරක්ෂණ හා නඩත්තු කටයුතු පිළිබඳ උපදෙස් ලබාගැනීම සඳහා උපදේශකවරුන් බඳවාගෙන ඇත. අරමුදල බඳවාගෙන තිබූ උපදේශකවරුන් මඟින් සේවා ලබාගැනීමේදී ශ්‍රී ලංකා මාර්ගෝපදේශයෙහි 5.2.1(අ)වගන්තිය අනුවගාස්තු ගෙවීම සම්බන්ධයෙන් තොරතුරු ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ යැයි අපේක්ෂා කරමි.

ශ්‍රී ලංකා උපදේශකයින් බඳවා ගැනීමේ මාර්ගෝපදේශයේහි 5.2.1(අ)වගන්තියඅනුව කිසියම්නිශ්චිත කාර්යයක්සඳහාඋපදේශකවරුන් බඳවා ගනු ලබන්නේ නම්,ගාස්තු ගෙවීම සම්බන්ධ තොරතුරු ඉදිරිවිසරවල් සඳහා සකස්කරනු ලබන ප්‍රසම්පාදන සැලැස්ම වලදී ඇතුලත් කිරීමට ක්‍රියාකරන බව කාරුණිකව දන්වමි.

(ඇ)අරමුදලේ දෛනික අවශ්‍යතාවය පරිදි සියළුම ව්‍යාපෘති සඳහා එදිනෙදා සිදුකරනු ලබන කැණීම් සංරක්ෂණ හා නඩත්තු කටයුතු පිළිබඳ උපදෙස් ලබාගැනීම සඳහා උපදේශකවරුන් බඳවාගෙන ඇත. එලෙස බඳවාගත් උපදේශකවරුන් සඳහා මාසික දීමනාවත් ගෙවනුලබන බැවින් කසිල දහනායක මහතාට සහ එස්.යූ.දැරණියගල මහතාට පිළිවෙලින් රු.159,975/= ක් සහ රු 231,155/= ක්දීමනා ලෙස ගෙවා ඇත.

අනෙකුත් විගණන විමසුමෙහි දක්වා ඇති ගෙවීම් එලෙස බදවාගත් උපදේශකවරුන් මගින් දෛනික රාජකාරී වලට අමතරව සිදුකරනු ලබන සැලසුම් සකස්කිරීම් ප්‍රමාණපත්‍ර සකස්කිරීම් ආදී කටයුතු වෙනුවෙන් ගෙවනලද ගෙවීම් වේ.

5.6 ප්‍රසම්පාදන සැලැස්ම

5.6(i). 2016 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී අඩුපාඩු සිදුවී ඇති බව හා එය ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බව පිළිගනිමි.

5.6(ii) 2016 වසරතුලදී මිලදීගන්නා ලද වාහන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත්කර නොතිබුනද 2016 වසර සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛණයෙහි මුදල් පුනිපාදන වෙන් කර තිබුණු බව කාරුණිකව දන්වමි.

.5.6 (iii) තථ්‍ය ප්‍රතිඵල හා සසඳන විට විචලනයන් පැවතියද සමාලෝචිත වර්ෂය (2016) සඳහා අරමුදල වෙනුවෙන් පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රසම්පාදනය කරනු ලබන භාණ්ඩ, වැඩ හා සේවා ඇතුළත් කරඇති බව කාරුණිකව දන්වමි.

.

6.පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය කර අපවෙත ලබාදුන් පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳව විශේෂයෙන් අවධානය යොමුකරන බවත් ගිණුම්කරන දෝෂයන් අවමකරගෙන ඉදිරි ගිණුම්වාර්තා කලට වේලාවට ඉදිරිපත්කරන බවත් කාරුණිකව දන්වා සිටිමි .

මෙයට - විශ්වාසී

මහාචාර්ය ප්‍රියාන්ත ගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්,
මධ්‍යම සංස්කෘතික අරමුදල.

04. කාර්ය සාධන දර්ශකය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	ව්‍යාපෘතිය	විස්තරය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම			
			0 - 25%	26% - 50%	51% - 75%	76% - 100%
01	අභයගිරිය ව්‍යාපෘතිය	කැණීම්			✓	
		සංරක්ෂණ			✓	
02	මහාවිහාර ව්‍යාපෘතිය	කැණීම්	✓			
		සංරක්ෂණ			✓	
03	ජේතවනය ව්‍යාපෘතිය	කැණීම්				✓
		සංරක්ෂණ				✓
04	පොළොන්නරුව ව්‍යාපෘතිය	කැණීම්			✓	
		සංරක්ෂණ			✓	
05	සීගිරිය ව්‍යාපෘතිය	කැණීම්			✓	
		සංරක්ෂණ			✓	
06	දඹුල්ල ව්‍යාපෘතිය	කැණීම්				✓
		සංරක්ෂණ			✓	
07	මහනුවර ව්‍යාපෘතිය	කැණීම්			✓	
		සංරක්ෂණ			✓	
08	රම්බා විහාර ව්‍යාපෘතිය	කැණීම්				✓
		සංරක්ෂණ			✓	
09	තිස්සමහාරාම ව්‍යාපෘතිය	කැණීම්			✓	
		සංරක්ෂණ			✓	
10	ගාල්ල ව්‍යාපෘතිය	කැණීම්		✓		
		සංරක්ෂණ			✓	
11	මාතර ව්‍යාපෘතිය	කැණීම්		✓		
		සංරක්ෂණ		✓		
12	මොණරාගල ව්‍යාපෘතිය	සංරක්ෂණ		✓		
13	යාපහුව ව්‍යාපෘතිය	කැණීම්	✓			
		සංරක්ෂණ			✓	
14	දඹදෙණිය ව්‍යාපෘතිය	කැණීම්			✓	
		සංරක්ෂණ		✓		
15	පඬුවස්නුවර ව්‍යාපෘතිය	කැණීම්		✓		
		සංරක්ෂණ			✓	
16	කුරුණෑගල ව්‍යාපෘතිය	කැණීම්		✓		
		සංරක්ෂණ			✓	
17	යාපනය ව්‍යාපෘතිය	කැණීම්		✓		
		සංරක්ෂණ		✓		
18	ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය	සංරක්ෂණ		✓		
19	රත්නපුරය ව්‍යාපෘතිය	ගවේෂණ				✓

05. තිරසර සංවර්ධනය (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

තිරසර අරමුණු 04 - සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරා ම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මකවන ප්‍රධාන ව්‍යාපෘති කිහිපයකට අනුයුක්තව කෞතුකාගාර පිහිටුවා ඇති අතර, එම කෞතුකාගාර නැරඹීමට පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන පැවැත්වීම සිදු කිරීම
- ප්‍රකාශන අංශයේ ඇති පුස්තකාලය මඟින් තොරතුරු සොයා පැමිණෙන සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට හා තොරතුරු ගවේශකයින්ට ඒ අදාළ අධ්‍යාපනික තොරතුරු ලබාගැනීමට අවශ්‍ය සියළු පහසුකම් සම්පාදනය කර දීම
- පුවත්පත් දැන්වීම් පළකිරීම මඟින් බටලීය ජාතික අනුරූ පාසල වෙත වසර දෙකක අධ්‍යයන කාලයකට යටත්ව සිසුන් බඳවා ගැනීමට කටයුතු කර න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීමට කටයුතු කිරීම
- පාසල්වල හා අනෙකුත් බාහිර ආයතනයන්ගේ ඉල්ලීම පරිදි අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි පැවැත්වීම
- විශ්වවිද්‍යාලවල ඉල්ලීම් පරිදි විශ්වවිද්‍යාල සිසුන්ට කැණීම් හා සංරක්ෂණ කටයුතු සම්බන්ධ මාස 06 ක පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම

තිරසර අරමුණු 08 - සියලුදෙනා සඳහා කල්පවත්නා, පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත බඳවාගෙන ඇති කාර්ය මණ්ඩලය සඳහා ඒ ඒ අදාළ කාලයන් තුළ දී උසස්වීම් ලබා දීම තුළින් ඔවුන්ගේ රැකියාව පිළිබඳ තෘප්තිය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- රජය විසින් නිකුත් කරනු ලබන විවිධ චක්‍රලේඛයන්ට අනුකූලවන පරිදි කාර්ය මණ්ඩලයේ රැකියා ස්ථායිතාව ආරක්ෂා කිරීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකිරීම

තිරසර අරමුණු 09 - ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ සහ තිරසාර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය

- සංචාරක ස්ථානයන් නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ අවශ්‍යතා හා වුවමනා වඩාත් ඵලදායි ලෙස සපුරාගැනීමට හා සංචාරක ආකර්ශනය වැඩිකර ගැනීම සඳහා සියළු සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වර්ධනය කිරීම හා දෛනික නඩත්තු කටයුතු සිදු කිරීම
- නවීන තාක්ෂණය භාවිතා කර කාර්යාලීය කටයුතු, කැණීම් හා සංරක්ෂණ පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කර දීම

තිරසර අරමුණු 14 - තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සාගර සම්පත් සුරක්ෂිතව, කල්පවත්නා පරිදි භාවිත කිරීම

- ශ්‍රී ලංකාවේ මුහුදු පුරාවිද්‍යා කැණීම්, ගවේෂණ හා පර්යේෂණ කටයුතු විද්‍යාත්මක පදනමකින් යුතුව සිදුකිරීම සඳහා මුහුදු පුරාවිද්‍යා ඒකකය, රසායනාගාරය හා කෞතුකාගාරයත් ආරම්භ කර සාගර සම්පත් සංරක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අතීත උරුමයන් අනාගත පරපුර උදෙසා දායාද කිරීමේ අරමුණින් සිදුකරනු ලබන පුරාවිද්‍යාත්මක උරුම ස්ථාන රැක ගැනීමේ කටයුතු සම්බන්ධව ප්‍රජාව තුළ ඇති දැනුවත් බව අඩුවීම හා එම උරුම ස්ථාන රැකගැනීම වෙනුවට ඒවා කඩා බිඳ දැමීමට කටයුතු කරනු ලබන සමාජයක් වර්තමානයේ බිහිවීමත් සමඟ උරුම ස්ථාන ආරක්ෂා කර ගැනීම ගැටළුකාරී වී ඇත. තත්ත්වය එසේ වුවද හැකි උපරිමයෙන් ප්‍රජාව හා අධ්‍යාපනය ලබන සිසුන් තුළ උරුම ස්ථාන රැක ගැනීමේ ඇති වැදගත්කම පැහැදිළි කර දීම මඟින් හා ඒ සඳහා ඔවුන් පොළඹවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම මඟින් ප්‍රජාව විසින් සිදුකරනු ලබන හානිය වළක්වා ගැනීමට කටයුතු කර, අදාළ කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි. එමෙන්ම ආයතනය සතුව පවතින් සීමිත මානව සම්පත උපයෝගී කර ගනිමින් පුස්කොළපොත් සංරක්ෂණය කිරීමේ කටයුතු හා නව පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීම, ලේඛන ගත කිරීම, සංරක්ෂණය කිරීම, නඩත්තු කිරීම සහ මහජන ප්‍රදර්ශන කටයුතු වර්ෂය පුරාම අඛණ්ඩව සිදුකරන ලදි.

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යාව

2016.12.31 දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඌණ සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	16	06 (02 කොන්ත්‍රාත්)	10	-
තෘතිය	46	30 (02 කොන්ත්‍රාත්)	16	-
ද්විතියික	478	428	50	-
ප්‍රාථමික	1,130	1,623	-	493

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත යොදාගත් ආකාරය

ආයතනයේ පරිපාලන කටයුතු හා ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතිය හා ද්විතියික සේවක ඌණතාවය හේතුවෙන් ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවී ඇත. එනමුදු පවත්නා මානව සම්පත උපරිම අයුරින් යොදා ගනිමින් පහළ ශ්‍රේණි මඟින් හෝ ආවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබූ අතර, ඒ මඟින් ආයතනයේ අරමුණු හා ඉලක්ක ගත සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි.

ප්‍රාථමික PL-1 ශ්‍රේණියේ අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

- කැණීම්, සංරක්ෂණ මෙන් ම ශාස්ත්‍රීය කටයුතු හා සම්බන්ධ ආයතනයක් බැවින් ඒ හා සම්බන්ධව කටයුතු කරනු ලබන නිලධාරීන්ගේ හා සේවකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීමට අවශ්‍ය දේශීය හා විදේශීය පුහුණු ලබාදීමට අවශ්‍ය කටයුතු හැකි සෑම අවස්ථාවකදීම ලබාදීමට කටයුතු කළ යුතු වේ.

- ආයතනික නීති රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි කාර්යාල ක්‍රමවේදයන් පිළිබඳව, සේවක දැනුම අල්ප බැවින් ඒ සඳහා අදාළ දැනුම හා පුහුණුව නිසි පරිදි ලබාදිය යුතු වේ.

- සේවක අභිප්‍රේරණය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා යහපත් ආකල්ප නිරන්තරයෙන්ම ගොඩනැඟිය යුතු බැවින් ආකල්ප සංවර්ධන වැඩසටහන් නිරන්තරයෙන් ක්‍රියාත්මක කළ යුතුය.

- පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  මධ්‍යම සංස්කෘතික අරමුදලට අනුයුක්ත කෞතුකාගාර සම්බන්ධ කර ගනිමින් කෞතුකාගාරය නැරඹීම සඳහා පැමිණෙන පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ට, පුරාවිද්‍යාඥයන්ට, පර්යේෂකයින්ට, තොරතුරු ගවේශකයින්ට අධ්‍යාපනික තොරතුරු ලබාදීම හා මාසික දේශන/ සම්මන්ත්‍රණ පැවැත්වීම වර්ෂය පුරාම සිදුකරන ලදි.

  පාසල්වල හා පන්සල්වල පවත්නා ශාස්ත්‍රීය උත්සව හා ප්‍රදර්ශන කටයුතුවලට සමගාමීව ඉල්ලීම් අනුව ප්‍රදර්ශන පැවැත්වීම සිදු කර ඇත.

07. **අනුකූලතා වාර්තාව**

අනු අංකය	**අදාළ කරගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග**
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	-		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	-		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	-		
4	**වාර්ෂික සැලසුම් සකස්ක කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ (වාර්ෂික හා කාර්තුමය වශයෙන් සකස් කරනු ලැබේ)		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	-		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	තොරතුරු එක් රැස්කර ගැනීමට ප්‍රමාද වීම හේතුවෙන් බොහෝ අවස්ථාවල දී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.	නියම කර ඇති දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට තොරතුරු රැස්කර තබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(4) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ වක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ	විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු නොලැබේ	ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	මාස 06 ක් ඇතුළත ඉදිරිපත් කර නොමැත.	ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂාවට ලක් කරනු ලැබේ.	ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	-		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	-		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	-		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	-		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	-		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	-		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	-		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	-		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	-		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	-		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් බඳවා ගෙන ඇත	අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා ක.සේ.දෙ. අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	ක.සේ.දෙ. වෙත ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ අවස්ථා ඇත.	ක.සේ.දෙ. වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	වාර්තා ඉදිරිපත් කර නොමැත	වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොමැත	ඉදිරියේදී සකස් කිරීමට නියමිතය

අනු අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර නැත	ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්මක් සකස් කර නැත	ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කර නැත	ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ	සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නැත	ඉදිරියේ දී සකස් කිරීමට නියමිතය
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	නිලධාරියෙකු පත් කර නොමැති අතර, පුහුණු හා වැඩමුළුවලට අදාළ කටයුතු පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ.	ඉදිරියේ දී නිලධාරියෙකු පත්කර අදාළ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		